
# අභිධර්මාර්ථ සංග්‍රහය



රේරුකානේ චන්දවිමල මහානාහිමි.

ලේකම්ගේ සටහන්...

අභිධර්මාර්ථ සංග්‍රහය, අභිධර්මය උගන්නවුන් විසින් මුලින්ම ප්‍රගුණ කළ යුතු, කටපාඩම් කළ යුතු පොතක් වශයෙන් සෑම බෞද්ධ රටක්ම පිළිගන්නා පොතකි. එය අත්පොතකි. ලක්දිව අභිධර්ම පාඩම් පොත් ලියැවී ඇත්තේ ද මේ අනුව යමිනි. ධර්මකාමීන්ගේ ඉල්ලීමත් අවශ්‍යතාවත් සලකා රේරුකානේ මහ නාහිමියන් වහන්සේ මේ පොත අනුවාදයක් සහිතව භාවිතයට පහසු පරිදි සකස් කරන ලදී.

බුදුදහම දර්ශනයක් වශයෙන් ලොව පවතින්නේ අභිධර්මය නිසාය. විද්‍යාව හා සසඳන්නන් බෙහෙවින් සළකන්නේ අභිධර්මයේ එන ඉගැන්වීම් රටාවය. අභිධර්මය නොදන දහම් දෙසන්නා නියම ධර්ම කථිකයකු නොවන බව අටුවාව කියයි. ශාස්ත්‍රය උගත් වෙද්දුරාත්, වට්ටෝරු වෛද්‍යවරයාත් අතර වෙනස මෙනැයි පහදා ඇත. මුල් අවස්ථාවේ බුදුන් වහන්සේ තමා අවබෝධ කළ ධර්මය දේශනා කරන ආකාරය ගැන කුකුසක් ඇතිව සිටි බව බුද්ධ චරිතයෙන් පෙන්වයි. ඒ නිසා බුදුන් වහන්සේගේ මුල් සූත්‍රදේශනා බෙහෙවින් සරල සම්ප්‍රදයක් අනුගමනය කළ බව නොරහසකි. කල්යත් ම අභිධර්ම සම්ප්‍රදය ඇතුළත් සූත්‍ර, සූත්‍ර පිටකය තුළ ම අන්තර්ගත විය. පසුව එය වඩාත් අවබෝධ කළ හැකි පිරිසක් අතට පත්වූ බව සැරියුත් හිමියන්ට දේශනා කිරීම පිළිබඳ නිදාන කථාවෙන් පැහැදිලිය.

මේ ටික සඳහන් කරන්නට සිදුවූයේ වැදගත් ශාසන මෙහෙවරක් කළ හැකි සමහර භික්ෂූන් වහන්සේලා අභිධර්මය පිළිකෙව් කරන නිසාය. කෙළින්ම ප්‍රතික්ෂේප කරනවාට වඩා ඒවා ඉගෙන පැරණි ශාස්ත්‍රයටත්, ආචාරීන් වහන්සේලාටත්, සම්ප්‍රදයටත් ගරු කරන්නේ නම් ''සුන්දර වූ ඇත්ත'' සොයා ගැනීම පහසුය. කලබල වී සෝවාන් වනවාට වඩා වැඩි සේවයක් එමගින් කළ හැකිය. මිථ්‍යාදෘෂ්ටිය තේරුම් ගැනීම සඳහා සම්‍යක්දෘෂ්ටිය අවශ්‍යය.

ශ්‍රී ලාංකික පදනමට අභියෝග කරමින් අධිරාජ්‍යවාදීන් ගෙන ගිය නොයෙක් වැඩසටහන් අතර බෞද්ධයන් තුළ ගොඩනැගී

තිබුණු ආගමික චින්තනය දෙදරවීම ද එක් අංගයකි. රීස් ඩේවිස් නම් බටහිර උගතා විසින් එය අපූරුවට ඉටු කළ අතර ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල මගිනුත්, අද වන විට සමහර භික්ෂු කණ්ඩායම් මගිනුත් මේ මත ප්‍රචලිත කිරීමට වෙර දරති. ඔවුන් වෙතින් වැඩිපුර ම අභියෝග යට ලක්වන්නේ බුදුදහමේ දාර්ශනික පදනම වූ අභිධර්ම පිටකය ය. එය බුද්ධ දේශනාවක් බව තහවුරු කරන්නට පසුගිය කාලයේ වැඩිපුරම වෙහෙසුනේ රේරුකානේ නාහිමියන්ය. ඒ නිසා ම උන්වහන්සේ 'ආභිධම්මික' යන ගෞරව නාමයෙන් සමාජය විසින් පුදනු ලැබීය.

අභිධර්මාර්ථ සංග්‍රහය මුද්‍රණය කිරීමට වැය වූ මුළු මුදල ධර්ම පූජාවක් වශයෙන් පරිත්‍යාග කිරීමෙන් පරලෝසැපත් පියදාස වන්නි අච්චි මහතා පෙර මුද්‍රණයකදී දැමූ පදනම අදටත් මෙහි පැවැත්මට ශක්තියකි. දහම් රසය දන්නෝ එය තවත් අයට බෙදා දීමට මසුරු නොවෙති. සමාජයේ කලණ මිතුරෝ ඔවුහු ය.

පූජ්‍ය මීමන සුසීම හිමියන් සමඟ සැසඳූ කලින් සෝදුපත් ලේඛන මෙම මුද්‍රණයට ද යොදා ගැනීමට හැකිවීම පහසුවකි. පූජ්‍ය කිරිඔරුවේ ධම්මානන්ද හිමියන් පසුබිම සිට කරන මෙහෙයවීම එවැනි ම ශක්තියකි. මෙම සංශෝධිත පරිගණක වර්ණ සංයෝජනය හොරණ ග්‍රැෆික් කලෙක්ෂන්හි ෂෙරින් ජයතිලක මහත්මිය අතින් නිම විය. අජිත් ප්‍රින්ටර්ස්හි අජිත් සමරසේකර යුවල ප්‍රධාන කාර්‍යමණ්ඩලයේ නොමඳ සහායෙන් මේ මුද්‍රණය එළිදැක්විණ. කවදත් උදව් දෙන පිරිසක් සිටීමෙන් පිරිවැය පිරිමසා ගැනීමටත් සැහැල්ලුවෙන් මුද්‍රණයෙන් එළිදැක්වීමටත් හැකි විය. සියල්ලෝ ප්‍රඥාවන්තයෝ වෙත්වා.

**තිසරණ සරණයි!**

සී. තනිප්පුලි ආරච්චි
ගරු ලේකම්
ශ්‍රී චන්ද්‍රවිමල ධර්මපුස්තක
සංරක්ෂණ මණ්ඩලය

# නිවැරදි අභිධර්ම දැනුම

සඳහා

රේරුකානේ චන්දවිමල මහනාහිමිගේ

“අභිධර්ම මාර්ගය”

හා

“අභිධර්මයේ මූලික කරුණු”

පොත් කියවන්න.

# අභිධර්මාර්ථ සංග්‍රහය

අනුවාද සහිත

# අභිධර්මාර්ථ සංග්‍රහය

## ප්‍රථම පරිච්ඡේදය

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

1. සම්මා සම්බුද්ධ මතුලං - සසද්ධම්ම ගණුත්තමං,
අභිවාදිය භාසිස්සං - අභිධම්මත්ථ සංගහං

2. තත්ථ වුත්තාභිධම්මත්ථා - චතුධා පරමත්ථතො,
චිත්තං චෙතසිකං රූපං - නිබ්බානමිති සබ්බථා

3. තත්ථ චිත්තං තාව චතුබ්බිධං හොති කාමාවචරං,
රූපාවචරං, අරූපාවචරං, ලොකුත්තරං චේති

4. තත්ථ කතමං කාමාවචරං? සොමනස්ස සහගතං දිට්ඨිගත සම්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරික මෙකං, සොමනස්ස සහගතං දිට්ඨිගත විප්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකං, උපෙක්ඛා සහගතං දිට්ඨිගත සම්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකං, උපෙක්ඛා සහගතං දිට්ඨිගත විප්පයුත්තං අසංඛාරිකමේකං, සසංඛාරිකමෙකන්ති. ඉමානි අට්ඨපි ලොභ සහගත චිත්තානි නාම.

5. දොමනස්ස සහගතං පටිඝසම්පයුත්තං අසංඛාරිකමෙකං සසංඛාරිකමෙකන්ති ඉමානි ද්වෙපි පටිඝ සම්පයුත්ත චිත්තානි නාම.

6. උපෙක්ඛා සහගතං විචිකිච්ඡා සම්පයුත්තමෙකං, උපෙක්ඛා සහගතං උද්ධච්චසම්පයුත්තමෙකන්ති ඉමානි ද්වේපි මොමූහ චිත්තානි නාම.

## අනුවාදය

1. ස්වාඛ්‍යාතාදි ගුණයෙන් යුක්ත වූ සපර්‍යාප්තික නව-ලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය හා උත්තම වූ සංඝයා සහිත වූ ශීලාදි ගුණයෙන් කිසිවකු හා සම නොවූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විශේෂයෙන් වැඳ, අභිධර්මාර්ථ සංග්‍රහය කියමි.

2. ඒ අභිධර්ම පිටකයෙහි සර්වාකාරයෙන් වදාරන ලද්දා වූ අභිධර්මාර්ථයෝ පරමාර්ථ වශයෙන් චිත්තය, චෛතසිකය, රූපය, නිර්වාණයයි සතර ආකාරයකින් සිටියාහු ය.

3. ඒ අභිධර්මාර්ථ සතර අතුරෙන් පළමුකොට චිත්තය කාමාවචරය, රූපාවචරය, අරූපාවචරය, ලෝකෝත්තරය යි සතර ආකාර වන්නේ ය.

### කාමාවචර සිත් 54 අකුසල් සිත් 12

4. ඒ චතුර්විධ චිත්තයන් අතුරෙන් කාමාවචර චිත්තය කවරේද? සෞමනස්‍ය සහගත දෘෂ්ටිසම්ප්‍රයුක්ත අසංස්කාරික එකකි. සසංස්කාරික එකකි. සෞමනස්‍ය සහගත දෘෂ්ටිවිප්‍රයුක්ත අසංස්කාරික එකකි. සසංස්කාරික එකකි, උපේක්ෂා සහගතදෘෂ්ටි සම්ප්‍රයුක්ත අසංස්කාරික එකකි. සසංස්කාරික එකකි. උපේක්ෂා සහගත දෘෂ්ටි විප්‍රයුක්ත අසංස්කාරික එකකි. සසංස්කාරික එකකි. මේ සිත් අට **ලෝභ සහගත චිත්තයෝ** නම් වෙති.

5. දෞර්මනස්‍ය සහගත ප්‍රතිඝසම්ප්‍රයුක්ත අසංස්කාරික එකකි. සසංස්කාරික එකකි. මේ සිත් දෙක **ප්‍රතිඝ සම්ප්‍රයුක්ත චිත්තයෝ** නම් වෙති.

6. උපේක්ෂා සහගත විචිකිත්සා සම්ප්‍රයුක්ත සිත් එකකි. උපේක්ෂා සහගත ඖද්ධත්‍ය සම්ප්‍රයුක්ත සිත් එකකි. මොහු දෙදෙන **මෝමූහ චිත්තයෝ** නම් වෙති.

7. ඉච්චෙවං සබ්බථාපි ද්වාදස අකුසල චිත්තානි සමත්තානි.

8. අට්ඨධා ලොභමූලානි - දොසමූලානි ච ද්විධා,
මොහමූලානි ච ද්වෙති - ද්වාදසා කුසලා සියුං.

9. උපෙක්ඛාසහගතං චක්ඛුවිඤ්ඤාණං, තථා සොත විඤ්ඤාණං, ඝාණවිඤ්ඤාණං, ජිව්හාවිඤ්ඤාණං, දුක්ඛසහගතං කායවිඤ්ඤාණං, උපෙක්ඛා සහගතං සම්පටිච්ඡනං, තථා සන්තීරණඤ්චෙති ඉමානි සත්තපි අකුසල විපාක චිත්තානි නාම.

10. උපෙක්ඛා සහගතං චක්ඛුවිඤ්ඤාණං තථා සොත විඤ්ඤාණං, ඝාණවිඤ්ඤාණං, ජිව්හාවිඤ්ඤාණං, සුඛසහගතං කායවිඤ්ඤාණං, උපෙක්ඛා සහගතං සම්පටිච්ඡනං, සොමනස්ස සහගතං සන්තීරණං, උපෙක්ඛා සහගතං සන්තීරණඤ්චෙති ඉමානි අට්ඨපි කුසල විපාකාහෙතුක චිත්තානි නාම.

11. උපෙක්ඛා සහගතං පඤ්චද්වාරාවජ්ජනං, තථා මනොද්වාරාවජ්ජනං, සොමනස්ස සහගතං හසිතුප්පාදඤ්චෙති ඉමානි තීණිපි අහේතුක ක්‍රියා චිත්තානි නාම.

12. ඉච්චේවං සබ්බථාපි අට්ඨාරස අහේතුක චිත්තානි සමත්තානි,

13. සත්තාකුසලපාකානි - පුඤ්ඤපාකානි අට්ඨධා,
ක්‍රියාචිත්තානි තීණීති - අට්ඨාරස අහේතුකා.

14. පාපාහේතුක මුත්තානි - සොභනානීති වුච්චරෙ,
එකූනසට්ඨි චිත්තානි - අථෙකනවුතීපි වා.

7. මෙසේ සර්ව ප්‍රකාරයෙන් දොළොසක් වූ අකුසල චිත්තයෝ සමාප්තය හ.

8. ලෝභ මූල චිත්තයෝ අටවැදෑරුම් වන්නාහ. ද්වේෂමූල චිත්තයෝ දෙවැදෑරුම් වන්නාහ. මෝහමූල චිත්තයෝ දෙවැදෑරුම් වන්නාහ. මෙසේ අකුශල චිත්තයෝ දොළොසක් වන්නාහු ය.

## අහේතුක සිත් 18

9. උපේක්ෂා සහගත චක්ෂුර්විඥානය, එසේ ම වූ ශ්‍රෝත්‍ර විඥනය, ඝ්‍රාණ විඥනය, ජිහ්වා විඥනය, දුඃඛ සහගත කාය විඥනය, උපේක්ෂා සහගත සම්ප්‍රතෝෂණ චිත්තය, එසේ ම වූ සන්තීරණ චිත්තය යන මේ සත්දෙන **අකුශල විපාක චිත්තයෝ** නම් වෙති.

10. උපේක්ෂා සහගත චක්ෂුර්විඥනය, එසේ ම වූ ශ්‍රෝත්‍ර විඥනය, ඝ්‍රාණ විඥනය, ජිහ්වා විඥනය, සුඛසහගත කාය විඥනය, උපේක්ෂා සහගත සම්ප්‍රතොෂණ චිත්තය, සෞමනස්‍ය සහගත සන්තීරණ චිත්තය, උපේක්ෂා සහගත සන්තීරණ චිත්තය යන මේ අටදෙන **අහේතුක කුසල විපාක චිත්තයෝ** නම් වෙති.

11. උපේක්ෂා සහගත පඤ්චද්වාරාවර්ජන චිත්තය, එසේ ම වූ මනෝද්වාරාවර්ජනය, සෞම්‍යනස්‍ය සහගත හසිතෝත්පාදය යන මේ තිදෙන **අහේතුක ක්‍රියා චිත්තයෝ** නම් වෙති.

12. මෙසේ සර්වාකාරයෙන් අටළොසක් වූ අහේතුක චිත්තයෝ සමාප්තයහ.

13. අකුසල විපාක සිත් සතකි. කුසල විපාකයෝ අට වැදෑරුම් වෙති. ක්‍රියා සිත් තුනකි. මෙසේ අහේතුක සිත් අට-ළොසක් වෙති.

14. අකුශලයන්ගෙන් හා අහේතුකයන්ගෙන් අන්‍ය වූ එකුන් සැටක් වූ, අන් ක්‍රමයකින් අනූ එකක් වූ චිත්තයෝ සෝභනයෝ යයි කියනු ලැබෙත්.

15. සොමනස්ස සහගතං ඤාණ සම්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකං, සොමනස්ස සහගතං ඤාණවිප්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරික මෙකං, උපෙක්ඛ, සහගතං ඤාණසම්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකං, උපෙක්ඛා සහගතං ඤාණවිප්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකන්ති ඉමානි අට්ඨපි කාමාවචර කුසල චිත්තානි නාම.

16. සොමනස්ස සහගතං ඤණසම්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකං, සොමනස්ස සහගතං ඤණවිප්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකං, උපෙක්ඛා සහගතං ඤණසම්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකං උපෙක්ඛා සහගතං ඤාණවිප්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකන්ති ඉමානි අට්ඨපි සහෙතුක කාමාවචර විපාක චිත්තානි නාම.

17. සොමනස්ස සහගතං ඤාණසම්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකං, සොමනස්ස සහගතං ඤාණවිප්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකං, උපෙක්ඛා සහගතං ඤාණසම්පයුත්තං අසංඛාරිකමෙකං, සසංඛාරිකමෙකං, උපෙක්ඛා සහගතං ඤාණවිප්පයුත්තං අසංඛාරික මෙකං, සසංඛාරිකමෙකන්ති ඉමානි අට්ඨපි සහෙතුක කාමාවචර ක්‍රියා චිත්තානි නාම.

18. ඉච්චෙවං සබ්බථාපි චතුවීසති සහෙතුක,
කාමාවචර කුසල විපාක ක්‍රියා චිත්තානි සමත්තානි.

19. වේදනා ඤාණ සංඛාර - භේදෙන චතුවීසති,
සහෙතුකාමාවචර - පුඤ්ඤපාක ක්‍රියා මතා.

20. කාමෙ තෙ විස පාකානි - පුඤ්ඤාපුඤ්ඤානි වීසති,
එකාදසක්‍රියාචෙති - චතුපඤ්ඤාස සබ්බථා.

## කාම ශෝභන සිත් 24

15. සෞම්‍යනස්‍ය සහගත ඥානසම්ප්‍රයුක්ත අසංස්කාරික එකකි. සසංස්කාරික එකකි. සෞමනස්‍ය සහගත ඥානවිප්‍රයුක්ත අසංස්කාරික එකකි. සසංස්කාරික එකකි, උපේක්ෂා සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංස්කාරික එකකි. සසංස්කාරික එකකි. උපේක්ෂා සහගත ඥාන විප්‍රයුක්ත අසංස්කාරික එකකි. සසංස්කාරික එකකි. අටක් වූ මේ චිත්තයෝ **කාමාවචර කුසල චිත්තයෝ** නම් වෙති.

16. සෞමනස්‍ය සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංස්කාරික එකකි. සසංස්කාරික එකකි. සෞමනස්‍ය සහගත ඥානවිප්‍රයුක්ත අසංස්කාරික එකකි, සසංස්කාරික එකකි. උපේක්ෂා සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංස්කාරික එකකි. සසංස්කාරික එකකි, උපේක්ෂා සහගත ඥානවිප්‍රයුක්ත අසංස්කාරික එකකි, සසංස්කාරික එකකි, අටක් වූ ද මේ චිත්තයෝ **සහේතුක කාමාවචර විපාක චිත්තයෝ** නම් වෙති.

17. සෞමනස්‍ය සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංස්කාරික එකකි, සසංස්කාරික එකකි, සෞමනස්‍ය සහගත ඥාන විප්‍රයුක්ත අසංස්කාරික එකකි, සසංස්කාරික එකකි, උපේක්ෂා සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංස්කාරික එකකි, සසංස්කාරික එකකි, උපේක්ෂා සහගත ඥාන විප්‍රයුක්ත අසංස්කාරික එකකි. සසංස්කාරික එකකි. අටක් වූ ද මේ සිත් **සහේතුක කාමාවචර ක්‍රියා චිත්තයෝ** නම් වෙති.

18. මෙසේ සර්වප්‍රකාරයෙන් සූවිස්සක් වූ සහේතුක කාමාවචර කුශල විපාක ක්‍රියා චිත්තයෝ සමාප්තය හ.

19. කාමාවචර කුශලය, සහේතුක කාමාවචර විපාකය, සහේතුක කාමාවචර ක්‍රියා ය යන මොහු වේදනා ඥාන සංස්කාරයන්ගේ භේදයෙන් සූවිස්සකැ යි දන්නා ලදහ.

20. කාමභූමියෙහි විපාකයෝ තෙවිස්සෙකි. කුශලා කුශලයෝ විස්සෙකි. ක්‍රියා සිත් එකොළසෙකි. මෙසේ සර්ව ප්‍රකාරයෙන් කාම සිත් සිවුපණසෙකි.

21. විතක්ක විචාර පීති සුඛෙකග්ගතා සහිතං පඨමජ්ඣාන කුසල චිත්තං, විචාර පීති සුඛෙකග්ගතා සහිතං දුතියජ්ඣාන කුසල චිත්තං. පීති සුඛෙකග්ගතා සහිතං තතියජ්ඣාන කුසලචිත්තං, සුඛෙකග්ගතා සහිතං චතුත්ථජ්ඣාන කුසලචිත්තං, උපෙක්ඛෙකග්ගතා සහිතං පඤ්චමජ්ඣාන කුසලචිත්තං චෙති ඉමානි පඤ්චපි රූපාවචර කුසල-චිත්තානි නාම.

22. විතක්ක විචාර පීති සුඛෙකග්ගතා සහිතං පඨමජ්ඣාන විපාක චිත්තං, විචාර පීති සුඛෙකග්ගතා සහිතං දුතියජ්ඣාන විපාක චිත්තං, පීති සුඛෙකග්ගතා සහිතං තතියජ්ඣාන විපාක චිත්තං, සුඛෙකග්ගතා සහිතං චතුත්ථජ්ජධාන විපාක චිත්තං, උපෙක්ඛෙකග්ගතා සහිතං පඤ්චමජ්ඣාන විපාක චිත්තං චෙති. ඉමානි පඤ්චපි රූපාවචර විපාක චිත්තානි නාම.

23. විතක්ක විචාර පීති සුඛෙකග්ගතා සහිතං පඨමජ්ඣාන ක්‍රියා චිත්තං, විචාර පීති සුඛෙකග්ගතා සහිතං දුතියජ්ඣාන ක්‍රියා චිත්තං, පීති සුඛෙකග්ගතා සහිතං තතියජ්ඣාන ක්‍රියා චිත්තං, සුඛෙකග්ගතා සහිතං චතුත්ථජ්ඣාන ක්‍රියා චිත්තං, උපෙක්ඛෙකග්ගතා සහිතං පඤ්චමජ්ඣාන ක්‍රියා චිත්තඤ්චෙති ඉමානි පඤ්චපි රූපාවචර ක්‍රියා චිත්තානි නාම.

24. ඉච්චෙවං සබ්බථාපි පණ්ණරස රූපාවචර කුසල විපාක ක්‍රියා චිත්තානි සමත්තානි.

25. පඤ්චධා ඣාන භෙදෙන - රූපාවචර මානසං,

පුඤ්ඤපාක ක්‍රියා භෙදා - තං පඤ්ච දසධා භවෙ.

## රූපාවචර සිත් 15

21. විතර්කය, විචාරය, ප්‍රීතිය, සුඛය, ඒකාග්‍රතාව යන මොවුන් සහිත වූ ප්‍රථමධ්‍යාන කුශල චිත්තය, විචාරය, ප්‍රීතිය, සුඛය, ඒකාග්‍රතාවය යන මොවුන් සහිත වූ ද්විතීයධ්‍යාන කුශල චිත්තය, ප්‍රීතිය, සුඛය, ඒකාග්‍රතාවය යන මොවුන් සහිත වූ තෘතීයධ්‍යාන කුශල චිත්තය, සුඛය, ඒකාග්‍රතාව යන මොවුන් සහිත වූ චතුර්ථධ්‍යාන කුශල චිත්තය, උපේක්‍ෂාව ඒකාග්‍රතාව යන මොවුන් සහිත වූ පඤ්චමධ්‍යාන කුශල චිත්තය යන මේ පසක් වූ ද චිත්තයෝ **රූපාවචර කුශල චිත්තයෝ** නම් වෙති.

22. විතර්කය, විචාරය, ප්‍රීතිය, සුඛය, ඒකාග්‍රතාව යන මොවුන් සහිත වූ ප්‍රථමධ්‍යාන විපාක චිත්තය, විචාරය, ප්‍රීතිය, සුඛය, ඒකාග්‍රතාව යන මොවුන් සහිත වූ ද්විතීයධ්‍යාන විපාක චිත්තය, ප්‍රීතිය, සුඛය, ඒකාග්‍රතාව යන මොවුන් සහිත වූ තෘතීයධ්‍යාන විපාක චිත්තය, සුඛය, ඒකාග්‍රතාව යන මොවුන් සහිත වූ චතුර්ථධ්‍යාන විපාක චිත්තය, උපේක්‍ෂාව ඒකාග්‍රතාව යන මොවුන් සහිත වූ පඤ්චමධ්‍යාන විපාක චිත්තය යන මේ පසක් වූ ද චිත්තයෝ **රූපාවචර විපාක චිත්තයෝ** නම් වෙති.

23. විතර්කය, විචාරය, ප්‍රීතිය, සුඛය, ඒකාග්‍රතාවය යන මොවුන් සහිත වූ ප්‍රථම ධ්‍යාන ක්‍රියා චිත්තය, විචාරය, ප්‍රීතිය, සුඛය, ඒකාග්‍රතාව යන මොවුන් සහිත වූ ද්විතීය ධ්‍යාන ක්‍රියා චිත්තය, ප්‍රීතිය, සුඛය, ඒකාග්‍රතාව යන මොවුන් සහිත වූ තෘතීයධ්‍යාන ක්‍රියා චිත්තය, සුඛය ඒකාග්‍රතාව යන මොවුන් සහිත වූ චතුර්ථධ්‍යාන ක්‍රියා චිත්තය, උපේක්‍ෂාව ඒකාග්‍රතාව යන මොවුන් සහිත වූ පඤ්චමධ්‍යාන ක්‍රියා චිත්තය යන පසක් වූ ද මේ චිත්තයෝ **රූපාවචර ක්‍රියා චිත්තයෝ** නම් වෙති.

24. මෙසේ සර්වප්‍රකාරයෙන් රූපාවචර කුශල විපාක ක්‍රියා චිත්තයෝ සමාප්තයහ.

25. රූපාවචර සිත ධ්‍යාන භේදයෙන් පස් වැදෑරුම් වන්නේ ය. එය කුශල විපාක ක්‍රියා භේදයෙන් පසළොස් වැදෑරුම් වන්නේ ය.

26. ආකාසානඤ්චායතන කුසල චිත්තං, විඤ්ඤාණඤ්චායතන කුසල චිත්තං, ආකිඤ්චඤ්ඤායතන කුසල චිත්තං, නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසල චිත්තඤ්චෙති. ඉමානි චත්තාරිපි අරූපාවචර කුසල චිත්තානි නාම.

27. ආකාසානඤ්චායතන විපාක චිත්තං, විඤ්ඤාණඤ්චායතන විපාක චිත්තං, ආකිඤ්චඤ්ඤායතන විපාක චිත්තං, නෙවසඤ්ඤානාසඤ්ඤායතන විපාක චිත්තඤ්චෙති ඉමානි චත්තාරිපි අරූපාවචර විපාක චිත්තානි නාම.

28. ආකාසානඤ්චායතන ක්‍රියා චිත්තං, විඤ්ඤාණඤ්චායතන ක්‍රියා චිත්තං, ආකිඤ්චඤ්ඤායතන ක්‍රියා චිත්තං, නෙවසඤ්ඤානාසඤ්ඤායතන ක්‍රියා චිත්තඤ්චෙති ඉමානි චත්තාරිපි අරූපාවචර ක්‍රියා චිත්තානි නාම.

29. ඉච්චෙවං සබ්බථාපි ද්වාදස අරූපාවචර කුසල විපාක ක්‍රියා චිත්තානි සමත්තානි.

30. ආලම්බණප්පභෙදෙන - චතුධා රූප්පමානසං,

පුඤ්ඤ පාක ක්‍රියා භෙදා - පුන ද්වාදසධා ඨිතං.

31. සොතාපත්ති මග්ග චිත්තං, සකදාගාමි මග්ග චිත්තං, අනාගාමි මග්ග චිත්තං, අරහත්ත මග්ග චිත්තඤ්චෙති ඉමානි චත්තාරිපි ලොකුත්තර කුසල චිත්තානි නාම.

32. සොතාපත්ති ඵල චිත්තං සකදාගාමි ඵල චිත්තං අනාගාමි ඵල චිත්තං, අරහත්ත ඵල චිත්තඤ්චෙති ඉමානි චත්තාරිපි ලොකුත්තර විපාක චිත්තානි නාම.

33. ඉච්චෙවං සබ්බථාපි අට්ඨ ලොකුත්තර කුසල විපාක චිත්තානි සමත්තානි.

## අරූපාවචර සිත් 12

26. ආකාසානඤ්චායතන කුශල චිත්තය, විඤ්ඤාණඤ්චායතන කුශල චිත්තය, ආකිඤ්චඤ්ඤායතන කුසල චිත්තය, නේවසඤ්ඤානාසඤ්ඤායතන කුශල චිත්තය යන මේ සතරක් වූ ද චිත්තයෝ **අරූපාවචර කුශල චිත්තයෝ** නම් වෙති.

27. ආකාසානඤ්චායතන විපාක චිත්තය, විඤ්ඤාණඤ්චායතන විපාක චිත්තය, ආකිඤ්චඤ්ඤායතන විපාක චිත්තය, නේවසඤ්ඤානාසඤ්ඤායතන විපාක චිත්තය යන මේ සතරක් වූ ද චිත්තයෝ **අරූපාවචර විපාක චිත්තයෝ** නම් වෙති.

28. ආකාසානඤ්චායතන ක්‍රියා චිත්තය, විඤ්ඤාණඤ්චායතන ක්‍රියා චිත්තය, ආකිඤ්චඤ්ඤායතන ක්‍රියා චිත්තය, නේවසඤ්ඤානාසඤ්ඤායතන ක්‍රියා චිත්තය යන මේ සතරක් වූ ද චිත්තයෝ **අරූපාවචර ක්‍රියා චිත්තයෝ** නම් වෙති.

29. මෙසේ සර්වප්‍රකාරයෙන් අරූපාවචර කුශල විපාක ක්‍රියා චිත්තයෝ සමාප්තයහ.

30. අරූපාවචර චිත්තය ආරම්මණයන්ගේ භේදයෙන් සතර ආකාර වන්නේ ය. නැවත කුශල විපාක ක්‍රියා භේදයෙන් දොළොස් ආකාරයකින් සිටියේ ය.

## ලෝකෝත්තර සිත් අට

31. ශ්‍රෝතාපත්ති මාර්ග චිත්තය, සකෘදාගාමි මාර්ග චිත්තය, අනාගාමි මාර්ග චිත්තය, අර්හත් මාර්ග චිත්තය යන මේ සතරක් වූ ද චිත්තයෝ **ලෝකෝත්තර කුශල චිත්තයෝ** නම් වෙති.

32. ශ්‍රෝතාපත්ති ඵල චිත්තය, සකෘදාගාමි ඵල චිත්තය, අනාගාමි ඵල චිත්තය, අර්හත් ඵල චිත්තය යන මේ සතරක් වූ ද චිත්තයෝ **ලෝකෝත්තර විපාක චිත්තයෝ** නම් වෙති.

33. මෙසේ සර්වප්‍රකාරයෙන් අටක් වූ ලෝකෝත්තර කුශල විපාක චිත්තයෝ සමාප්තයහ.

34. චතුමග්ගප්පභෙදෙන - චතුධා කුසලං තථා,
පාකං තස්ස ඵලත්තාති - අට්ඨධානුත්තරං මතං.

35. ද්වාදසා කුසලානෙවං - කුසලානෙක වීසති,
ඡත්තිංසෙව විපාකානි - ක්‍රියා චිත්තානි වීසති.

36. චතුපඤ්ඤාසධා කාමෙ - රූපෙ පණ්ණරසීරයෙ,
චිත්තානි ද්වාදසාරූප්පෙ - අට්ඨධානුත්තරෙ තථා.

37. ඉත්ථමෙකූනනවුතිප්ප - පභෙදං පන මානසං,
එක වීස සතං වාථ - විභජන්ති විචක්ඛණා.

38. කථමෙකූන නවුතිවිධං චිත්තං එකවීසසතං හොති?

39. විතක්ක විචාර පීති සුඛෙකග්ගතා සහිතං පඨමජ්ඣාන සොතාපත්ති මග්ග චිත්තං, විචාර පීති සුඛෙකග්ගතා සහිතං දුතියජ්ඣාන සොතාපත්ති මග්ග චිත්තං, පීති සුඛෙකග්ගතා සහිතං තතියජ්ඣාන සොතාපත්ති මග්ග චිත්තං, සුඛෙ-කග්ගතා සහිතං චතුත්ථජ්ඣාන සොතාපත්ති මග්ග චිත්තං, උපෙක්ඛෙකග්ගතා සහිතං පඤ්චමජ්ඣාන සොතාපත්ති මග්ග චිත්තඤ්චෙති ඉමානි පඤ්චපි සොතාපත්ති මග්ග චිත්තානි නාම.

40. තථා සකදාගාමි මග්ග අනාගාමි මග්ග අරහත්ත මග්ග චිත්තඤ්චෙති සමවීසති මග්ග චිත්තානි.

41. තථා ඵල චිත්තානි චෙති සමචත්තාළීස,
ලොකුත්තර චිත්තානි භවන්ති.

42. ඣානංගයොගභෙදෙන - කත්වෙකෙකන්තු පඤ්චධා,
වුච්චතානුත්තරං චිත්තං - චත්තාළීස විධන්ති ච.

34. සතරක් වූ මාර්ගයන්ගේ භේදයෙන් ලෝකෝත්තර කුශලය සතර ආකාර වන්නේ ය. විපාකය එහි ම ඵල බැවින් ලෝකෝත්තර චිත්තය අට වැදෑරුම් වේ යයි දක්නා ලදී.

35. මෙසේ අකුශලයෝ දොළොසෙකි. කුශලයෝ එක් විසි දෙනෙකි. විපාකයෝ සතිස් දෙනෙක් ම ය. ක්‍රියා චිත්තයෝ විසි දෙනෙකි.

36. කාමභූමියෙහි චිත්තයෝ සිව් පනස් ප්‍රකාර යයි ද රූප භූමියෙහි පසළොසකැයි ද අරූප භූමියෙහි දොළොසෙකැයි ද එසේ ම ලෝකෝත්තරයෙහි සිත් අටවැදෑරුම්ය යි ද කියන්නේ ය.

37. මෙසේ එකුන් අනූවක් ප්‍රභේද ඇත්තා වූ සිත නැවත නුවණැත්තෝ අන් ක්‍රමයකින් එක්සිය විසි එකක් කොට විභාග කෙරෙති.

38. කෙසේ එකුන් අනූවක් ප්‍රභේද ඇති සිත එක් සිය විසි එකක් වේද යත්:

39. විතර්ක විචාර ප්‍රීති සුඛෛකාග්‍රතා සහිත වූ ප්‍රථමධ්‍යාන ශ්‍රෝතාපත්ති මාර්ග චිත්තය, විචාර ප්‍රීති සුඛෛකාග්‍රතා සහිත වූ ද්විතීයධ්‍යාන ශ්‍රෝතාපත්ති මාර්ග චිත්තය, ප්‍රීති සුඛෛකාග්‍රතා සහිතවූ තෘතීයධ්‍යාන ශ්‍රෝතාපත්ති මාර්ග චිත්තය, සුඛෛකාග්‍රතා සහිතවූ චතුර්ථධ්‍යාන ශ්‍රෝතාපත්ති මාර්ග චිත්තය, උපේක්ෂෛකාග්‍රතා සහිත වූ පඤ්චමධ්‍යාන ශ්‍රෝතාපත්ති මාර්ග චිත්තය යන මේ පස ද **ශ්‍රෝතාපත්ති මාර්ග චිත්තයෝ** නම් වෙති.

40. එසේ සකෘදාගාමි මාර්ග චිත්තය ද අනාගාමි මාර්ග චිත්තය ද අර්හත් මාර්ග චිත්තය ද වේ. මෙසේ සම විස්සක් **මාර්ග චිත්තයෝ** වෙති.

41. ඵල චිත්තයෝ ද එසේ ම ය. මෙසේ සම සතළිසක් **ලෝකෝත්තර චිත්තයෝ** වෙති.

42. ධ්‍යානාංගයෝග භේදයෙන් එක එකක් පස බැගින් කොට ලෝකෝත්තර චිත්තය සතළිස් වැදෑරුම් වේයයි කියනු ලැබේ.

43. යථා ච රූපාවචරං - ගය්හතානුත්තරං තථා.
පඨමාදි ඣානභෙදෙ - ආරුප්පඤ්චාපි පඤ්චමෙ.

44. එකාදස විධං තස්මා - පඨමාදික මීරිතං.
ඣාන මෙකෙක මන්තේතු - තෙවීසති විධං භවෙ.

45. සත්තතිංස විධං පුඤ්ඤං - ද්විපඤ්ඤාසවිධං තථා,
පාකමිච්චාහු චිත්තානි - එකවීස සතං බුධා.

ඉති අභිධම්මත්ථ සංගහෙ චිත්තසංගහ
විභාගො නාම පඨමො පරිච්ජෙදො.

43. යම් සේ රූපාවචර චිත්තය ප්‍රථමාදිධ්‍යාන භේදයෙහි ගනු ලැබේ ද එසේ ලෝකෝත්තර චිත්තය ද ගනු ලැබේ. අරූපාවචර සිත ද පඤ්චමධ්‍යානයෙහි ගනු ලැබේ.

44. එබැවින් ප්‍රථමාදි එක් එක් ධ්‍යානයක් එකොළොස් වැදෑරුම් යයි කියන ලදී. කෙළවරෙහි ධ්‍යානය වනාහි තෙවිසි වැදෑරුම් වන්නේ ය.

45. කුශලය සත්තිස් වැදෑරුම් වන්නේ ය. එසේ ම විපාකය දෙපණස් වැදෑරුම් වන්නේ ය. මෙසේ චිත්තයෝ එකසියවිසි එකකැයි නුවණැත්තෝ කීහු.

මෙය අභිධර්මාර්ථ සංග්‍රහයෙහි චිත්ත සංග්‍රහ විභාගය නම් වූ

ප්‍රථම පරිච්ඡේදය යි.

# දුතියො පරිච්ඡෙදො

46. එකුප්පාද නිරොධා ච - එකාලම්බන වත්ථුකා,

චෙතොයුත්තා ද්විපඤ්ඤාස - ධම්මා චෙතසිකා මතා.

47. කථං? ඵස්සො වේදනා සඤ්ඤා චෙතනා එකග්ගතා ජීවිතින්ද්‍රියං මනසිකාරෝ චෙති සත්තිමෙ චෙතසිකා සබ්බචිත්ත සාධාරණා නාම.

48. විතක්කො විචාරෝ අධිමොක්ඛො විරියං පීති ඡන්දො චාති ඡ ඉමෙ චෙතසිකා පකිණ්ණකා නාම.

49. එවමෙතෙ තෙරස චෙතසිකා අඤ්ඤසමානාති වෙදිතබ්බා.

50. මොහො අහිරිකං අනොත්තප්පං උද්ධච්චං, ලොභො දිට්ඨි මානො, දොසො ඉස්සා මච්ඡරියං කුක්කුච්චං, ථීනං මිද්ධං, විචිකිච්ඡා චෙති චුද්දසිමෙ චෙතසිකා අකුසලා නාම.

51. සද්ධා සති හිරි ඔත්තප්පං අලොභො අදොසො තත්‍ර මජ්ඣත්තතා කායපස්සද්ධි චිත්තපස්සද්ධි කායලහුතා චිත්තලහුතා කායමුදුතා චිත්තමුදුතා කායකම්මඤ්ඤතා චිත්තකම්මඤ්ඤතා කායපාගුඤ්ඤතා චිත්තපාගුඤ්ඤතා කායුජුකතා චිත්තුජුකතා චෙති එකූනවීසතිමෙ චෙතසිකා සොභන සාධාරණා නාම.

52. සම්මාවාචා සම්මාකම්මන්තො සම්මා ආජීවො චෙති තිස්සො විරතියො නාම.

# ද්විතීය පරිච්ඡේදය

46. සිත හා එක්වැ ඉපදීම හා නිරුද්ධ වීම ඇත්තා වූ ද එක අරමුණක් හා එක නිශ්‍රය වස්තුවක් ඇත්තා වූ ද සිත හා මිශ්‍ර වූ දෙපනසක් ධර්මයෝ **චෛතසිකයෝ** ය යි දන්නා ලදහ.

47. කෙසේ ද යත්? ස්පර්ශය ද වේදනාව ද සංඥාව ද චේතනාව ද ඒකාග්‍රතාව ද ජීවිතේන්ද්‍රිය ද මනස්කාරය ද යන මේ සතක් වූ චෛතසිකයෝ **සර්වචිත්ත සාධාරණයෝ** නම් වෙති.

48. විතර්කය ද විචාරය ද අධිමෝක්ෂය ද වීර්‍ය්‍යය ද ප්‍රීතිය ද ඡන්දය ද යන මේ සයක් වූ චෛතසිකයෝ **ප්‍රකීර්ණකයෝ** නම් වෙති.

49. මෙසේ මේ තෙළෙසක් චෛතසිකයෝ **අන්‍ය සමානයෝ** යයි දත යුත්තාහු ය.

50. මෝහය ද අහිරිකය ද අනොත්තප්පය ද ඖද්ධත්‍යය ද ලෝභය ද දෘෂ්ටිය ද මානය ද ද්වේෂය ද ඊර්ෂ්‍යාව ද මාත්සර්‍ය්‍යය ද කෞකෘත්‍යය ද ස්ත්‍යානය ද මිද්ධය ද විචිකිත්සාව ද යන මේ තුදුසක් වූ චෛතසිකයෝ **අකුශලයෝ** නම් වෙති.

51. ශ්‍රද්ධාව ද ස්මෘතිය ද හිරිය ද ඔත්තප්පය ද අලෝභය ද අද්වේෂය ද තත්‍රමධ්‍යස්ථතාවය ද කායප්‍රශ්‍රබ්ධිය ද චිත්තප්‍රශ්‍රබ්ධිය ද කායලහුතාව ද චිත්ත ලහුතාව ද කායමෘදුත්වය ද චිත්ත-මෘදුත්වය ද කාය කර්මණ්‍යතාව ද චිත්තකර්මණ්‍යතාව ද කායප්‍රාගුණ්‍යතාව ද චිත්තප්‍රාගුණ්‍යතාව ද කායුර්ජුකතාව ද චිත්තුර්ජුකතාව ද යන මේ එකුන්විස්සක් වූ චෛතසිකයෝ **ශෝභන සාධාරණයෝ** නම් වෙති.

52. සම්‍යක් වාචාව ද සම්‍යක්කර්මාන්තය ද සම්‍යගාජීවය ද යන මේ තුන **විරතීහු** නම් වෙති.

53. කරුණා මුදිතා අප්පමඤ්ඤායො නාමාති සබ්බථාපි පඤ්ඤින්ද්‍රියෙන සද්ධිං පඤ්චවීසතිමෙ චෙතසිකා සොභනාති වෙදිතබ්බා.

54. එත්තාවතා ච -

තෙරසඤ්ඤසමානා ච - චුද්දසා කුසලා තථා,

සොභනා පඤ්චවීසාති - ද්විපඤ්ඤස පවුච්චරෙ.

55. තෙසං චිත්තාවියුත්තානං - යථායොග මිතො පරං

චිත්තුප්පාදෙසු පච්චෙකං - සම්පයොගො පවුච්චති.

56. සත්ත සබ්බත්ථ යුජ්ජන්ති - යථායොගං පකිණ්ණකා

චුද්දසාකුසලෙස්වෙච - සොභනෙස්වෙච සොභනා.

57. කථං? සබ්බචිත්ත සාධාරණා තාව සත්තිමෙ චෙතසිකා සබ්බේසුපි එකූනනවුති චිත්තුප්පාදෙසු ලබ්භන්ති.

58. පකිණ්ණකෙසු පන විතක්කො තාව ද්විපඤ්ච විඤ්ඤාණ වජ්ජිත කාමාවචර චිත්තෙසු චෙව එකාදසසු පඨමජ්ඣාන චිත්තෙසු චාති පඤ්ච පණ්ණාස චිත්තෙසු උප්පජ්ජති.

59. විචාරො පන තෙසු චෙව එකාදසසු දුතියජ්ඣාන චිත්තෙසු චාති ඡසට්ඨී චිත්තෙසු.

60. අධිමොක්ඛො ද්විපඤ්ච විඤ්ඤාණ විචිකිච්ඡා සහගත වජ්ජිත චිත්තෙසු.

61. විරියං පඤ්චද්වාරාවජ්ජන ද්විපඤ්ච විඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ වජ්ජිත චිත්තෙසු.

62. පීති දොමනස්සුපෙක්ඛා සහගත කායවිඤ්ඤාණ චතුත්ථජ්ඣාන වජ්ජිත චිත්තෙසු.

53. කරුණාව ද මුදුතාව ද යන දෙක **අප්‍රමාණ්‍ය** නම් වෙති. මෙසේ ප්‍රඥෙන්ද්‍රියය ද සමග විසිපහක් වූ මේ චෛතසිකයෝ **ශෝභනයෝ** ය යි දත යුත්තාහු ය.

54. තෙළෙසක් වූ අන්‍ය සමාන චෛතසිකයෝ ද එසේ තුදුසක් වූ අකුශල චෛතසිකයෝ ද විසිපහක් වූ ශෝභන චෛතසිකයෝ දැයි මෙපමණකින් දෙපනස් චෛතසිකයෝ කියනු ලැබෙත්.

55. මෙයින් පසු චිත්තය හා සම්ප්‍රයෝග වන්නා වූ ඒ චෛතසිකයන්ගේ වෙන වෙන ම චිතෝත්පාදයන්හි සුදුසු පරිද්දෙන් වන්නා වූ සම්ප්‍රයෝගය කියනු ලැබේ.

56. සතක් වූ චෛතසිකයෝ සියලු චිත්තයන්හි ම යෙදෙන්නාහ. ප්‍රකීර්ණක චෛතසිකයෝ සුදුසු සුදුසු පරිදි සකල චිත්තයන්හි යෙදෙන්නාහ. තුදුසක් වූ අකුශල චෛතසිකයෝ අකුශල චිත්තයන්හි ම යෙදෙන්නාහ. ශෝභනයෝ ශෝභන චිත්තයන්හි ම යෙදෙන්නාහ.

57. කෙසේ ද යත්? සර්වචිත්ත සාධාරණ නම් වූ සතක් වූ මේ චෛතසිකයෝ එකුන් අනූවක් වූ සියලු චිත්තයන්හි ලැබෙත්.

58. ප්‍රකීර්ණකයන් අතුරෙන් විතර්කය ද්විපඤ්ච විඥනවර්ජිත කාමාවචර චිත්තයන්හි හා එකොළොසක් වූ ප්‍රථමධ්‍යාන චිත්තයන්හි දැයි පස්පනස් චිත්තයන්හි උපදී.

59. විචාරය වනාහි ඒ සිත්වල හා එකොළොස් ද්විතීයධ්‍යාන චිත්තයන්හි දැයි සැටක් චිත්තයන්හි උපදී.

60. අධිමෝක්ෂය ද්විපඤ්ච විඥන විචිකිත්සා සහගත චිත්ත වර්ජිත අටසැටක් චිත්තයන්හි උපදී.

61. වීය්‍ර්‍යය පඤ්චද්වාරාවර්ජන ද්විපඤ්චවිඥන සම්ප්‍රතොෂණ සන්තීරණ වර්ජිත වූ තුන්සැත්තෑ චිත්තයන්හි උපදී.

62. ප්‍රීතිය දෞර්මනස්‍ය සහගත උපේක්ෂා සහගත කාය විඥන චතුර්ථධ්‍යාන වර්ජිත එක්පනස් චිත්තයන්හි උපදී.

63. ඡන්දො අහෙතුක මොමූහ වජ්ජිත චිත්තේසුති.

64. තෙ පන චිත්තුප්පාදා යථාක්කමං-

ඡසට්ඨි පඤ්ච පඤ්ඤාස - එකාදස ච සොළස,

සත්තති වීසති චෙව - පකිණ්ණක විවජ්ජිතා.

65. පඤ්චපඤ්ඤාස ඡසට්ඨි - අට්ඨසත්තති තිසත්තති,

එකපඤ්ඤාස චෙකූන - සත්තතී සපකිණ්ණකා ,

66. අකුසලෙසු පන මොහො අහිරිකං අනොත්තප්පං උද්ධච්චං චාති චත්තාරො මෙ චෙතසිකා සබ්බා කුසල සාධාරණා නාම. සබ්බේසුපි ද්වාදසා කුසලෙසු ලබ්භන්ති.

67. ලොභො අට්ඨසු ලොභසහගත චිත්තේස්වෙව ලබ්භති.

68. දිට්ඨි චතුසු දිට්ඨිගත සම්පයුත්තේසු.

69. මානො චතුසු දිට්ඨිගත විප්පයුත්තේසු.

70. දොසො ඉස්සා මච්ඡරියං කුක්කුච්චඤ්චෙති ද්වීසු පටිඝ සම්පයුත්ත චිත්තේසු.

71. ථීනං මිද්ධං පඤ්චසු සසංඛාරික චිත්තේසු.

72. විචිකිච්ඡා විචිකිච්ඡා සහගත චිත්තෙයෙවාති.

73. සබ්බාපුඤ්ඤේසු චත්තාරො - ලොභමූලෙ තයො කතා

දොසමූලෙසු චත්තාරො - සසංඛාරෙ ද්වයං තථා

74. විචිකිච්ඡා විචිකිච්ඡා - චිත්තෙචාති චතුද්දස.

ද්වාදසාකුසලෙස්වේව - සම්පයුජ්ජන්ති පඤ්චධා.

63. ඡන්දය අහේතුක මෝමූහ වර්ජිත එකුන් සැත්තෑ චිත්තයන්හි උපදී.

64. ප්‍රකීර්ණකයන් විසින් හරනා ලද්ද වූ ඒ චිත්තෝත්පාදයෝ පිළිවෙළින් සසැටක් ද පස්පනසක් ද එකොළොසක් ද සොළොසක් ද සැත්තෑවක් ද විස්සක් ද වන්නාහු ය.

65. ප්‍රකීර්ණකයන් යෙදෙන්නා වූ චිත්තෝත්පාදයෝ පිළිවෙළින් පස්පනසක්ද සසැටක් ද සැත්තෑ අටක් ද සැත්තෑ තුනක් ද එක්පනසක් ද සැටනවයක් ද වන්නාහු ය.

66. අකුශල චෛතසිකයන් අතුරෙහි වනාහි මෝහය අහිරිකය අනෝත්තප්පය උද්ධච්චය යන මේ චෛතසිකයෝ සතර දෙන **සර්වාකුශල සාධාරණයෝ** නම් වෙති. ඔව්හු සියලු දොළොස් අකුශල චිත්තයන්හි ම ලැබෙති.

67. ලෝභය අටක් වූ ලෝභ සහගත චිත්තයන්හි ලැබේ.

68. දෘෂ්ටිය සතරක් වූ දෘෂ්ටි සම්ප්‍රයුක්ත චිත්තයන්හි ලැබේ.

69. මානය සතරක් වූ දෘෂ්ටි විප්‍රයුක්ත චිත්තයන්හි ලැබේ.

70. ද්වේෂය ඊර්ෂ්‍යාව මාත්සර්‍ය්‍යය කෞකෘත්‍යය යන මොහු දෙකක් වූ ප්‍රතිඝසම්ප්‍රයුක්ත චිත්තයන්හි ලැබෙත්.

71. ථීනය මිද්ධය යන දෙක සසංඛාරික සිත් පසෙහි ලැබෙත්.

72. විචිකිත්සාව විචිකිච්ඡා සහගත චිත්තයෙහි ම ලැබේ.

73. චෛතසිකයෝ සතර දෙනෙක් සියලු අකුශල චිත්තයන්හි ද තිදෙනෙක් ලෝභමූලයෙහි ද සතර දෙනෙක් ද්වේෂමූලයෙහි ද එසේ ම සසංඛාරික සිත් පසෙහි දෙදෙනෙක් ද කරන ලද්දහු ය.

74. විචිකිත්සාව විචිකිත්සා සහගත චිත්තයන්හි ම කරන ලදැයි තුදුස් දෙනෙක් වූ චෛතසිකයෝ දොළොස් අකුශල චිත්තයෙහි ම පස් ආකාරයකින් යෙදෙන්නාහු ය.

75. සොභනෙසු පන සොභනසාධාරණා තාව
එකූන වීසති චෙතසිකා සබ්බේසු පි එකූනස ට්ඨි
සොභන චිත්තෙසු සංවිජ්ජන්ති.

76. විරතියො පන තිස්සො පි ලොකුත්තර චිත්තෙසු සබ්බථාපි නියතා එකතොව ලබ්භන්ති, ලොකියෙසු පන කාමාවචර කුසලෙස්වෙව කදාචි සන්දිස්සන්ති විසුං විසුං.

77. අප්පමඤ්ඤායො පන ද්වාදසසු පඤ්චම ඣාන වජ්ජිත මහග්ගත චිත්තෙසු චෙව කාමාවචර කුසලෙසු ච සහෙතුක කාමාවචර ක්‍රියා චිත්තෙසු චාති අට්ඨවීසති චිත්තෙස්වේව කදාචි නානා හුත්වා ජායන්ති. උපෙක්ඛා සහගතෙසු පනෙත්ථ කරුණා මුදිතා න සන්තීති කෙචි වදන්ති.

78. පඤ්ඤා පන ද්වාදසසු ඤාණසම්පයුත්ත කාමාවචර චිත්තෙසු චෙව සබ්බේසුපි පඤ්චතිංස මහග්ගත ලොකුත්තර චිත්තෙසු චාති සත්ත චත්තාළීස චිත්තෙසු සම්පයෝගං ගච්ඡතීති.

79. එකූනවීසතී ධම්මා - ජායන්තෙකූන සට්ඨිසු
තයො සොළස චිත්තෙසු - අට්ඨවීසතියං ද්වයං

80. පඤ්ඤා පකාසිතා සත්ත - චත්තාළීස විධෙසුපි,
සම්පයුත්තා චතුද්ධෙව - සොභනෙස්වෙව සොභනා

81. ඉස්සා මච්ඡෙර කුක්කුච්ච - විරතී කරුණාදයො
නානා කදාචි මානො ච - ථීන මිද්ධං තථා සහ.

82. යථා වුත්තානු සාරෙන - සෙසා නියත යොගිනො
සංගහඤ්ච පවක්ඛාමි - තෙසං දානි යථා රහං.

83. ඡත්තිංසා නුත්තරෙ ධම්මා - පඤ්චතිංස මහග්ගතෙ.
අට්ඨතිංසාපි ලබ්භන්ති - කාමාවචර සොභනෙ.

75. ශෝභනයන් අතුරෙන් ශෝභන සාධාරණ චෛතසික එකුන්විසි දෙන සියලු එකුන්සැටක් වූ ශෝභන චිත්තයන්හි විද්‍යමාන වෙති.

76. තිදෙනෙක් වූ විරතීහු ලෝකෝත්තර චිත්තයන්හි නියතවැ එක්වැ ලැබෙත්. ලෞකික සිත්වලින් කාමාවචර කුශලයෙහි ම කිසිකලෙක වෙන් වෙන්වැ දක්නා ලැබෙත්.

77. අප්‍රමාණ්‍යයෝ වනාහි දොළොසක් වූ පඤ්චමධ්‍යාන වර්ජිත මහද්ගත චිත්තයන්හි ද කාමාවචර කුශලයන්හි ද සහේතුක කාමාවචර ක්‍රියා චිත්තයන්හි ද යන අටවිසි චිත්තයන්හි ම කිසි-කලෙක වෙන් වෙන් ව ම උපදිත්. උපේක්ෂා සහගත චිත්තයන්හි කරුණා මුදිතාවෝ නැතහයි ඇතමෙක් කියත්.

78. ප්‍රඥා චෛතසිකය වනාහි දොළොස් ඥානසම්ප්‍රයුක්ත කාමාවචර චිත්තයන්හි හා පන්තිසක් වූ සියලු මහද්ගත ලෝකෝත්තර චිත්තයන්හි දැයි සත්සාළිස් චිත්තයන්හි සම්ප්‍රයෝගයට යේ.

79. එකුන්විස්සක් වූ ධර්මයෝ එකුන්සැටක් වූ චිත්ත-යන්හි උපදිති. තිදෙනෙක් සොළොස් චිත්තයන්හි උපදිති. දෙකක් සිත් විසි අටෙක උපදිති.

80. ප්‍රඥාව සිත් සත්සාළිසක යෙදේයයි ප්‍රකාශිතය. මෙසේ සතර අයුරකින් ශෝභන චෛතසිකයෝ ශෝභන චිත්තයන්හි සම්ප්‍රයුක්තයහ.

81. ඊර්ෂ්‍යා මාත්සර්‍ය්‍ය කෞකෘත්‍ය ද විරතීහු ද කරුණාදීහු ද කිසිකලෙක වෙන් වෙන්ව ද, මානය කිසිකලෙක ද, එසේ ම ථීනමිද්ධ දෙක කිසිකලෙක ද එක්ව ම ද ඒ ඒ සිත්වල යෙදෙන්නාහ.

82. කියන ලද එකොළොස් චෛතසිකයන් අනුව බැලීමෙන් ඉතිරි එක්සාළිස් චෛතසිකයෝ **නියතයෝගීහු** ය. දැන් සුදුසු පරිදි ඒ නියතානියතයෝගී චෛතසික ධර්මයන්ගේ සංග්‍රහය ද කියමි.

83. ලෝකෝත්තර චිත්තයෙහි සතිසක් චෛතසික ධර්මයෝ ලැබෙත්. මහද්ගත චිත්තයෙහි පන්තිසක් ධර්මයෝ ලැබෙත්. කාමාවචර ශෝභනයෙහි අටතිසක් ධර්මයෝ ලැබෙත්.

84. සත්තවීසත්‍ය පුඤ්ඤම්හි - ද්වාදසාහෙතුකෙතිච
යථා සම්භව යොගෙන - පඤ්චධා තත්ථ සංගහො

85. කථං? ලොකුත්තරෙසු තාව අට්ඨසු පඨමජ්ඣානික චිත්තෙසු අඤ්ඤසමානා තෙරසචෙතසිකා අප්පමඤ්ඤා වජ්ජිතා තෙවීසති සොභන චෙතසිකා චෙති ඡත්තිංස ධම්මා සංගහං ගච්ඡන්ති.

86. තථා දුතියජ්ඣානික චිත්තෙසු විතක්ක වජ්ජා.

87. තතියජ්ඣානික චිත්තෙසු විතක්ක විචාර වජ්ජා.

88. චතුත්ථජ්ඣානික චිත්තෙසු විතක්ක විචාර පීති වජ්ජා.

89. පඤ්චමජ්ඣානික චිත්තෙසු උපෙක්ඛා සහගතා තෙ යෙව සංගය්හන්තීති සබ්බථා පි අට්ඨසු ලොකුත්තර චිත්තෙසු පඤ්චකජ්ඣාන වසෙන පඤ්චධාව සංගහො හොතීති.

90. ඡත්තිංස පඤ්චතිංසා ච - චතුත්තිංස යථාක්කමං,
තෙත්තිංස ද්වය මිච්චෙවං - පඤ්චධා නුත්තරෙ ඨිතා

91. මහග්ගතෙසු පන තීසු පඨමජ්ඣානික චිත්තෙසු අඤ්ඤසමානා තෙරස චෙතසිකා විරතිත්තය වජ්ජිතා ද්වාවීසති සොභන චෙතසිකා චෙති පඤ්චතිංස ධම්මා සංගහං ගච්ඡන්ති, කරුණා මුදිතා පනෙත්ථ පච්චෙකමෙව යොජෙතබ්බා.

92. තථා දුතියජ්ඣානික චිත්තෙසු විතක්ක වජ්ජා.

93. තතියජ්ඣානික චිත්තෙසු විතක්ක විචාර වජ්ජා.

94. චතුත්ථජ්ඣානික චිත්තෙසු විතක්ක විචාර පීති වජ්ජා.

84. අකුසල චිත්තයෙහි සත් විස්සක් චෛතසිකයෝ ලැබෙත්. අහේතුක චිත්තයෙහි දොළොසක් චෛතසිකයෝ ලැබෙත්. මෙසේ සුදුසු පරිදි චෛතසිකයන් යෙදීමෙන් එහි චෛතසික සංග්‍රහය පස් ආකාර වන්නේ ය.

85. කෙසේ ද යත්? ලෝකෝත්තර චිත්තයන්හි වනාහි අටක් වූ ප්‍රථම ධ්‍යාන චිත්තයන්හි තෙළෙස් අන්‍ය සමාන චෛතසිකයෝද අප්‍රමාණ්‍ය වර්ජිත තෙවිසි ශෝභන චෛතසිකයෝදැයි සතිස් ධර්ම කෙනෙක් සංග්‍රහයට යෙත්.

86. එසේම ද්විතීයධ්‍යාන චිත්තයන්හි විතර්කය හැර ද,

87. තෘතීයධ්‍යාන චිත්තයන්හි විතර්ක විචාර දෙදෙනා හැර ද,

88. චතුර්ථධ්‍යාන චිත්තයන්හි විතර්ක විචාර ප්‍රීති තුන හැර ද,

89. පඤ්චමධ්‍යාන චිත්තයන්හි උපේක්‍ෂා සහගත වූ ද ඒ ධර්මයෝ සංග්‍රහ කරනු ලැබෙත්. මෙසේ සර්වාකාරයෙන් අට වැදෑරුම් වූ ලෝකෝත්තර චිත්තයන් හි ධ්‍යාන පඤ්චකයාගේ වශයෙන් පඤ්චප්‍රකාරයෙන් චෛතසික සංග්‍රහය වන්නේ ය.

90. ලෝකෝත්තර චිත්තයන්හි චෛතසික සංග්‍රහයෝ පිළිවෙළින් සතිස් දෙනෙක පන්තිස් දෙනෙක සූතිස් දෙනෙක තෙතිස් දෙනෙක බැගින් වූ සංග්‍රහ දෙකෙකැයි මෙසේ පස් ආකාරයකින් සිටියාහු ය.

91. මහද්ගත චිත්තයන් කෙරෙහි වනාහි තිදෙනෙක් වූ ප්‍රථමධ්‍යානික චිත්තයන්හි තෙළෙස් අන්‍ය සමාන චෛතසිකයෝ ද විරති තුනෙන් අන්‍ය වූ දෙවිසි සෝභන චෛතසිකයෝ ද යන පන්තිස් ධර්මයෝ සංග්‍රහයට යෙත්. මෙහි කරුණා මුදිතාවෝ වනාහි වෙන වෙනම යෙදිය යුත්තෝ ය.

92. එසේ ම ද්විතීයධ්‍යාන චිත්තයන්හි විතර්කය හැර ඒ චෛතසිකයෝ ම සංග්‍රහයට යෙත්.

93. තෘතීයධ්‍යාන චිත්තයන්හි විතර්ක විචාර දෙදෙනා හැර ඒ ධර්මයෝ ම සංග්‍රහයට යෙත්.

94. චතුර්ථධ්‍යාන චිත්තයෙහි විතර්ක විචාර ප්‍රිතීන් හැර ඒ ධර්මයෝ ම සංග්‍රහයට යෙත්.

95. පඤ්චමජ්ඣානික චිත්තෙසු පන පන්නරසසු අප්පමඤ්ඤා ච න ලබ්භන්තීති සබ්බථා පි සත්ත වීසති මහග්ගත චිත්තෙසු පඤ්චකජ්ඣාන වසෙන පඤ්චධා ච සංගහො හොතීති.

96. පඤ්චතිංස චතුත්තිංස - තෙත්තිංසච යථාක්කමං,

ද්වත්තිංස චෙවතිංසේති - පඤ්චධාව මහග්ගතෙ.

97. කාමාවචර සොභනෙසු තාව කුසලෙසු පඨමද්වයෙ අඤ්ඤසමානා තෙරස චෙතසිකා පඤ්ච වීසති සොභන චෙතසිකාචෙති අට්ඨතිංස ධම්මා සංගහං ගච්ඡන්ති, අප්පමඤ්ඤා විරතියො පනෙත්ථ පඤ්ච පි පච්චේක මෙ ච යොජෙතබ්බා.

98. තථා දුතියද්වයෙ ඤාණවජ්ජිතා. තතියද්වයෙ ඤාණ සම්පයුත්තා පීති වජ්ජිතා. චතුත්ථද්වයෙ ඤාණපීති වජ්ජිතා තෙ යෙව සංගය්හන්ති.

99. ක්‍රියා චිත්තෙසුපි විරති වජ්ජිතා. තථෙව චතුසුපි දුකෙසු චතුධා සංගහං ගච්ඡන්ති.

100. තථා විපාකෙසු ච අප්පමඤ්ඤ විරති වජ්ජිතා තෙ එව සංගය්හන්ති.

101. සබ්බථාපි චතුවීසති කාමාවචර සොභන චිත්තෙසු දුකවසෙන ද්වාදසධාව සංගහො හොතීති.

102. අට්ඨතිංස සත්තතිංසං - ද්වයං ඡත්තිංසකං සුභෙ

පඤ්ච තිංස චතුත්තිංස - ද්වයං තෙත්තිංසකං ක්‍රියෙ

තෙත්තිංස පාකෙ ද්වත්තිංස- ද්වයෙකත්තිංසකං භවෙ,

සහෙතුකාමාවචර - පුඤ්ඤපාක ක්‍රියාමනෙ.

95. පසළොස් දෙනෙක් වූ පඤ්චමධ්‍යාන චිත්තයන්හි අප්‍රමාණයෝ ද නො ලැබෙත්. මෙසේ සත්විසි මහද්ගත චිත්තයෙහි ධ්‍යාන පඤ්චකයාගේ වශයෙන් පස් ආකාරයකින් සංග්‍රහය වන්නේ ය.

96. මහද්ගත චිත්තයෙහි චෛතසික සංග්‍රහයෝ පිළිවෙළින් පන්තිසෙක, සූතිසෙක, තෙතිසෙක, දෙතිසෙක, තිසෙකැයි පස් ආකාරයකින් වන්නාහුය.

97. කාමාවචර ශෝභනයෙහි වනාහි කුසලයන්හි පළමුවන දෙසිතෙහි තෙළෙස් අන්‍යසමාන චෛතසිකයෝ ය. පස්විසි ශෝභන චෛතසිකයෝය යි අටතිසක් ධර්මයෝ සංග්‍රහයට යෙත්. මෙහි වනාහි පසක් වූ අප්‍රමාණ්‍ය විරතීහු වෙන වෙන ම යෙදිය යුත්තෝ ය.

98. එසේ ම දෙවන දෙසිතෙහි ප්‍රඥා චෛතසිකය හැර ද, තුන්-වන දෙසිතෙහි ඥානසම්ප්‍රයුක්තවැ ප්‍රීතිය හැර ද, සතරවන දෙසිතෙහි ඥාන ප්‍රීති දෙදෙනාම හැර ද, ඒ ධර්මයෝ ම සංග්‍රහ කරනු ලබත්.

99. ක්‍රියා චිත්තයන්හි ද විරතීන් හැර එපරිද්දෙන් ම දුක සතරෙහි සතර ආකාරයෙන් ම චෛතසිකයෝ සංග්‍රහයට යෙත්.

100. විපාක චිත්තයන්හි ද එපරිද්දෙන් ම අප්‍රමාණ්‍ය විරති වර්ජිත වූ ඒ ධර්මයෝ ම සංග්‍රහ කරනු ලැබෙත්.

101. සර්වාකාරයෙන් සූවිසි කාමාවචර ශෝභන චිත්තයන්හි දුක වශයෙන් දොළොස් අයුරකින් ම සංග්‍රහය වේ.

102. සහේතුක කාමාවචර කුශල විපාක ක්‍රියා චිත්තයන් අතුරෙහි කුශලයෙහි ප්‍රථම චිත්තද්වයෙහි අටතිසක් වූ ද ද්විතීය චිත්තද්වයෙහි හා තෘතීය චිත්තද්වයෙහි සත්තිසක් බැගින් වූ ද සතරවන චිත්තද්වයෙහි සතිසක් වූ ද චෛතසිකයෝ සංග්‍රහ වෙති. ක්‍රියා චිත්තයෙහි ඒ ඒ යුගලයෙහි පිළිවෙළින් පන්තිසක් වූ ද සූතිසක් වූ ද නැවතත් සූතිසක් වූ ද තෙතිසක් වූ ද චෛතසිකයෝ සංග්‍රහයට යෙති. විපාකයෙහි ඒ ඒ යුගලයන්හි පිළිවෙළින් තෙතිසක් වූ ද දෙතිසක් වූ ද නැවතත් දෙතිසක් වූ ද එක්තිසක් වූ ද චෛතසිකයෝ සංග්‍රහයට යෙති.

103. න විජ්ජන්තෙත්ථ විරති - ක්‍රියෙසු ච මහග්ගතෙ,

අනුත්තරෙ අප්පමඤ්ඤා - කාමපාකෙ ද්වයං තථා.

104. අනුත්තරෙ ඣාන ධම්මා - අප්පමඤ්ඤා ච මජ්ඣිමෙ,

විරතී ඤාණ පීති ච - පරිත්තේතු විසෙසකා.

105. අකුසලෙසු පන ලොභමූලෙසු තාව පඨමෙ අසංඛාරිකෙ අඤ්ඤසමානා තෙරස චෙතසිකා අකුසල සාධාරණා චත්තාරො චාති සත්තරස ලොභදිට්ඨීහි සද්ධිං එකූනවීසති ධම්මා සංගහං ගච්ඡන්ති.

106. තථෙව දුතියෙ අසංඛාරිකෙ ලොභමානෙන.

107. තතියෙ තථෙව පීති වජ්ජිතා.

ලොභදිට්ඨීහි සහ අට්ඨාරස.

108. චතුත්ථෙ තථෙව ලොභමානෙන.

109. පඤ්චමෙ පන පටිඝසම්පයුත්තෙ අසංඛාරිකෙ දොසො ඉස්සා මච්ඡරියං කුක්කුච්චං චාති චතූහි සද්ධිං පීති වජ්ජිතා තෙ එව වීසති ධම්මා සංගය්හන්ති. ඉස්සා මච්ඡෙර කුක්කුච්චානි පනෙත්ථ පච්චේකමෙව යොජෙතබ්බානි.

110. සසංඛාරික පඤ්චකෙපි තථෙව ථීනමිද්ධෙන විසෙසෙත්වා යොජෙතබ්බා.

111. ඡන්ද පීති වජ්ජිතා පන අඤ්ඤසමානා එකාදස අකුසල සාධාරණා චත්තාරො චාති පන්නරස ධම්මා උද්ධච්ච සහගතෙ සම්පයුජ්ජන්ති.

103. මේ චිත්තයන් අතුරෙහි කාමක්‍රියාවන්හි හා මහද්ගතයෙහි විරතීහු නැතහ. ලෝකෝත්තර චිත්තයෙහි අප්‍රමාණ්‍යයෝ නැතහ. එසේ ම කාමවිපාකයෙහි විරති අප්‍රමාණ්‍ය දෙක ම නැත.

104. ලෝකෝත්තර චිත්තයෙහි ධ්‍යාන ධර්මයෝ ද මහද්ගත චිත්තයෙහි අප්‍රමාණ්‍යයෝ ද කාමාවචර චිත්තයෙහි විරතිඤාන ප්‍රීතීහු ද චෛතසික ගණන වෙනස් කරන්නෝ ය.

105. අකුශල චිත්තයන්හි වනාහි ලෝභමූලයෙහි ප්‍රථම අසංස්කාරිකයෙහි තෙළෙස් අන්‍යසමාන චෛතසිකයෝ ද අකුශල සාධාරණ චෛතසික සතර ද යන මේ සතළොස් ලෝභ දෘෂ්ටීන් සමග එකුන් විස්සක් ව සංග්‍රහයට යෙති.

106. එසේ ම ද්විතීය අසංස්කාරිකයෙහි ලෝභය හා මානය සමඟ එකුන් විස්සක් ධර්මයෝ සංග්‍රහයට යෙති.

107. තෘතීය අසංස්කාරිකයෙහි එසේ ම ප්‍රීතිය හැර ලෝභ දෘෂ්ටීන් සමඟ අටළොස් ධර්ම කෙනෙක් සංග්‍රහයට යෙත්.

108. සතරවන අසංස්කාරිකයෙහි එසේ ම ලෝභය හා මානය සමඟ අටළොස් ධර්ම කෙනෙක් සංග්‍රහයට යෙති.

109. පස් වන ප්‍රතිඝසම්ප්‍රයුක්ත අසංස්කාරිකයෙහි ද්වේෂය ඊර්ෂ්‍යාව මාත්සර්ය්‍ය කෞකෘත්‍යය යන මේ සතර සමඟ ප්‍රීති වර්ජිත වූ ඒ විසිදෙනෙක් වූ ධර්මයෝ සංග්‍රහ කරනු ලැබෙත්. මෙහි ඊර්ෂ්‍යා මාත්සර්ය්‍ය කෞකෘත්‍යයෝ වනාහි වෙන වෙන ම යෙදිය යුත්තාහු ය.

110. සසංකාරික පඤ්චකයෙහි ද එසේ ම ථීන මිද්ධයන්ගෙන් වෙසෙසා චෛතසික යෙදීම කළ යුතු.

111. ඡන්ද ප්‍රීති වර්ජිත අන්‍යසමාන එකොළොසය අකුශල සාධාරණ සතරය යන පසළොස් දෙනෙක් වූ ධර්මයෝ ඖද්ධත්‍ය සහගත චිත්තයෙහි යෙදෙත්.

112. විචිකිච්ඡා සහගත චිත්තෙව අධිමොක්ඛ විරහිතා විචිකිච්ඡා සහගතා තථෙව පන්නරස ධම්මා සමුපලබ්භන්තීති සබ්බථාපි ද්වාදසාකුසල චිත්තුප්පාදෙසු පච්චෙකං යොජියමානා පි ගණන වසෙන සත්තධාව සංගහිතා භවන්තීති.

113. එකූනවීසට්ඨාරස - වීසෙක වීස වීසති,

ද්වාවීස පණ්ණරසෙති - සත්තධා කුසලෙ ඨිතා.

114. සාධාරණා ච චත්තාරො - සමානා ච දසාපරෙ

චුද්දසෙතෙ පවුච්චන්ති - සබ්බාකුසලයොගිනො.

115. අහෙතුකෙසු පන හසනචිත්තෙ තාව ඡන්ද වජ්ජිතා අඤ්ඤසමානා ද්වාදස ධම්මා සංගහං ගච්ඡන්ති.

116. තථා වොත්ථපනෙ ඡන්ද පීති වජ්ජිතා.

117. සුඛසන්තීරණෙ ඡන්ද විරිය වජ්ජිතා.

118. මනොධාතුත්තිකාහෙතුක පටිසන්ධි යුගලෙ ඡන්ද පීති විරිය වජ්ජිතා.

119. ද්විපඤ්ච විඤ්ඤාණෙ පකිණ්ණක වජ්ජිතා තෙ යෙව සංගය්හන්තීති සබ්බථාපි අට්ඨාරසසු අහෙතුකෙසු ගණන වසෙන චතුධාව සංගහො හොතීති.

120. ද්වාදසෙකාදස දස - සත්ත චාති චතුබ්බිධො,

අට්ඨාරසාහෙතුකෙසු - චිත්තුප්පාදෙසු සංගහො.

112. විචිකිත්සා සහගත චිත්තයන්හි ද අධිමෝක්ෂ විරහිත වූ විචිකිත්සා සහගත වූ එසේ ම පසළොස් ධර්ම කෙනෙක් ලැබෙත්. මෙසේ සර්වාකාරයෙන් දොළොස් අකුශල චිත්තයන්හි වෙන වෙන ම චෛතසිකයෝ යොදනු ලබන්නාහු ද, ගණන වශයෙන් සත් ආකාරයකින් සංග්‍රහ කරන ලද්දාහු වෙත්.

113. අකුශල චිත්තයෙහි චෛතසික සංග්‍රහයෝ එකුන් විස්සෙක, අටොළොසෙක, විස්සෙක, එක් විස්සෙක, විස්සෙක. දෙවිස්සෙක, පසළොසකැයි සත් අයුරකින් සිටියාහු ය.

114. අකුශල සාධාරණ සතර ද ඡන්ද ප්‍රීති අධිමෝක්ෂයන්ගෙන් අන්‍ය වූ අන්‍යසමාන චෛතසික දසය ද යන මේ තුදුස සියලු අකුශල චිත්තයෙහි යෙදෙන්නෝය යි කියනු ලැබෙත්.

115. අහේතුක චිත්තයන් කෙරෙහි වනාහි හසන චිත්ත-යෙහි ඡන්ද වර්ජිත වූ අන්‍යසමාන නම් වූ දොළොස් ධර්මයෝ සංග්‍රහයට යෙති.

116. එසේ ම ව්‍යවස්ථාපන චිත්තයෙහි ඡන්ද ප්‍රීති වර්ජිත වූ එකොළොස් ධර්ම කෙනෙක් සංග්‍රහයට යෙත්.

117. සුඛසන්තීරණයෙහි ඡන්ද වීර්ය්‍ය වර්ජිත වූ එකොළොස් ධර්මකෙනෙක් සංග්‍රහයට යෙත්.

118. මනෝධාතුත්‍රිකයෙහි හා අහේතුක ප්‍රතිසන්ධි දෙක්හි ඡන්ද ප්‍රීති වීර්ය්‍ය වර්ජිත වූ අන්‍යසමානයෝ සංග්‍රහයට යෙත්.

119. ද්විපඤ්ච විඥානයෙහි ප්‍රකීර්ණක වර්ජිත වූ ඒ ධර්මයෝ ම සංග්‍රහ කරනු ලැබෙත්. මෙසේ අටොළොස් අහේතුක චිත්තයන්හි ගණන වශයෙන් සතර අයුරකින් ම සංග්‍රහය වේ.

120. දොළොසෙක, එකොළොසෙක, දසයෙක, සතෙකැයි අටොළොස් අහේතුක චිත්තෝත්පාදයන්හි සංග්‍රහය චතුර්විධ වේ.

121. අහෙතුකෙසු සබ්බත්ථ - සත්ත සෙසා යථාරහං,
ඉති විත්ථාරතො වුත්තො - තෙත්තිංස විධ සංගහො.

122. ඉත්ථං චිත්තාවියුත්තානං - සම්පයොගඤ්ච සංගහං
ඤත්වාභෙදං යථායොගං - චිත්තෙන සමමුද්දිසෙ.

ඉති අභිධම්මත්ථ සංගහෙ චෙතසික සංගහ විභාගො නාම
දුතියො පරිච්ජෙදො.

121. චෛතසිකයෝ සත්දෙනෙක් සියලු අහේතුකයෙහි ම වෙති. සෙස්සෝ සුදුසු පරිදි යෙදෙති. මෙසේ විස්තර වශයෙන් තෙතිස් වැදෑරුම් සංග්‍රහය කියන ලදී.

122. මේ ක්‍රමයෙන් චෛතසිකයන්ගේ සම්ප්‍රයෝගය හා සංග්‍රහය දැන යෙදෙන යෙදෙන පරිද්දෙන් චිත්තය හා සම වූ චෛතසික භේදය කියන්නේ ය.

මෙය අභිධර්මාර්ථ සංග්‍රහයෙහි චෛතසික සංග්‍රහ
විභාගය නම් වූ ද්විතීය පරිච්ඡේදයයි.

# තතියො පරිච්ඡේදෙ

123. සම්පයුත්තා යථායොගං - තෙපඤ්ඤාස සභාවතො
චිත්තචෙතසිකා ධම්මා - තෙසං දානි යථාරහං

124. වෙදනා හේතුතො කිච්ච - ද්වාරාලම්බන වත්ථුතො,
චිත්තුප්පාද වසෙනෙව - සංගහො නාම නීයතෙ.

125. තත්ථ වෙදනා සංගහෙ තාව තිවිධා වේදනා සුඛං දුක්ඛං අදුක්ඛමසුඛං චෙති. සුඛං දුක්ඛං සොමනස්සං දොමනස්සං උපෙක්ඛාති ච භෙදෙන පන පඤ්චධා හොති.

126. තත්ථ සුඛ සහගතං කුසල විපාකං කාය විඤ්ඤාණමෙකමෙව.

127. තථා දුක්ඛසහගතං අකුසල විපාකං කාය විඤ්ඤාණං.

128. සොමනස්ස සහගත චිත්තානි පන ලොභමූලානි චත්තාරි ද්වාදස කාමාවචර සොභනානි සුඛ සන්තීරණ හසනානි ච ද්වෙති අට්ඨාරස කාමාවචර චිත්තානි චෙව පඨම දුතිය තතිය චතුත්ථජ්ඣාන සංඛාතානි චතුචත්තාළීස මහග්ගත ලොකුත්තර චිත්තානි චෙති ද්වාසට්ඨි විධානි භවන්ති.

129. දොමනස්ස සහගත චිත්තානි පන ද්වෙ පටිඝ සම්පයුත්ත චිත්තානෙව.

130. සෙසානි සබ්බානිපි පඤ්ච පඤ්ඤස උපෙක්ඛා සහගත චිත්තානෙව.

131. සුඛං දුක්ඛමුපෙක්ඛාති - තිවිධා තත්ථ වෙදනා,
සොමනස්සං දොමනස්ස - මිති භෙදෙන පඤ්චධා.

# තෘතීය පරිච්ජේදය

123-124. යෙදෙන යෙදෙන පරිද්දෙන් සම්ප්‍රයුක්ත වූ චිත්ත චෛතසික ධර්මයෝ ස්වභාව ධර්ම වශයෙන් තෙපනසෙක් වෙති. දැන් සුදුසු පරිද්දෙන් ඔවුන්ගේ වේදනා විභාග වශයෙන් ද හේතු විභාග වශයෙන් ද කෘත්‍ය විභාග වශයෙන් ද ද්වාර විභාග වශයෙන් ද ආරම්මණ විභාග වශයෙන් ද වස්තු විභාග වශයෙන් ද ප්‍රකීර්ණක සංග්‍රහය චිත්තෝත්පාදයන්ගේ වශයෙන් ම ගෙන හැර දක්වනු ලැබේ.

125. ඒ සංග්‍රහයන් අතුරෙන් වේදනා සංග්‍රහයෙහි වනාහි වේදනාව සුඛවේදනාවය දුක්ඛවේදනාවය අදුක්ඛමසුඛ වේදනාවය යි ත්‍රිවිධ වන්නී ය. සුඛ වේදනාවය දුක්ඛ වේදනාවය සොමනස්ස වේදනාවය දෝමනස්ස වේදනාවය උපේක්ඛා වේදනාවය යන භේදයෙන් පස් ආකාර ද වන්නේ ය.

126. එහි සුඛසහගතය එකක් වූ කුශල විපාක කාය විඤ්ඤාණය ම ය.

127. එසේ ම දුක්ඛසහගතය අකුශල විපාක කාය විඥානය ය.

128. සෝමනස්ස සහගත චිත්තයේ වනාහි ලෝභමූල වූ සතර ද සොළොස් කාමාවචර ශෝභනයෝ ද සුඛසන්තීරණ හසනයෝ දෙදෙන ද යන අටොළොසක් වූ කාමාවචර චිත්තයෝ ද ප්‍රථම ද්විතීය තෘතීය චතුර්ථ ධ්‍යාන සංඛ්‍යාත වූ සිවුසාළිස් මහද්ගත ලෝකෝත්තර චිත්තයෝදැයි දෙසැට වැදෑරුම් වෙත්.

129. දෝමනස්ස සහගත චිත්තයෝ නම් දෙදෙනෙක් වූ ප්‍රතිඝසම්ප්‍රයුක්ත චිත්තයෝ ම ය.

130. සෙසු සියලු පස්පනස උපේක්ෂා සහගත චිත්ත-යෝ ම ය.

131. ඒ වේදනා සංග්‍රහයෙහි සුඛවේදනාය දුඃඛවේදනාය උපේක්ෂා වේදනාය කියා වේදනාව ත්‍රිවිධ වන්නී ය. සෞර්මනස්‍ය වේදනාය දෞර්මනස්‍ය වේදනාය යන භේදයෙන් පඤ්චප්‍රකාර ය.

132. සුඛමෙකත්ථ දුක්ඛඤ්ච - දොමනස්සං ද්වයෙ ඨිතං,
ද්වාසට්ඨිසු සොමනස්සං - පඤ්ච පඤ්ඤසකෙ තරා,

133. හෙතුසංගහෙ හේතුයො නාම ලොභො දොසො මොහො, අලොභො අදොසො අමොහො චාති ඡබ්බිධා භවන්ති.

134. තත්ථ පඤ්චද්වාරාවජ්ජන ද්විපඤ්ච විඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ වොත්ථපන හසන වසෙන අට්ඨාරස අහේතුක චිත්තානි නාම.

135. සෙසානි සබ්බානිපි එකසත්තති චිත්තානි සහෙතුකානෙව.

136. තත්ථාපි ද්වෙ මොමූහ චිත්තානි එකහෙතුකානි.

137. සෙසානි දස අකුසල චිත්තානි චෙව ඤාණවිප්පයුත්තානි ද්වාදස කාමාවචර සොභනානි චෙති ද්වාවීසති දුහේතුක චිත්තානි.

138. ද්වාදස ඤාණසම්පයුත්ත කාමාවචර සොභනානි චෙව පඤ්චතිංස මහග්ගත ලොකුත්තර චිත්තානි චෙති සත්ත-චත්තාළීස තිහේතුක චිත්තානීති.

139. ලොභො දොසො ච මොහො ච - හෙතු අකුසලා තයො,
අලොභා දොසා මොහා ච - කුසලාබ්‍යාකතා තථා,
අහෙතුකට්ඨාරසෙක - හෙතුකා ද්වෙ දුවීසති,
දුහෙතුකා මතා සත්ත - චත්තාළීස තිහේතුකා.

140. කිච්චසංගහෙ කිච්චානි නාම පටිසන්ධි භවංගාවජ්ජන දස්සන සවන ඝායන සායන ඵුසන සම්පටිච්ඡන සන්තීරණ වොත්ථපන ජවන තදාලම්බන චුති වසෙන චුද්දස විධානි භවන්ති.

132. සුඛය එක් සිතක ද දුඃඛය එක් සිතක ද දෞර්මනස්‍යය දෙසිතක ද සෞර්මනස්‍යය සිත් දෙසැටක ද උපේක්‍ෂාව සිත් පස්පනසක ද සිටියේ ය.

133. හේතුසංග්‍රහයෙහි හේතුහු නම් ලෝභය ද්වේෂය, මෝහය, අලෝභය, අද්වේෂය, අමෝහයයි සවැදෑරුම් වෙති.

134. එහි පඤ්චද්වාරාවර්ජනය, ද්විපඤ්ච විඥානය, සම්පටිච්ඡන දෙකය, සන්තීරණ තුනය, ව්‍යවස්ථාපනය, හසන චිත්තය යන මොවුන්ගේ වශයෙන් අටොළොස් දෙනෙක් වූ චිත්තයෝ අහේතුක චිත්තයෝ නම් වෙති.

135. සෙසු සියලු වූ ද එක්සැත්තෑ චිත්තයෝ සහේතුක-යෝ ම ය.

136. එහි ද දෙදෙනෙක් වූ මෝමූහ චිත්තයෝ ඒක හේතුකයෝ ය.

137. ඉතිරි දශ අකුශල චිත්තයෝ ද ඥනවිප්‍රයුක්ත වූ දොළොස් කාමාවචර සෝභනයෝදැයි දෙවිස්සක් වූ චිත්තයෝ ද්විහේතුකයෝ ය.

138. දොළොස් ඥනසම්ප්‍රයුක්ත කාමාවචර ශෝභනයෝ ද පන්තිස් මහද්ගත ලෝකෝත්තරයෝ ද යන සත්සාළිස ත්‍රිහේතුක චිත්තයෝ ය.

139. ලෝභය, ද්වේෂය, මෝහයයි අකුශල හේතු තිදෙනෙකි. අලෝභය, අද්වේෂය, අමෝහය කියා කුසලාව්‍යාකෘත හේතුහු ද එසේ ම තිදෙනෙකි. අහේතුක සිත් අටොළොස් දෙනෙකි. ඒක හේතුක සිත් දෙකෙකි. ද්විහේතුක සිත් දෙවිසි දෙනෙකි. ත්‍රිහේතුක සිත් සත් සාළිස් දෙනෙකි.

140. කෘත්‍යසංග්‍රහයෙහි කෘත්‍යයෝ නම් ප්‍රතිසන්ධිය භවාංගය ආවර්ජනය දර්ශනය ශ්‍රවණය ආඝ්‍රාණය ආස්වාදනය ස්පර්ශය සම්ප්‍රතෝෂණය සන්තීරණය ව්‍යවස්ථාපනය ජවනය තදාලම්බනය ච්‍යුතිය යන මොවුන්ගේ වශයෙන් තුදුස් වැදෑරුම් වන්නේ ය.

141. පටිසන්ධි භවංගාවජ්ජන පඤ්චවිඤ්ඤාණ ඨානාදි වසෙන පන තෙසං දසධා ඨානභෙදො වෙදිතබ්බො.

142. තත්ථ ද්වෙ උපෙක්ඛා සහගත සන්තීරණානි චෙව අට්ඨමහා විපාකානි ච නව රූපාරූප විපාකානි චෙති එකූනවීසති පටිසන්ධි භවංග චුති කිච්චානි නාම.

143. ආවජ්ජන කිච්චානි පන ද්වේ.

144. තථා දස්සන සවන ඝායන සායන ඵුසන සම්පටිච්ඡන කිච්චානි ච.

145. තීණි සන්තීරණ කිච්චානි.

146. මනොද්වාරාවජ්ජන මෙව පඤ්චද්වාරෙ වොත්ථපන කිච්චං සාධෙති.

147. ආවජ්ජනද්වය වජ්ජිතානි කුසලාකුසල ඵල ක්‍රියා චිත්තානි පඤ්චපඤ්ඤාස ජවන කිච්චානි.

148. අට්ඨ මහාවිපාකානි සන්තීරණත්තයඤ්චෙති එකාදස තදාරම්මණ කිච්චානි.

149. තෙසු පන ද්වෙ උපෙක්ඛා සහගත සන්තීරණ චිත්තානි පටිසන්ධි භවංග චුති තදාරම්මණ සන්තීරණ වසෙන පඤ්ච කිච්චානි නාම.

150. මහාවිපාකානි අට්ඨ පටිසන්ධි භවංග චුති තදාරම්මණ වසෙන චතුකිච්චානි.

151. මහග්ගත විපාකානි නව පටිසන්ධි භවංග චුති වසෙන තිකිච්චානි.

141. ප්‍රතිසන්ධි භවංගාවර්ජන පඤ්චවිඥානස්ථානාදීන්ගේ වශයෙන් වනාහි ඔවුන්ගේ ස්ථානභේදය දසාකාරයෙන් දත යුත්තේ ය.

142. එහි උපේක්ෂා සහගත සන්තීරණයෝ දෙදෙනය, අෂ්ට මහාවිපාකයෝය, නව රූපාරූප විපාකයෝය යන සිත් එකුන් විස්ස ප්‍රතිසන්ධි භවංග ච්‍යුති කෘත්‍යයන් ඇත්තාහු නම් වෙති.

143. ආවර්ජන කෘත්‍යය ඇති සිත් වනාහි දෙකෙකි.

144. දර්ශන ශ්‍රවණ ආඝ්‍රාණ ආස්වාදන ස්පර්ශන සම්ප්‍ර-තොෂණ කෘත්‍යයන් ඇත්තා වූ චිත්තයෝ ද එසේ දෙක බැගින් වෙති.

145. සන්තීරණ කෘත්‍යය ඇති සිත් තුනෙකි.

146. මනෝද්වාරාවර්ජනය ම පඤ්චද්වාරයෙහි ව්‍යවස්ථාපන කෘත්‍යය සිද්ධකරයි.

147. ආවර්ජනද්වය වර්ජිත වූ කුශලාකුශල ඵල ක්‍රියා චිත්තයෝ පස්පනස ජවනකෘත්‍යය ඇති චිත්තයෝ ය.

148. අටක් වූ මහාවිපාකයෝ ය සන්තීරණ තුනය යන එකොළොස තදාරම්මණ කෘත්‍යය ඇති චිත්තයෝ ය.

149. ඔවුන් අතුරෙන් දෙදෙනෙක් වූ උපේක්ෂා සහගත සන්තීරණ චිත්තයෝ ප්‍රතිසන්ධි භවංග ච්‍යුති තදාරම්මණ සන්තීරණයන්ගේ වශයෙන් කෘත්‍ය පසක් ඇත්තා වූ චිත්තයෝ ය.

150. මහාවිපාකයෝ අටදෙන ප්‍රතිසන්ධි භවංග ච්‍යුති තදාරම්මණ වශයෙන් සිවුකිසක් ඇත්තා වූ චිත්තයෝ ය.

151. මහද්ගත විපාක නවය ප්‍රතිසන්ධි භවංග ච්‍යුති වශයෙන් කෘත්‍යත්‍රයක් ඇති චිත්තයෝ ය.

152. සොමනස්ස සහගතං සන්තීරණං සන්තීරණ තදාරම්මණ වසෙන දුකිච්චං.

153. තථා වොත්ථපනඤ්ච වොත්ථපනාවජ්ජන වසෙන.

154. සෙසානි පන සබ්බානි පි ජවන මනොධාතුත්තික ද්විපඤ්ච විඤ්ඤාණානි යථා සම්භව මෙක කිච්චානීති.

155. පටිසන්ධාදයො නාම - කිච්චභෙදෙන චුද්දස,

දසධා ඨානභෙදෙන - චිත්තුප්පාදා පකාසිතා.

156. අට්ඨසට්ඨි තථාද්වෙ ච - නවාට්ඨද්වෙ යථාක්කමං,

එක ද්වි ති චතු පඤ්ච - කිච්චට්ඨානානි නිද්දිසෙ.

157. ද්වාරසංගහෙ ද්වාරානි නාම චක්ඛුද්වාරං සොතද්වාරං ඝාණද්වාරං ජිව්හාද්වාරං කායද්වාරං මනොද්වාරං චෙති ඡබ්බිධානි භවන්ති.

158. තත්ථ චක්ඛුමෙව චක්ඛුද්වාරං.

159. තථා සොතාදයො සොතද්වාරාදීනි.

160. මනොද්වාරං පන භවංගන්ති පවුච්චති.

161. තත්ථ පඤ්චද්වාරාවජ්ජන චක්ඛුවිඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ වොත්ථපන කාමාවචර ජවන තදාලම්බන වසෙන ඡචත්තාළීස චිත්තානි චක්ඛුද්වාරෙ යථාරහං උප්පජ්ජන්ති.

162. තථා පඤ්චද්වාරාවජ්ජන සොතවිඤ්ඤාණාදි වසෙන සොතද්වාරාදීසුපි ඡචත්තාළීසෙව භවන්ති. සබ්බථාපි පඤ්චද්වාරෙ චතුපඤ්ඤාස චිත්තානි කාමාවචරානෙවාති වෙදිතබ්බානි.

152. සෝමනස්ස සන්තීරණය සන්තීරණ තදාරම්මණ වශයෙන් දෙකිසක් ඇත්තේ ය.

153. එසේ ම ව්‍යවස්ථාපනය ව්‍යවස්ථාපන ආවර්ජන වශයෙන් දෙකිසක් ඇත්තේ ය.

154. ඉතිරි සියලු ජවන මනෝධාතුත්‍රික ද්විපඤ්ච විඥනයෝ සුදුසු පරිදි එක් කිස බැගින් ඇත්තෝ ය.

155. ප්‍රතිසන්ධ්‍යාදි චිත්තෝත්පාදයෝ ප්‍රතිසන්ධ්‍යාදි නාම භේදයෙන් හා කෘත්‍යභේදයෙන් තුදුස් දෙනෙක් වන්නාහ. ප්‍රතිසන්ධ්‍යාදි ස්ථාන භේදයෙන් දශප්‍රකාර යයි ප්‍රකාශිතයහ.

156. එක දෙක තුන හතර පස බැගින් වූ කෘත්‍ය ස්ථාන ඇත්තා වූ චිත්තයෝ පිළිවෙළින් සැටඅට දෙනෙක් ද දෙදෙනෙක් ද නවදෙනෙක් ද අටදෙනෙක් ද දෙදෙනෙක් ද වන්නාහයි දක්වන්නේ ය.

157. ද්වාරසංග්‍රහයෙහි ද්වාරයෝ නම් චක්ෂුර්ද්වාරය, ශෝත්‍රද්වාරය, ඝ්‍රාණද්වාරය, ජිව්හාද්වාරය, කායද්වාරය, මනෝද්වාරයයි සවැදෑරුම් වන්නාහ.

158. ඒ ද්වාරයන් අතුරෙන් ප්‍රසාදචක්ෂුස ම චක්ෂුර්ද්වාර නම් වේ.

159. එසේ ම ශ්‍රෝත්‍රප්‍රසාදාදීහු ශ්‍රෝත්‍රද්වාරාදීහු නම් වෙති.

160. මනෝද්වාරය වනාහි භවංගයයි කියනු ලැබේ.

161. ඒ ද්වාරයන් අතුරෙන් පඤ්චද්වාරාවර්ජනය චක්ෂුර්විඥනය සම්ප්‍රතෝෂණය සන්තීරණය ව්‍යවස්ථාපනය කාමාවචර ජවනය තදාලම්බනය යන මොවුන්ගේ වශයෙන් සසාළිසක් චිත්තයෝ චක්ෂුර්ද්වාරයෙහි සුදුසු පරිදි උපදිති.

162. එසේ ම පඤ්චද්වාරාවර්ජන ශ්‍රෝත්‍රවිඥනාදි වශයෙන් ශ්‍රෝත්‍රද්වාරාදීන්හි ද සසාළිස බැගින් ම චිත්යෝ වෙති. සර්ව ප්‍රකාර-යෙන් පඤ්චද්වාරයෙහි සිවු පනස් චිත්තයෝ කාමාවචරයෝ ම ය.

163. මනොද්වාරෙ පන මනොද්වාරාවජ්ජන පඤ්ච පඤ්ඤාස ජවන තදාලම්බන වසෙන සත්ත සට්ඨි චිත්තානි භවන්ති.

164. එකූනවීසති පටිසන්ධි භවංග චුති වසෙන ද්වාර විමුත්තානි.

165. තෙසු පන ද්විපඤ්ච විඤ්ඤාණානි චෙව මහග්ගත ලොකුත්තර ජවනානි චෙති ඡත්තිංස යථාරහමෙකද්වාරික චිත්තානි නාම.

166. මනොධාතුත්තිකං පන පඤ්චද්වාරිකං.

167. සුඛසන්තීරණ වොත්ථපන කාමාවචර ජවනානි ඡද්වාරික චිත්තානි.

168. උපෙක්ඛා සහගත සන්තීරණ මහාවිපාකානි ඡද්වාරිකානි චෙව ද්වාර විමුත්තානි ච.

169. මහග්ගත විපාකානි ද්වාරවිමුත්තානෙවාති.

170. එකද්වාරික චිත්තානි - පඤ්ච ඡද්වාරිකානි ච,
ඡද්වාරික විමුත්තානි - විමුත්තානි ච සබ්බථා.

171. ඡත්තිංසති තථා තීණි - එකතිංස යථාක්කමං
දසධා නවධා චෙති - පඤ්චධා පරිදීපයෙ.

172. ආරම්මණ සංගහෙ ආරම්මණානි නාම රූපාරම්මණං සද්දාරම්මණං ගන්ධාරම්මණං රසාරම්මණං ඵොට්ඨබ්බාරම්මණං ධම්මාරම්මණඤ්චෙති ඡබ්බිධානි භවන්ති.

173. තත්ථ රූපමෙව රූපාරම්මණං.

174. තථා සද්දාදයො සද්දාරම්මණාදීනි.

163. මනෝද්වාරයෙහි වනාහි මනෝද්වාරාවර්ජනය පස්පනස් ජවනය තදාලම්බනය යන මොවුන්ගේ වශයෙන් සත්සැටක් චිත්තයෝ වෙති.

164. ප්‍රතිසන්ධි භවංග ච්‍යුතීන්ගේ වශයෙන් එකුන් විස්සක් චිත්තයෝ ද්වාරවිමුක්තයෝ ය.

165. ඔවුන් අතුරෙහි ද්විපඤ්ච විඥානයන් හා මහද්ගත ලෝකෝත්තර ජවනයෝ ද යන මේ සතිස සුදුසු පරිදි එක් ද්වාරයක ම උපදනා චිත්තයෝ ය.

166. මනෝධාතුත්‍රිකය පඤ්චද්වාරික ය.

167. සුඛසන්තීරණය ව්‍යවස්ථාපනය කාමාවචර ජවනයෝය යන මොහු සදොරෙහි උපදින්නෝ ය.

168. උපේක්ෂා සහගත සන්තීරණ මහාවිපාකයෝ සදොරෙහි ම උපදනාහු ද ද්වාරයන්ගෙන් මිදුණාහු ද වෙත්.

169. මහද්ගත විපාකයෝ සැම කල්හි ම ද්වාර මුක්ත-යෝ ය.

170. එක ම ද්වාරයක උපදනා චිත්තයෝ ද ද්වාර පසක හා සයක උපදනා චිත්තයෝ ද ෂට්ද්වාරයෙහි ම නූපදනා චිත්තයෝ ද සර්වාකාරයෙන් ෂට්ද්වාරයෙන් මිදුණා වූ චිත්තයෝ ද -

171. පිළිවෙළින් සතිස් දෙනෙක් ද තිදෙනෙක් ද එක්තිස් දෙනෙක් ද දහවැදෑරුම් ද නව වැදෑරුම් ද වේයයි පස් ආකාරයකින් දක්වන්නේ ය.

172. ආරම්මණ සංග්‍රහයෙහි ආරම්මණයෝ රූපාරම්මණය ශබ්දරම්මණය ගන්ධාරම්මණය රසාරම්මණය ස්ප්‍රෂ්ටව්‍යාරම්මණය ධර්මාරම්මණයයි සවැදෑරුම් වෙති.

173. ඒ අරමුණු අතුරෙන් වර්ණය ම රූපාරම්මණය යි.

174. එසේ ම ශබ්දාදීහු ශබ්දාදි ආරම්මණයෝය.

175. ධම්මාරම්මණං පන පසාද සුඛුමරූප චිත්ත චෙතසික නිබ්බාන පඤ්ඤත්ති වසෙන ඡධා සංගය්හන්ති.

176. තත්ථ චක්ඛුද්වාරික චිත්තානං සබ්බෙසම්පි රූපමෙව ආරම්මණං, තඤ්ච පච්චුප්පන්න මෙව.

177. තථා සොතද්වාරික චිත්තාදීනම්පි සද්දාදීනි, තානි ච පච්චුප්-පන්නානෙව.

178. මනොද්වාරික චිත්තානං පන ඡබ්බිධම්පි පච්චුප්පන්න මතීතං අනාගතං කාලවිමුත්තඤ්ච යථාරහමාරම්මණං හොති.

179. ද්වාරවිමුත්තානඤ්ච පන පටිසන්ධි භවංග චුති සංඛාතානං ඡබ්බිධම්පි යථාසම්භවං යෙභුය්‍යෙන භවන්තරෙ ඡද්වාරගහිතං පච්චුප්පන්න මතීතං පඤ්ඤත්තිභූතං වා කම්ම කම්මනිමිත්ත ගති නිමිත්ත සම්මතං ආරම්මණං හොති.

180. තෙසු චක්ඛු විඤ්ඤාණාදීනි යථාක්කමං රූපාදි එකෙකා-රම්මණානෙව.

181. මනොධාතුත්තිකං පන රූපාදි පඤ්චාරම්මණං.

182. සෙසානි කාමාවචර විපාකානි හසන චිත්තං චෙති සබ්බථාපි කාමාවචරාරම්මණානෙව.

183. අකුසලානි චෙව ඤාණවිප්පයුත්ත කාමාවචර ජවනානි චෙති ලොකුත්තර වජ්ජිත සබ්බාරම්මණානි.

184. ඤාණසම්පයුත්ත කාමාවචර කුසලානි චෙව පඤ්චමජ්ඣාන සංඛාතං අභිඤ්ඤා කුසලඤ්චෙති අරහත්තමග්ගඵල වජ්ජිත සබ්බාරම්මණානි.

175. ධර්මාරම්මණය වනාහි ප්‍රසාදරූපය සූක්ෂම රූපය චිත්තය චෛතසිකය නිර්වාණය ප්‍රඥප්තිය යන මොවුන්ගේ වශයෙන් සයාකාරයකින් සංග්‍රහ කරනු ලැබේ.

176. ඒ ආරම්මණ සංග්‍රහයෙහි සියලු ම චක්ෂුර්ද්වාරයෙහි උපදනා චිත්තයන්ගේ ආරම්මණය රූපාරම්මණය ය. එද වර්තමාන රූපය ම ය.

177. එසේ ම ශ්‍රෝත්‍රද්වාරයෙහි උපදනා චිත්තයන් ගේ අරමුණු ද ශබ්දදීහු ය. ඔවුහු ද වර්තමානයෝ ම ය.

178. වර්තමාන වූ ද අතීතවූ ද අනාගත වූ ද කාලත්‍රයට අයත් නො වූ ද සවැදෑරුම් වූ ම ආරම්මණය සුදුසු පරිද්දෙන් මනෝද්වාරික චිත්තයන්ගේ ආරම්මණය වන්නේ ය.

179. ප්‍රතිසන්ධි භවංග ච්‍යුති සංඛ්‍යාත ද්වාර විමුක්ත චිත්තයන් හට බොහෝ සෙයින් අනතුරු භවයෙහි ෂට්ද්වාරයෙන් ගන්නා ලද වර්තමාන වූ හෝ අතීත වූ හෝ ප්‍රඥප්ති වූ හෝ කර්ම කර්මනිමිත්ත ගති නිමිත්ත සම්මත වූ සැවැදෑරුම් ආරම්මණය ම සුදුසු පරිදි අරමුණු වේ.

180. ඔවුන් අතුරෙන් චක්ෂුර්විඥනාදීහු පිළිවෙළින් රූපාදි එක් එක් අරමුණක් ඇත්තෝ ය.

181. මනෝධාතුත්‍රිකය වනාහි රූපාදි පස ම අරමුණු කරන්නේ ය.

182. ඉතිරි කාමාවචර විපාකයෝ ද හසන චිත්තය ද යන මොහු සර්වාකාරයෙන් කාමාවචර ධර්මයන් ම අරමුණු කරන්නෝ ය.

183. අකුශලයෝ ද ඥනවිප්‍රයුක්ත කාමාවචර ජවනයෝ ද යන මොවුහු ලෝකෝත්තර ධර්මයන් හැර ඉතිරි සියල්ල අරමුණු කරන්නෝ ය.

184. ඥන සම්ප්‍රයුක්ත කාමාවචර කුශලයෝ ද පඤ්චමද්ධ්‍යාන සංඛ්‍යාත අභිඥකුශලය ද යන මොහු අර්හත් මාර්ගය හා අර්හත්ඵලය හැර ඉතිරි සියල්ල අරමුණු කරන්නෝ ය.

185. ඤාණසම්පයුත්ත කාමාවචර ක්‍රියානි චෙව ක්‍රියාභිඤ්ඤා-වොත්ථපනං චෙති සබ්බථාපි සබ්බාලම්බනානි.

186. ආරුප්පෙසු දුතිය චතුත්ථානි මහග්ගතාරම්මණානි.

187. සෙසානි මග්ගත චිත්තානි පන සබ්බානිපි පඤ්ඤත්තාරම්මණානි.

188. ලොකුත්තර චිත්තානි නිබ්බාණාරම්මණානීති.

189. පඤ්චවීස පරිත්තම්හි - ඡ චිත්තානි මහග්ගතෙ,
එකවීසති වොහාරෙ - අට්ඨ නිබ්බාන ගොචරෙ.

190. වීසා නුත්තර මුත්තම්හි - අග්ගමග්ග ඵලුජ්ඣිතෙ,
පඤ්ච සබ්බත්ථ ඡච්චෙති - සත්තධා තත්ථ සංගහෙ.

191. වත්ථුසංගහෙ වත්ථූනි නාම චක්ඛු සොත ඝාණ
ජිව්හා කාය හදය වත්ථූ චෙති ඡබ්බිධානි භවන්ති.

192. තානි කාමලොකෙ සබ්බානිපි ලබ්භන්ති.

193. රූපලොකෙ පන ඝාණාදිත්තයං නත්ථි.

194. අරූපලොකෙ පන සබ්බානිපි න සංවිජ්ජන්ති.

195. තත්ථ පඤ්ච විඤ්ඤාණධාතුයො යථාක්කමං එකන්තෙන පඤ්චප්පසාදවත්ථූනි නිස්සායෙව පවත්තන්ති.

196. පඤ්චද්වාරාවජ්ජන සම්පටිච්ඡන සංඛාතා පන මනොධාතු ච හදයං නිස්සායෙව පවත්තන්ති.

197. තථා අවසෙසා පන මනො විඤ්ඤාණධාතු සංඛාතා ච සන්තීරණ මහාවිපාක පටිඝද්වය පඨම මග්ග හසන රූපාවචර වසෙන හදයං නිස්සායෙව පවත්තන්ති.

185. ඤානසම්ප්‍රයුක්ත කාමාවචර ක්‍රියාවෝ ද ක්‍රියාභිඥාව ද ව්‍යවස්ථාපනය ද යන මොහු සර්වාකාරයෙන් සියල්ල අරමුණු කරන්නෝ ය.

186. අරූප සිත්වලින් දෙවැනි සතරවැනි සිත් මහද්ගතය අරමුණු කරන්නෝ ය.

187. ඉතිරි මහද්ගත සිත් ප්‍රඥප්තිය අරමුණු කරන්නෝ ය.

188. ලෝකෝත්තර චිත්තයෝ නිර්වාණය අරමුණු කරන්නෝ ය.

189. පස්විස්සක් සිත් කාමාරම්මණයෙහි ද සිත් සයක් මහද්ගතාරම්මණයෙහි ද විසි එකක් ප්‍රඥප්ත්‍යාරම්මණයෙහි ද අටක් නිර්වාණාරම්මණයෙහි ද-

190. විස්සක් ලෝකෝත්තරයන් හැර ඉතිරි ධර්ම කෙරෙහි ද පසක් අර්හත්මාර්ග ඵල දෙක හැර ඉතිරි ධර්ම විෂයෙහි ද සයක් සියලු අරමුණුවල ද පවතී. මෙසේ සත් අයුරකින් සංග්‍රහය වේ.

191. වස්තු සංග්‍රහයෙහි වස්තුහු නම් චක්ෂුර් වස්තුය ශ්‍රෝත්‍රවස්තුය ඝ්‍රාණවස්තුය ජිහ්වාවස්තුය කාය වස්තුය හෘදය-වස්තුය කියා සැවැදෑරුම් වෙති.

192. ඒ සියල්ල ම කාම ලෝකයෙහි ලැබේ.

193. රූපලෝකයෙහි ඝ්‍රාණාදි වස්තු තුන නැත.

194. අරූපලෝකයෙහි සියල්ල ම නැත.

195. එහි පඤ්චවිඥාන ධාතුහු පිළිවෙළින් ඒකාන්තයෙන් පඤ්චප්‍රසාද වස්තූන් ඇසුරු කොට ම පවතිත්.

196. පඤ්චද්වාරාවර්ජන සම්ප්‍රතෝෂණ සංඛ්‍යාත මනෝ-ධාතුව ද හෘදය ඇසුරු කොට ම පවත්නේ ය.

197. ඉතිරි මනෝවිඥාන ධාතුයයි කියන ලද සන්තීරණය මහා විපාකය ප්‍රතිඝ චිත්තද්වයය ප්‍රථම මාර්ග චිත්තය හසනය රූපාවචරය යන මොවුන්ගේ වශයෙන් (තිසක් සිත්) හෘදයවස්තුව ඇසුරු කොට ම පවතිත්.

198. අවසෙසා කුසලාකුසල ක්‍රියානුත්තර වසෙන පුන නිස්සාය වා අනිස්සාය වා.

199. ආරුප්ප විපාක වසෙන පන හදයං අනිස්ස යෙවාති.

200. ජවත්ථු නිස්සිත කාමෙ - සත්ත රූපෙ චතුබ්බිධා,
තිවත්ථු නිස්සිතාරුප්පෙ - ධාත්වෙකා නිස්සිතා මතා

201. තෙචත්තාලිස නිස්සාය - ද්වෙචත්තාළීස ජායරෙ,
නිස්සාය ච අනිස්සාය - පාකාරුප්පා අනිස්සිතා.

ඉති අභිධම්මත්ථසංගහෙ පකිණ්ණක සංගහ විභාගො
නාම තතියො පරිච්ජෙදො.

198. ඉතිරි කුසල්ය, අකුසල්ය, ක්‍රියාය, ලෝකෝත්තරය යන මොවුන්ගේ වශයෙන් දෙසාළිසක් සිත් හෘදයවස්තුව නිසා ද නො නිසා ද පවතිත්.

199. අරූප විපාක වශයෙන් වනාහි සතරක් සිත් හෘදය-වස්තුව නො නිසා ම පවතිත්.

200. කාමභවයෙහි සතක් වූ විඥනධාතුහු සයක් වූ වස්තූන් ඇසුරු කෙරෙති. රූපභවයෙහි සතරක් වූ විඥනධාතුහු වස්තු තුනක් ඇසුරු කෙරෙති. අරූප භවයෙහි එක් ධාතුවක් වස්තූන් නො නිසා පවතී.

201. තෙසාලිසක් සිත් වස්තුවක් නිසා ම පවතී. දෙසාලිසක් සිත් වස්තුවක් නිසා ද නො නිසා ද පවතී. ආරුප්ප විපාකයෝ සැම කල්හි වස්තූන් නො නිසා ම පවතිත්.

මෙය අභිධර්මාර්ථ සංග්‍රහයෙහි ප්‍රකීර්ණක සංග්‍රහ

නම් වූ තෘතීය පරිච්ඡේදය යි.

# චතුත්ථො පරිච්ජේදෙ

202. චිත්තුප්පාදාන මිච්චේවං - කත්වා සංගහ මුත්තරං
භූමිපුග්ගල භෙදෙන - පුබ්බාපර නියාමිතං.

203. පවත්ති සංගහං නාම - පටිසන්ධිප්පවත්තියං,
පවක්ඛාමි සමාසෙන - යථාසම්භවතො කථං.

204. ඡ වත්ථූනි, ඡ ද්වාරානි, ඡ ආරම්මණානි, ඡ විඤ්ඤාණානි, ඡ වීථියො, ඡධා විසයප්පවත්ති චෙති වීථි සංගහෙ ඡ ඡක්කානි වෙදිතබ්බානි.

205. වීථිමුත්තානං පන කම්ම කම්මනිමිත්ත ගති නිමිත්ත වසෙන තිවිධා හොති විසයප්පවත්ති.

206. තත්ථ වත්ථුද්වාරාරම්මණානි පුබ්බෙ වුත්තනයා නෙව.

207. චක්ඛුවිඤ්ඤාණං සොතවිඤ්ඤාණං ඝාණ විඤ්ඤාණං ජිව්හා විඤ්ඤාණං කාය විඤ්ඤාණං මනොවිඤ්ඤාණං චෙති ඡ විඤ්ඤාණානි.

208. වීථියො පන චක්ඛුද්වාරවීථි සොතද්වාරවීථි ඝාණ ද්වාරවීථි ජිව්හාද්වාරවීථි කායද්වාරවීථි මනොද්වාරවීථි චෙති ද්වාර වසෙන වා, චක්ඛුවිඤ්ඤාණ වීථි, සොතවිඤ්ඤාණවීථි ඝාණ-විඤ්ඤාණවීථි ජිව්හාවිඤ්ඤාණවීථි කායවිඤ්ඤාණවීථි මනො විඤ්ඤාණවීථි චෙති විඤ්ඤාණවසෙන වා ද්වාරප්පවත්තා චිත්තප්පවත්තියො යොජෙතබ්බා.

209. අතිමහන්තං මහන්තං පරිත්තං අතිපරිත්තඤ්චෙති පඤ්චද්-වාරෙ, මනොද්වාරෙ පන විභූතමවිභූතඤ්චෙති ඡද්ධා විසයප්පවත්ති වෙදිතබ්බා.

# චතුර්ථ පරිච්ඡේදය

202. මෙසේ චිත්තෝත්පාදයන්ගේ වේදනාදි විභාග හෙයින් උතුම් සංග්‍රහයක් කොට කාමාවචරාදි භූමීන් ගේ ද අහේතුකාදි පුද්ගලයන්ගේ ද භේදයෙන් උපලක්ෂිත වූ පූර්වාපර චිත්තයන් විසින් නියම කරන ලද.

203. ප්‍රවෘත්ති සංග්‍රහ නම් වූ සංග්‍රහයක් ප්‍රතිසන්ධියෙහි ද ප්‍රවෘත්තියෙහි ද ලැබෙන පරිද්දෙන් සංක්ෂේපයෙන් කියමි. කෙසේද යත්?-

204. ෂඩ්වස්තුහුය ෂඩ්ද්වාරයෝය ෂඩාරම්මණයෝය ෂඩ්-විඥානයෝය ෂඩ්වීථිහුය ෂට්ප්‍රකාර විෂය ප්‍රවෘත්තියයි වීථිසංග්‍රහයෙහි ෂට්කයෝ සදෙනෙක් දත යුත්තාහු ය.

205. වීථිමුක්ත චිත්තයන්ගේ වනාහි කර්මය කර්ම නිමිත්තය ගතිනිමිත්තය යන මොවුන්ගේ වශයෙන් ආරම්මණයෙහි පැවැත්ම ත්‍රිවිධ වේ.

206. ඒ ෂට්කයන් අතුරෙහි වස්තුද්වාරාරම්මණයෝ යට තෘතීය පරිච්ඡේදයෙහි කියන ලද ක්‍රම ඇත්තෝ ය.

207. චක්ෂුර්විඥානය ශ්‍රෝත්‍රවිඥානය ඝ්‍රාණවිඥානය ජිහ්වා විඥානය කායවිඥානය මනෝ විඥානය යන මොහු සයක් වූ විඥානයෝ ය.

208. සයක් වූ වීථිහු වනාහි චක්ෂුර්ද්වාරවීථිය ශ්‍රෝත්‍රද්වාරවීථිය ඝ්‍රාණද්වාරවීථිය ජිව්හාද්වාරවීථිය කාය ද්වාරවීථිය මනෝද්වාර-වීථිය යි ද්වාර වශයෙන් හෝ චක්ෂුර් විඥානවීථිය ශ්‍රෝත්‍ර විඥානවීථිය ඝ්‍රාණවිඥාන වීථිය ජිහ්වා විඥානවීථිය කාය විඥානවීථිය මනෝවිඥාන වීථියයි විඥාන වශයෙන් හෝ ද්වාරයන්හි පවත්නා චිත්ත ප්‍රවෘත්තීහු යෙදිය යුත්තාහු ය.

209. අතිමහන්තය මහන්තය පරිත්තය අතිපරිත්තයයි පඤ්චද්වාරයෙහි ද, මනෝද්වාරයෙහි වනාහි විභූතය අවිභූතයයි ද සයාකාරයෙන් ආරම්මණයන්ගේ පැවැත්ම දත යුතුය.

210. කථං? උප්පාද ඨිති භංග වසෙන ඛණත්තයං එක චිත්තක්ඛණං නාම, තානි පන සත්තරස චිත්තක්ඛණානි රූපධම්මානමායු.

211. එකචිත්තක්ඛණාතීතානි වා බහුචිත්තක්ඛණාතීතානි වා ඨිතිප්පත්තානෙව පඤ්චාරම්මණානි පඤ්චද්වාරෙ ආපාථමාගච්ඡන්ති.

212. තස්මා යදි එක චිත්තක්ඛණාතීතකං රූපාරම්මණං චක්ඛුස්ස අපාථමාගච්ඡති. තතො ද්වික්ඛත්තුං භවංගෙ චලිතෙ භවංගසොතං වොච්ඡින්දිත්වා තමේව රූපාරම්මණං ආවජ්ජෙන්තං පඤ්චද්වාරාවජ්ජන චිත්තං උප්පජ්ජිත්වා නිරුජ්ඣති. තතො තස්සානන්තරමෙව තමෙව රූපං පස්සන්තං චක්ඛුවිඤ්ඤාණං සම්පටිච්ඡන්තං සම්පටිච්ඡන චිත්තං සන්තීරයමානං සන්තීරණ චිත්තං වවත්ථපෙන්තං වොත්ථපන චිත්තඤ්චෙති යථාක්කමං උප්ප ජ්ජිත්වා නිරුජ්ඣන්ති, තතො පරං එකූනතිංස කාමාවචර ජවනෙසු යංකිඤ්චි ලද්ධපච්චයං යෙභුය්‍යෙන සත්තක්ඛත්තුං ජවනං ජවති. ජවනානුබන්ධානි ච ද්වෙ තදාරම්මණපාකානි යථාරහං පවත්තන්ති. තතොපරං භවංග පාතො.

213. එත්තාවතා චුද්දස වීථිචිත්තුප්පාදා ද්වෙ භවංග චලනානි පුබ්බේවාතීතක මෙක චිත්තක්ඛණන්ති කත්වා සත්තරස චිත්තක්ඛණානි පරිපූරෙන්ති, තතො පරං නිරුජ්ඣති. ආරම්මණ මෙතං අතිමහන්තං නාම ගොචරං.

214. යාව තදාලම්බනුප්පාදා පන අප්පහොන්තාතීතක මාපාථ මාගතං ආරම්මණං මහන්තං නාම. තත්ථ ජවනාවසානෙ භවංග පාතොව හොති, නත්ථි තදාලම්බනුප්පාදො.

210. කෙසේද යත්? - උත්පාදය ස්ථිතිය භංගය යන මොවුන්ගේ වශයෙන් ක්ෂණත්‍රයෙක් එක් චිත්තක්ෂණයෙක් නම් වේ. එබඳු වූ චිත්තක්ෂණ සතළොසෙක් රූප ධර්මයන්ගේ ආයුෂය ය.

211. එක චිත්තක්ෂණයක් ඉක්මුණා වූ ද බොහෝ චිත්තක්ෂණයන් ඉක්මුණා වූ ද පඤ්චාරම්මණයෝ පඤ්චද්වාර-යෙහි ගෝචර භාවයට පැමිණෙති.

212. එහෙයින් එක චිත්තක්ෂණයක් ඉක්මුණා වූ රූපා-රම්මණය චක්ෂුඃප්‍රසාදයාගේ ගෝචර බවට ඉදින් පැමිණියේ නම් ඉක්බිති දෙවරක් භවංගය චලනය වූ කල්හි භවංග ප්‍රවාහය සිඳ ඒ රූපාරම්මණය ම ආවර්ජනය කරමින් පඤ්චද්වාරාවජ්ජන චිත්තය ඉපද නිරුද්ධ වේ. ඊට අනතුරුව එම රූපය දක්නා වූ චක්ෂුර්විඥානය ද, එය පිළිගන්නා වූ සම්ප්‍රතෝක්ෂණ චිත්තය ද, එය විමසන්නා වූ සන්තීරණ චිත්තය ද, එය මෙසේ ය යි විනිශ්චය කරන්නාවූ ව්‍යවස්ථාපන චිත්තය ද යන මොහු පිළිවෙළින් ඉපිද නිරුද්ධ වෙති. ඉක්බිති එකුන් තිස් කාමාවචර ජවනයන් අතුරෙන් යම්කිසි ජවනයක් ලබන ලද ප්‍රත්‍යන්ට අනුරූප වශයෙන් බොහෝ සෙයින් සත්වරක් උපදනේ ය. අනතුරුවැ ජවනානුබන්ධ වූ තදාරම්මණ විපාකයෝ දෙදෙනෙක් සුදුසු පරිදි උපදිති. ඊට අනතුරුව භවාංගයෝ වෙති.

213. තුදුසක් වූ වීථිචිත්තයෝය භවාංගචලනයෝ දෙදෙනය පෙර ඉක්ම ගියා වූ එක් චිත්තක්ෂණය යි කියා මෙතෙකින් පසළොස් චිත්තක්ෂණයෝ සම්පූර්ණ වෙති. මෙය අතිමහන්ත නම් වූ ආරම්මණයයි.

214. තදාරම්මණෝත්පත්තිය දක්වා පැවැත්මට නො සෑහෙන පමණට ආයුෂය ඉක්ම ගොස් චිත්තයන්ගේ විෂය බවට පැමිණියා වූ ආරම්මණය මහන්තාරම්මණ නමි. එහි ජවනාව-සානයෙහි භවාංගයන් ගේ පහළවීම ම වේ. තදරම්මණයාගේ ඉපදීමෙක් නොවේ.

215. යාව ජවනුප්පාදා පි අප්පහොන්තාතීතක මාපාථ මාගතං ආරම්මණං පරිත්තං නාම. තත්ථ ජවනානම්පි අනුප්පංජ්ජිත්වා ද්වත්තික්ඛත්තුං වොත්ථපන මෙව පවත්තති. තතො පරං භවංග පාතොව හොති.

216. යාව වොත්ථපනුප්පාදා ච පන අප්පහොන්තාතීතක මාපාථ මාගතං නිරොධාසන්න මාරම්මණං අතිපරිත්තං නාම. තත්ථ භවංග චලන මෙව හොති. නත්ථි වීථි චිත්තුප්පාදො.

217. ඉච්චේවං චක්ඛුද්වාරෙ තථා සොතද්වාරාදීසු චෙති සබ්බථා පි පඤ්චද්වාරෙ තදාරම්මණ ජවන වොත්ථපන මොඝවාර සංඛාතානං චතුන්නං වාරානං යථාක්කමං ආරම්මණභූතා විසයප්පවත්ති චතුධා වෙදිතබ්බා.

218. වීථිචිත්තානි සත්තෙව - චිත්තුප්පාදා චතුද්දස,

චතුපඤ්ඤාස විත්ථාරා - පඤ්චද්වාරෙ යථාරහං

අයමෙත්ථ පඤ්චද්වාරෙ වීථිචිත්තප්පවත්ති නයො.

219. මනොද්වාරෙ පන යදි විභූත මාරම්මණං ආපාථ මාගච්ඡති තතො භවංගචලන මනොද්වාරාවජ්ජන ජවනාවසානෙ තදාරම්මණ පාකානි පවත්තන්ති, තතො පරං භවංග පාතො.

220. අවිභූතෙ පනාලම්බනෙ ජවනාවසානෙ භවංගපාතොව හොති නත්ථි තදාලම්බනුප්පාදො.

221. වීථිචිත්තානි තීණෙව - චිත්තුප්පාදා දසෙරිතා

විත්ථාරෙන පනෙත්ථේක - චත්තාලිස විභාවයෙ

අයමෙත්ථ පරිත්ත ජවන වාරො.

215. ජවනෝත්පාදය දක්වා ද පැවැත්මට නො සෑහෙන සේ ආයුෂය ඉක්ම විෂය බවට පැමිණියා වූ අරමුණ වනාහි පරිත්තාරම්මණ නම් වේ. එහි ජවනය ද නොවී දෙතුන් වරෙක් ව්‍යවස්ථාපනය ම වේ. අනතුරුවැ භවංග වේ.

216. ව්‍යවස්ථාපනයාගේ උත්පත්තිය දක්වා පැවැත්මට නො සෑහෙන සේ ආයුෂ ඉක්ම විෂය බවට පැමිණියා වූ නිරුද්ධ වීමට ළංවූ අරමුණ වනාහි අතිපරිත්තාරම්මණ නම්. එහි භවාංග චලනය පමණක් වේ. වීථි සිත් නූපදී.

217. මෙසේ චක්ෂුර්ද්වාරයෙහි ද ශ්‍රෝත්‍රද්වාරාදීන්හි දැයි සර්වාකාරයෙන් පඤ්චද්වාරයෙහි තදාරම්මණවාරය ජවනවාරය ව්‍යවස්ථාපනවාරය මෝඝවාරය යන සතර වාරයන්ට පිළිවෙළින් අරමුණු වන්නා වූ ආරම්මණයන්ගේ පැවැත්ම සතර ප්‍රකාරයෙන් දත යුතු.

218. පඤ්චද්වාරයෙහි ඒ ඒ ආරම්මණයන්ට අනුරූප පරිද්දෙන් වීථි චිත්තයෝ සත් දෙනෙක්ම ය, වෙන වෙන ම ඉපදීම් වශයෙන් චිත්තෝත්පාද තුදුසෙක, විස්තර වශයෙන් සිත් සූපනසෙක.

මෙය මේ විෂය ප්‍රවෘත්ති සංග්‍රහයෙහි පඤ්චද්වාරයෙහි
වීථි සිත් උපදනා ක්‍රමය යි.

219. මනෝද්වාරයෙහි වනාහි ඉදින් විභූතාරම්මණයෙක් විෂය බවට ආයේ වේ නම් ඉක්බිති භවාංග චලන මනෝද්වාරාවර්ජන ජවනයන්ගේ අවසානයෙහි තදරම්මණ විපාකයෝ පවතිත්. ඉන්පසු භවාංග පාතය වේ.

220. අවිභූත වූ ආරම්මණයෙහි වනාහි ජවනාවසානයෙහි භවංගයන්ගේ පහළවීම ම වේ. තදාරම්මණයන්ගේ ඉපදීමෙක් නැත.

221. මේ මනෝද්වාරයෙහි වීථිචිත්තයෝ තිදෙනෙක් ම ය. චිත්තෝත්පාදයෝ දසදෙනෙක් කියන ලදහ. විස්තර වශයෙන් සිත් එක්සාළිසක් ප්‍රකාශ කරන්නේ ය.

මෙය මේ මනෝද්වාරයෙහි පරිත්ත ජවන වාරය යි.

222. අප්පනා ජවන වාරෙ පන විභූතාවිභූත භෙදො නත්ථි. තථා තදාලම්බනුප්පාදොච.

223. තත්ථ හි ඤාණසම්පයුත්ත කාමාවචර ජවනාන මට්ඨන්නං අඤ්ඤතරස්මිං පරිකම්මොපචාරානුලොමගොත්‍රභූ නාමෙන චතුක්ඛත්තුං තික්ඛත්තු මෙව වා යථාක්කමං උප්පජ්ජිත්වා නිරුද්ධෙ තදනන්තරමෙව යථාරහං චතුත්ථං වා පඤ්චමං වා ඡබ්බීසති මහග්ගත ලොකුත්තර ජවනෙසු යථාභිනීහාර වසෙන යංකිඤ්චි ජවනං අප්පනා වීථි මොතරති, තතො පරං අප්පනාවසානෙ භවංගපාතොව හොති.

224. තත්ථ සොමනස්ස සහගත ජවනානන්තරං අප්පනා පි සොමනස්ස සහගතාව පාටිකංඛි තබ්බා. උපෙක්ඛා සහගත ජවනානන්තරං උපෙක්ඛා සහගතාව, තත්ථා පි කුසලජවනානන්තරං කුසලජවනඤ්චෙව හෙට්ඨිමඤ්ච ඵලත්තය මප්පෙති, ක්‍රියා ජවනානන්තරං ක්‍රියා ජවනං අරහත්තඵලං චාති.

225. ද්වත්තිංස සුඛ පුඤ්ඤම්හා - ද්වාදසොපෙක්ඛකාපරං
සුඛිත ක්‍රියතො අට්ඨ - ඡ සම්භොන්ති උපෙක්ඛකා.

226. පුථුජ්ජනාන සෙක්ඛානං - කාමමපුඤ්ඤ තිහෙතුතො
තිහෙතුකාම ක්‍රියතො - වීතරාගාන මප්පනා.

අයමෙත්ථ මනොද්වාරෙ වීථිචිත්තප්පවත්ති නයො.

227. සබ්බථාපි පනෙත්ථ අනිට්ඨෙ ආලම්බනෙ අකුසල විපාකානෙ ව පඤ්ච විඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ තදාරම්මණානි, ඉට්ඨෙ කුසලවිපාකානි, අති ඉට්ඨෙ පන සොමනස්ස සහගතානෙව සන්තීරණ තදාරම්මණානි.

222. අර්පණා ජවන වාරයෙහි වනාහි විභූතාවිභූත භේදය නැත. එසේ ම තදාරම්මණෝත්පාදය ද නැත.

223. එහි වනාහි ඤාණසම්ප්‍රයුක්ත කාමාවචර ජවන අට අතුරෙන් යම් කිසිවක් පරිකර්මය, උපචාරය, අනුලෝමය, ගෝත්‍රභූය යන නම් වලින් සතරවරක් හෝ තුන්වරක් පිළිවෙළින් ඉපිද නිරුද්ධ වූ කල්හි එයට අනතුරුව ම සුදුසු පරිදි සතර වැනිව හෝ පස්වැනිව සවිසි මහද්ගත ලෝකෝත්තර ජවනයන් අතුරෙන් චිත්තප්‍රාර්ථනා වශයෙන් යම්කිසි ජවනයෙක් අර්පණා වීථියට බසින්නේ ය. ඉන් පසු අර්පණාවසානයෙහි භවංගපාතය වේ.

224. ඒ ඤාන සම්ප්‍රයුක්ත කාමාවචර ජවනයන් අතුරෙන් සෞමනස්‍ය සහගත ජවනයන්ට අනතුරුවැ අර්පණාව ද සෞමනස්‍ය සහගතවැ ම කැමති විය යුත්තීය. උපේක්‍ෂා සහගත ජවනයන්ට අනතුරුවැ උපේක්‍ෂා සහගත වූ ම අර්පණා කැමති විය යුත්තීය. එයිනුදු කාමාවචර කුසලජවනයන්ට අනතුරුවැ කුශල ජවන හා යට ඵල තුන ද අර්පණා වශයෙන් උපදින්නාහු ය. කාමාවචර ක්‍රියා ජවනයන්ට අනතුරුවැ ක්‍රියා ජවනයන් හා අර්හත් ඵල ජවනයෝ ද උපදනාහු ය.

225. සෞමනස්‍ය සහගත ත්‍රිහේතුක කාමකුශලයන් කෙරෙන් දෙතිසක් අර්පණා ජවනයෝ වන්නාහුය. උපේක්‍ෂා සහගත ත්‍රිහේතුක කාමකුශලය කෙරෙන් දොළොසක අර්පණා වන්නා හ. සෞමනස්‍ය සහගත ත්‍රිහේතුක කාමක්‍රියා කෙරෙන් අටක් වූ අර්පණා වන්නාහ. උපේක්‍ෂා සහගත ත්‍රිහේතුක කාමක්‍රියාව කෙරෙන් සයක් වූ අර්පණාවෝ වන්නා හ.

226. පෘථග්ජනයන්ට හා ශෛක්ෂයන්හට ත්‍රිහේතුක කාම කුශලය කෙරෙන් ද රහතන්හට ත්‍රිහේතුක කාම ක්‍රියා කෙරෙන් ද අර්පණාවෝ වන්නාහ.

මෙය මනෝද්වාරයෙහි වීථිචිත්ත ප්‍රවෘත්ති ක්‍රමය යි.

227. මේ වීථීන්හි සියලු තන්හි අනිෂ්ටාරම්මණයෙහි අකුශල විපාක වූ ම පඤ්චවිඥාන සම්පටිච්ඡන සන්තීරණ තදාරම්මණයෝ වන්නාහුය. ඉෂ්ටාරම්මණයෙහි කුසලවිපාක වූවෝ වන්නාහ. අති ඉෂ්ටාරම්මණයෙහි වනාහි සෝමනස්ස සහගත වූ ම සන්තීරණ තදාරම්මණයෝ වන්නාහ.

228. තත්ථාපි සොමනස්ස සහගත ක්‍රියා ජවනාවසානෙ සොමනස්ස සහගතානෙව තදාරම්මණානි භවන්ති, උපෙක්ඛා සහගත ක්‍රියා ජවනාවසානෙ උපෙක්ඛා සහගතානෙව හොන්ති.

229. දොමනස්ස සහගත ජවනාවසානෙ ච පන තදාරම්මණානි චෙව භවංගානි ච උපෙක්ඛා සහගතානෙව හොන්ති. තස්මා යදි සොමනස්ස පටිසන්ධිකස්ස දොමනස්ස සහගත ජවනාවසානෙ තදාරම්මණ සම්භවො නත්ථි, තදා යං කිඤ්චි පරිචිතපුබ්බං පරිත්තාරම්මණමාරබ්භ උපෙක්ඛා සහගත සන්තීරණං උප්පජ්ජති. තමනන්තරිත්වා භවංග පාතොව හොතීති වදන්ති ආචරිය.

230. තථා කාමාවචර ජවනාවසානෙ කාමාවචර සත්තානං කාමාවචර ධම්මෙස්වෙව ආරම්මණ භූතෙසු තදාරම්මණං ඉච්ඡන්තීති.

231. කාමෙ ජවන සත්තා - ලම්බනානං නියමෙ සති,

විභූතෙති මහන්තෙ ච - තදාරම්මණ මීරිතං.

අයමෙත්ථ තදාරම්මණ නියමො.

232. ජවනෙසු ච පරිත්ත ජවන වීථියං කාමාවචර ජවනානි සත්තක්ඛත්තුං ඡක්ඛත්තු මෙව වා ජවන්ති.

233. මන්දප්පවත්තියං පන මරණකාලාදීසු පඤ්චවාර මෙව.

234. භගවතො පන යමකපාටිහාරිය කාලාදීසු ලහුකප්පවත්තියං චත්තාරි පඤ්ච වා පච්චවෙක්ඛණ චිත්තානි භවන්තීති වදන්ති.

235. ආදිකම්මිකස්ස පන පඨමක අප්පනායං මහග්ගත ජවනානි අභිඤ්ඤා ජවනානි ච සබ්බදා පි එකවාර මෙව ජවන්ති. තතො පරං භවංග පාතො.

228. ඒ තදරම්මණයන් අතුරෙනුදු සෝමනස්ස සහගත ක්‍රියා ජවනාවසානයෙහි සෝමනස්ස සහගත වූ ම තදාරම්මණයෝ වෙති. උපේක්ෂා සහගත ක්‍රියා ජවනාවසානයෙහි උපේක්ෂා සහගතයෝ ම වෙති.

229. දෝමනස්ස සහගත ජවනාවසානයෙහි වනාහි තදාරම්මණයෝ ද භවාංගයෝ ද උපේක්ෂා සහගතයෝ ම ය. එහෙයින් සෞමනස්‍ය ප්‍රතිසන්ධිකයා හට දෞර්මනස්‍ය ජවනාවසානයෙහි තදාරම්මණ වීමක් නැත. ඉදින් නැතිනම් එකල්හි පෙර පුරුදු වූ යම්කිසි කාමාරම්මණයක් ගෙන උපේක්ෂා සහගත සන්තීරණය උපදනේ ය. එයට අනතුරුවැ භවාංග වන්නේ යයි ආචාර්‍ය්‍යවරයෝ කියති.

230. එසේ ම කාමාවචර ජවනයන්ගේ අවසානයෙහි කාමාවචර සත්ත්වයන්හට කාමාවචර ධර්මයන් ම අරමුණු වූ කල්හි තදාරම්මණය කැමති වෙති.

231. කාමභවයෙහි ජවනය සත්ත්වයා ආරම්මණය යන මොවුන්ගේ නියමය ඇති කල්හි විභූතාරම්මණයෙහි ද අතිමහන්තාරම්මණයෙහි ද තදාරම්මණය කියන ලදී.

මෙය මෙහි තදරම්මණ නියමය යි.

232. ජවනයන් අතුරෙහි ද කාමජවනවීථියෙහි කාමාවචර ජවනයෝ සත්වරක් හෝ සවරක් ම හෝ උපදිති.

233. දුබල වූ පැවැත්මක් ඇති කල්හි වනාහි මරණකාලාදියෙහි පස්වරක් ම උපදිති.

234. භාග්‍යවතුන් වහන්සේට වනාහි යමකප්‍රාතිහාර්‍ය්‍ය කාලාදියෙහි යුහුව චිත්තවීථින්ගේ පැවැත්ම ඇති කල්හි සතරක් වූ හෝ පසක් වූ හෝ ප්‍රත්‍යවේක්ෂා ජවන චිත්තයෝ වෙත්යයි කියත්.

235. ආදිකර්මිකයා හට වනාහි පළමුකොට අර්පණා චිත්තය ඉපදීමෙහිදී මහද්ගත ජවනයෝ ද අභිඥා ජවනයෝ ද සැම කල්හි ම එක් වරෙක් ම උපදිති. එයට අනතුරුවැ භවාංගයෝ වෙති.

**236**. චත්තාරො පන මග්ගුප්පාදා එක චිත්තක්ඛණිකා, තතො පරං ද්වෙ තීණි ඵලචිත්තානි යථාරහං උප්පජ්ජන්ති, තතො පරං භවංග පාතො.

**237**. නිරොධ සමාපත්ති කාලෙ ද්වික්ඛත්තුං චතුත්ථාරුප්පජවනං ජවති. තතො පරං නිරොධං ඵුසති.

**238**. වුට්ඨාන කාලෙ ච අනාගාමිඵලං වා අරහත්තඵලං වා යථාරහ මෙකවාරං උප්පජ්ජිත්වා නිරුද්ධෙ භවංගපාතොව හොති.

**239**. සබ්බත්ථා පි සමාපත්ති වීථියං භවංගසොතෙ විය වීථි නියමො නත්ථීති කත්වා බහූනි පි ලබ්භන්තීති.

**240**. සත්තක්ඛත්තුං පරිත්තානි - මග්ගාභිඤ්ඤා සකිං මතා,

අවසෙසානි ලබ්භන්ති - ජවනානි බහූනි පි.

අයමෙත්ථ ජවන නියමො.

**241**. දුහෙතුකාන මහෙතුකානං පනෙත්ථ ක්‍රියා ජවනානි චෙව අප්පනා ජවනානි ච න ලබ්භන්ති.

**242**. තථා ඤාණ සම්පයුත්ත විපාකානි ච සුගතියං.

**243**. දුග්ගතියං පන ඤාණවිප්පයුත්තානි ච මහාවිපාකානි න ලබ්භන්ති.

**244**. තිහෙතුකෙසු ච ඛීණාසවානං කුසලාකුසල ජවනානි න ලබ්භන්ති.

**245**. තථා සෙක්ඛ පුථුජ්ජනානං ක්‍රියා ජවනානි.

**246**. දිට්ඨිගත සම්පයුත්ත විචිකිච්ඡා ජවනානි ච සෙක්ඛානං.

236. සතර මාර්ග චිත්තයෝ වනාහි එක්වරක් උපදින්නෝ ය. ඉක්බිති දෙකක් වූ හෝ තුනක් වූ හෝ ඵලචිත්තයෝ සුදුසු පරිදි උපදිති. අනතුරුවැ භාවංගපාතය වේ.

237. නිරෝධසමාපත්ති කාලයෙහි දෙවරක් චතුර්ථාරූප්‍ය ජවනය උපදී. ඉන්පසු නිරෝධය ස්පර්ශ කෙරේ.

238. නිරෝධයෙන් නැගෙන කාලයෙහි ද අනාගාමිඵලය හෝ අර්හත්ඵලය සුදුසු පරිදි එක්වරක් ඉපද නිරුද්ධ කල්හි භවාංග පාතය වේ.

239. සැමතන්හි ම සමාපත්තිවීථියෙහි භවාංග සන්තතියෙහි මෙන් වීථිචිත්ත නියමයක් නැති බැවින් බොහෝ වූ ද ජවනයෝ ලැබෙත්.

240. කාමජවනයෝ සත්වරකැයි දන්නා ලදී. මාර්ගජවන අභිඥජවනයෝ එක්වරෙකැයි දන්නා ලදී. ඉතිරි ජවනයෝ බොහෝ වූවාහු ද ලැබෙත්.

මෙය මෙහි ජවන නියමය යි.

241. මේ ජවන නියමයෙහි ද්විහේතුකාහේතුක පුද්ගලයන්ට වනාහි ක්‍රියාජවනයෝ ද අර්පණාජවනයෝ ද නො ලැබෙත්.

242. සුගතියෙහි අහේතුක ද්විහේතුක දෙදෙනාහට ඥාන සම්ප්‍රයුක්ත විපාකයෝ ද නො ලැබෙති.

243. දුර්ගතියෙහි අහේතුකයාහට ඥානවිප්‍රයුක්ත මහා විපාකයෝ ද නො ලැබෙති.

244. ත්‍රිහේතුකයන් අතුරෙන් රහතුන්ට කුශලා‘කුශල ජවනයෝ නො ලැබෙති.

245. එසේ ම ශෛක්ෂයන්ට හා පෘථග්ජනයන්ට ක්‍රියාජවනයෝ නො ලැබෙති.

246. දෘෂ්ටිසම්ප්‍රයුක්ත විචිකිත්සා ජවනයෝ ද ශෛක්ෂයන්ට නො ලැබෙති.

247. අනාගාමිපුග්ගලානං පටිසන්ධිජවනානි ච න ලබ්භන්ති.

248. ලොකුත්තර ජවනානි ච යථාරහං අරියානමෙව සමුප්පජ්ජන්ති.

249. අසෙක්ඛානං චතුචත්තා - ලීස සෙක්ඛාන මුද්දිසෙ,
ඡප්පඤ්ඤාසාව සෙසානං - චතුපඤ්ඤාස සම්භවා.

අයමෙත්ථ පුග්ගලභෙදො.

250. කාමාවචර භූමියං පනෙතානි සබ්බානි පි වීථිචිත්තානි යථාරහ මුපලබ්භන්ති.

251 රූපාවචර භූමියං පටිඝජවන තදාරම්මණ වජ්ජිතානි.

252. අරූපාවචර භූමියං පඨමමග්ග රූපාවචර හසන හෙට්ඨිමා-රුප්පවජ්ජිතානි ච ලබ්භන්ති.

253. සබ්බත්ථාපි ච තං තං පසාද රහිතානං තං තං ද්වාරික වීථිචිත්තානි න ලබ්භන්තෙව.

254. අසඤ්ඤසත්තානං පන සබ්බථා පි චිත්තප්පවත්ති නත්ථෙවාති.

255. අසීති වීථිචිත්තානි - කාමෙ රූපෙ යථාරහං
චතුසට්ඨි තථාරූප්පෙ - ද්වෙචත්තාලීස ලබ්භරෙ.

අයමෙත්ථ භූමිවිභාගො.

256. ඉච්චෙවං ඡද්වාරික චිත්තප්පවත්ති යථාසම්භවං භවංගන්තරිතා යාවතායුක මබ්බොච්ඡින්නා පවත්තතීති.

ඉති අභිධම්මත්ථ සංගහෙ වීථිසංගහ විභාගො
නාම චතුත්ථො පරිච්ඡෙදො.

247. අනාගාමි පුද්ගලයන්හට ප්‍රතිඝජවනයෝ ද නො ලැබෙති.

248. ලෝකෝත්තර ජවනයෝ සුදුසු පරිදි ආයර්‍යයන්ට ම උපදිති.

249. ලැබෙන පරිදි රහතුන්ට සූසාළිසක් සිත් කියන්නේ ය. ශෛක්ෂයනට සපනසක් සිත් කියන්නේ ය. අවශිෂ්ට පුද්ගලයන්ට සූපනසක් සිත් කියන්නේ ය.

මෙය මෙහි පුද්ගල භේදයයි.

250. කාමාවචර භූමියෙහි වනාහි මේ සියළු ම වීථිචිත්තයෝ සුදුසු පරිදි ලැබෙත්.

251. රූපාවචර භූමියෙහි ප්‍රතිඝජවන හා තදාරම්මණ වර්ජිත චිත්තයෝ ලැබෙත්.

252. අරූපාවචර භූමියෙහි ප්‍රථම මාර්ගය රූපාවචරය හසනය යට යට අරූපාවචර සිත්ය යන මොවුන් හැර ඉතිරි චිත්තයෝ ලැබෙත්.

253. සැමතන්හි ඒ ඒ ප්‍රසාද රහිත පුද්ගලයන්ට ඒ ඒ ද්වාරයෙහි උපදනා වීථිචිත්තයෝ නො ලැබෙති.

254. අසංඥ සත්ත්වයනට වනාහි සර්වාකාරයෙන් චිත්ත ප්‍රවෘත්තිය නැත්ම ය.

255. කාමලෝකයෙහි වීථිසිත් අසූවක් ද රූප ලෝකයෙහි සුදුසු පරිදි සූසැටක් ද අරූපලෝකයෙහි දෙසාලිසක් ද ලැබෙත්.

මෙය මෙහි භූමි විභාගයයි.

256. මෙසේ ෂඩ්ද්වාරික චිත්තප්‍රවෘත්තිය සුදුසු පරිද්දෙන් භවාංගාන්තරිකවැ දිවි ඇතිතෙක් නො සිඳී පවත්නේ ය.

මෙය අභිධර්මාර්ථ සංග්‍රහයෙහි වීථිසංග්‍රහ විභාග නම් වූ චතුර්ත්ථ පරිච්ඡේදය යි.

# පඤ්චමො පරිච්ඡෙදො.

257. වීථිචිත්ත වසෙනෙවං - පවත්තිය මුදීරිතො
පවත්ති සංගහො නාම - සන්ධියං දානි වුච්චති.

258. චතස්සො භූමියො චතුබ්බිධා පටිසන්ධි චත්තාරි කම්මානි චතුධා මරණුප්පත්ති චෙති වීථිමුත්ත සංගහෙ චත්තාරි චතුක්කානි වෙදිතබ්බානි.

259. තත්ථ අපායභූමි කාමසුගතිභූමි රූපාවචරභූමි අරූපාවචරභූමි චෙති චතස්සො භූමියො නාම.

260. තාසු නිරයො තිරච්ඡානයොනි පෙත්තිවිසයො අසුරකායො චෙති අපායභූමි චතුබ්බිධා හොති.

261. මනුස්සා චාතුම්මහාරාජිකා තාවතිංසා යාමා තුසිතා නිම්මාණරති පරනිම්මිත වසවත්ති චෙති කාමසුගතිභූමි සත්තවිධා හොති.

262. සා පනායමෙකාදසවිධාපි කාමාවචරභූමිච්චෙව සංඛං ගච්ඡති.

263. බ්‍රහ්මපාරිසජ්ජා බ්‍රහ්මපුරොහිතා මහාබ්‍රහ්මා චෙති පඨමජ්-ඣාන භූමි.

264. පරිත්තාභා අප්පමාණාභා ආභස්සරා චෙති දුතියජ්ඣානභූමි.

265. පරිත්තසුභා අප්පමාණසුභා සුභකිණ්හා චෙති තතියජ්-ඣාන භූමි.

266. වෙහප්ඵලා අසඤ්ඤසත්තා සුද්ධාවාසා චෙති චතුත්ථජ්ඣාන භූමිති රූපාවචර භූමි සොළස විධා හොති.

# පඤ්චම පරිච්ඡේදය

257. මෙසේ ප්‍රවෘත්ති කාලයෙහි වීථිචිත්තයන්ගේ වශයෙන් ප්‍රවෘත්ති සංග්‍රහය කියන ලදී. දැන් ප්‍රතිසන්ධි කාලයෙහි හා ච්‍යුති කාලයෙහි ද ප්‍රවෘත්ති සංග්‍රහය කියනු ලැබේ.

258. සතරක් වූ භූමීහු ය, සතර ආකාර වූ ප්‍රතිසන්ධීහුය, සතරක් වූ කර්මයෝ ය, සතර ආකාර වූ මරණෝත්පත්තීහුය යි වීථිමුක්ත සංග්‍රහයෙහි සතරක් වූ චතුෂ්කයෝ දත යුත්තාහු ය.

259. එහි අපාය භූමිය කාමසුගතිභූමිය රූපාවචර භූමිය, අරූපාවචර භූමිය යන මොහු සතරක් වූ භූමීහු නම් වෙති.

260. ඒ භූමීන් අතුරෙන් නරකය තිරිසන්යෝනිය ප්‍රේත විෂයය අසුරනිකායය යි අපායභූමිය චතුර්විධ වන්නේ ය.

261. මනුෂ්‍යභූමිය චාතුර්මහාරාජිකය තාවතිංසය යාමය තුසිතය නිර්මාණරතිය පරනිර්මිතවශවර්තියයි කාමසුගතිභූමිය සත්වැදෑරුම් වේ.

262. එකොළොස් වැදෑරුම් වූ මේ භූමීහු කාමාවචර භූමීහුය යන සංඛ්‍යාවට පැමිණෙති.

263. බ්‍රහ්මපාරිෂද්‍යය බ්‍රහ්මපුරෝහිතය මහාබ්‍රහ්මය යන මොහු ප්‍රථමධ්‍යාන භූමීහුය.

264. පරිත්තාභ අප්පමාණාභ ආභස්සර යන මොහු ද්විතීය ධ්‍යාන භූමීහුය.

265. පරිත්තසුභ අප්පමාණසුභ සුභකිණ්ණ යන මොහු තෘතීයධ්‍යාන භූමීහුය.

266. වේහප්ඵල අසඤ්ඤසත්ත සුද්ධාවාස යන මොහු චතුර්ත්ථධ්‍යාන භූමීහුයයි රූපාවචර භූමිය සොළොස් වැදෑරුම් වේ.

267. අවිහා අතප්පා සුදස්සා සුදස්සී අකනිට්ඨා චෙති සුද්ධාවාසභූමි පඤ්චවිධා හොති.

268. ආකාසානඤ්චායතන භූමි විඤ්ඤාණඤ්චායතන භූමි ආකිඤ්චඤ්ඤායතන භූමි නෙවසඤ්ඤා නාසඤ්ඤායතන භූමි චෙති අරූප භූමි චතුබ්බිධා හොති.

269. පුථුජ්ජනා න ලබ්භන්ති සුද්ධාවාසෙසු සබ්බථා.

සොතාපන්නා ච සකදාගාමිනො වා පි පුග්ගලා.

270. අරියා නොපලබ්භන්ති - අසඤ්ඤාපාය භූමිසු,

සෙසට්ඨානෙසු ලබ්භන්ති - අරියානරියා පිච.

ඉදමෙත්ථ භූමි චතුක්කං.

271. අපාය පටිසන්ධි කාමසුගති පටිසන්ධි රූපාවචර පටිසන්ධි අරූපාවචර පටිසන්ධි චෙති චතුබ්බිධා පටිසන්ධි නාම.

272. තත්ථ අකුසලවිපාකොපෙක්ඛා සහගත සන්තීරණං අපාය භූමියං වොක්කන්තික්ඛණෙ පටිසන්ධි හුත්වා තතො පරං භවංග පරියොසානෙ ච චවනං හුත්වා වොච්ඡිජ්ජති. අයමෙකාපාය පටිසන්ධි නාම.

273. කුසලවිපාකොපෙක්ඛාසහගත සන්තීරණං පන කාම සුගතියං මනුස්සානඤ්චෙව ජච්චන්ධාදීනං භූම්මනිස්සිතානඤ්ච විනිපාතික අසුරානං පටිසන්ධි භවංග චුති වසෙන පවත්තති.

274. මහාවිපාකානි පන අට්ඨ සබ්බථා පි කාමසුගතියං පටිසන්ධි භවංග චුති වසෙන පවත්තන්ති. ඉමා නව කාමසුගති පටිසන්ධියො නාම, සා පනායං දසවිධා පි කාමාවචර පටිසන්ධිච්චෙව සංඛං ගච්ඡති.

275. තෙසු චතුන්නං අපායානං මනුස්සානං විනිපාතිකාසුරානඤ්ච ආයුප්පමාණං ගණනාය නියමො නත්ථි.

267. අවිහය අතප්පය සුදස්සය සුදස්සීය අකනිට්ඨය යි ශුද්ධාවාස භූමිය පඤ්චප්‍රකාර වේ.

268. ආකාසානඤ්චායතන භූමිය -පෙ- නේවසඤ්ඤා-නාසඤ්ඤායතන භූමියයි අරූපභූමිය සතර වැදෑරුම් වේ.

269. ශුද්ධාවාසභූමීන්හි පෘථග්ජනයෝ ද සෝවාන් සකෘදාගාමි පුද්ගලයෝ ද සර්වාකාරයෙන් නො ලැබෙති.

270. අසංඥභූමි අපායභූමීන්හි ආයඝීයෝ නො ලැබෙත්. ඉතිරි භූමීන්හි ආයඝීයෝ ද අනායඝීයෝ ද යන සියල්ලෝ ම ලැබෙත්.

මෙය මෙහි භූමි චතුෂ්කය යි.

271. අපාය ප්‍රතිසන්ධිය කාමසුගති ප්‍රතිසන්ධිය රූපාවචර ප්‍රතිසන්ධිය අරූපාවචර ප්‍රතිසන්ධිය යන මොහු චතුර්විධ ප්‍රති-සන්ධීහු නම් වෙති.

272. ඒ ප්‍රතිසන්ධීන් අතුරෙන් අකුශල විපාකෝපේක්ෂා සහගත සන්තීරණය වනාහි අපාය භූමියෙහි උපදනා අවස්ථාවෙහි ප්‍රතිසන්ධියවැ එයට පසු භවාංග වී අවසානයෙහි ච්‍යුතිචිත්තය ද වී සිඳෙන්නේ ය. මෙය එකක් වූ අපාය ප්‍රතිසන්ධිය නමි.

273. කුශලවිපාකෝපේක්ෂා සහගත සන්තීරණය වනාහි ජාත්‍යන්ධාදි හීන මනුෂ්‍යයන් හට ද භූම්‍යස්ථ දෙවියන් ඇසුරු කරන විනිපාතික අසුරයෝය යි කියනු ලබන වෛමානික ප්‍රේතයන් හට ද ප්‍රතිසන්ධි භවාංග ච්‍යුති වශයෙන් පවතී.

274. මහාවිපාකයෝ අටදෙන වනාහි සර්වාකාරයෙන් කාම සුගතියෙහි ප්‍රතිසන්ධි භවාංග ච්‍යුති වශයෙන් පවතිත්. මේ නවය කාමසුගති ප්‍රතිසන්ධීහු නම් වෙති. දශප්‍රකාර වූ මේ ප්‍රතිසන්ධිය වනාහි කාමාවචර ප්‍රතිසන්ධිය යන සංඛ්‍යාවට පැමිණේ.

275. ඔවුන් අතුරෙන් සතර අපායෙහි සත්ත්වයන්ගේ ද මනුෂ්‍යයන්ගේ ද විනිපාතික අසුරයන්ගේ ද ආයුඃප්‍රමාණ ගණනාවෙහි නියමයක් නැත.

276. චාතුම්මහාරාජිකානං පන දෙවානං දිබ්බානි පඤ්චවස්ස සතානි ආයුප්පමාණං, මනුස්ස ගණනාය පන නවුති වස්ස සත සහස්සප්පමාණං හොති, තතො චතුග්ගුණං තාවතිංසානං, තතො චතුග්ගුණං යාමානං, තතො චතුග්ගුණං තුසිතානං, තතො චතුග්ගුණං නිම්මාණරතීනං තතො චතුග්ගුණං පරනිම්මිතවසවත්තීනං.

277. නවසතඤ්චෙක වීස - වස්සානං කොටියො තථා,

වස්ස සත සහස්සානි - සට්ඨි ච වසවත්තිසු.

278. පඨමජ්ඣාන විපාකං පඨමජ්ඣාන භූමියං පටිසන්ධි භවංග චුතිවසෙන පවත්තති. තථා දුතියජ්ඣාන විපාකං තතියජ්ඣාන විපාකඤ්ච දුතියජ්ඣාන භූමියං, චතුත්ථජ්ඣාන විපාකං තතියජ්ඣාන භූමියං, පඤ්චමජ්ඣාන විපාකං චතුත්ථජ්ඣාන භූමියං.

279. අසඤ්ඤසත්තානං පන රූපමෙව පටිසන්ධි හොති, තතො පරං පවත්තියං චවන කාලෙච රූප මෙව පවත්තිත්වා නිරුජ්ඣති, ඉමා ජ රූපාවචර පටිසන්ධියො නාම.

280. තෙසු බ්‍රහ්මපාරිසජ්ජානං දෙවානං කප්පස්ස තතියො භාගො ආයුප්පමාණං. බ්‍රහ්මපුරොහිතානං උපඩ්ඪකප්පො. මහා-බ්‍රහ්මානං එකො කප්පො.

281. පරිත්තාභානං ද්වෙ කප්පානි, අප්පමාණාභානං චත්තාරි කප්පානි. ආභස්සරානං අට්ඨකප්පානි.

282. පරිත්තසුභානං සොළසකප්පානි, අප්පමාණසුභානං ද්වත්තිං-සකප්පානි. සුභකිණ්හානං චතු සට්ඨිකප්පානි.

283. වෙහප්ඵලානං අසඤ්ඤසත්තානං ච පඤ්චකප්ප සතානි.

276. චාතුර්මහාරාජික දෙවියන්ගේ වනාහි දිව්‍යමය වූ වර්ෂ පන්සියයක් ආයුඃප්‍රමාණයයි. මනුෂ්‍යගණනාවෙන් වනාහි වර්ෂ අනූලක්‍ෂයක් පමණ වේ. එයට වඩා සතර ගුණයක් වූ කාල ප්‍රමාණය තව්තිසා දෙවියන්ගේ ආයුඃප්‍රමාණය වේ. එයට වඩා සතර ගුණයක් වූ කාල ප්‍රමාණය යාම දෙවියන්ගේ ආයුඃ ප්‍රමාණය වේ. එයට වඩා සතර ගුණයක් වූ කාලය තුෂිත දෙවියන්ගේ ආයුඃ ප්‍රමාණය වේ. එයට වඩා සතර ගුණයක් වූ කාලය නිර්මාණරතී දෙවියන්ගේ ආයුඃප්‍රමාණය වේ. එයට වඩා සතර ගුණයකින් වූ කාල ප්‍රමාණය පරනිර්මිතවශවර්ති දෙවියන්ගේ ආයුඃ ප්‍රමාණය වේ.

277. මනුෂ්‍ය වර්ෂයන් පිළිබඳ වූ නවසියවිසි එක්කෝටියක් හා වර්ෂ සැට ලක්‍ෂයක් පරනිර්මිත වශවර්ති දිව්‍යලෝකයෙහි ආයුඃප්‍රමාණයයි.

278. ප්‍රථමධ්‍යාන විපාකය ප්‍රථමධ්‍යාන භූමියෙහි ප්‍රතිසන්ධි භවාංග ච්‍යුති වශයෙන් පවතී. එසේ ම ද්විතීය ධ්‍යාන විපාකය හා තෘතීය ධ්‍යාන විපාකය ද්විතීයධ්‍යාන භූමියෙහි ද, චතුර්ථ ධ්‍යාන විපාකය තෘතීය ධ්‍යාන භූමියෙහි ද පඤ්චමධ්‍යාන විපාකය චතුර්ත්ථධ්‍යාන භූමියෙහි ද ප්‍රතිසන්ධි භවාංග ච්‍යුති වශයෙන් පවතී.

279. අසංඥ සත්ත්වයන්ට වනාහි රූපය ම ප්‍රතිසන්ධිය වේ. ඉන්පසු ප්‍රවෘත්තියෙහි ද චුතවන කාලයෙහි ද රූපය ම පැවතී නිරුද්ධ වන්නේ ය. මේ සය රූපාවචර ප්‍රතිසන්ධීහු නම් වෙති.

280. ඒ බ්‍රහ්මයන් අතුරෙහි බ්‍රහ්මපාරිෂද්‍ය බ්‍රහ්මයන්ගේ ආයුඃප්‍රමාණය අසංඛ්‍ය කල්පයෙන් තුනෙන් පංගුවකි. බ්‍රහ්ම පුරෝ-හිත බ්‍රහ්මයන්ගේ ආයුඃප්‍රමාණය කල්ප භාගයකි. මහාබ්‍රහ්මයන්ගේ ආයුඃප්‍රමාණය එක් කපෙකි.

281. පරිත්තාභ බ්‍රහ්මයන්ට ආයුෂය දෙ කපෙකි. අප්‍රමාණාභ බ්‍රහ්මයන්ට ආයුෂය සතර කපෙකි. ආභස්සර බ්‍රහ්මයන්ට ආයුෂය අට කපෙකි.

282. පරිත්තශුභයන්ට සොළොස් කපෙකි. අප්‍රමාණශුභයන්ට දෙතිස් කපෙකි. ශුභකීර්ණයන්ට සූසැට කපෙකි.

283. වෘහත්ඵලවාසීන්ට හා අසංඥ සත්ත්වයන්ට කල්ප පන්සියයෙකි.

284. අවිභානං කප්පසහස්සානි. අතප්පානං ද්වෙ කප්ප සහස්සානි, සුදස්සානං චත්තාරි කප්ප සහස්සානි, සුදස්සීනං අට්ඨකප්ප සහස්සානි, අකනිට්ඨානං සොළස කප්ප සහස්සානි.

285. පඨමාරුප්පාදි විපාකානි යථාක්කමං පඨමාරුප්පාදි භූමීසු පටිසන්ධි භවංග චුති වසෙන පවත්තන්ති. ඉමා චතස්සො ආරුප්ප පටිසන්ධියො නාම.

286. තෙසු ආකාසානඤ්චායතනූපගානං දේවානං වීසති කප්පසහස්සානි ආයුප්පමාණං, විඤ්ඤාණඤ්චායතනූපගානං දෙවානං චත්තාලීස කප්පසහස්සානි, ආකිඤ්චඤ්ඤායතනූපගානං දෙවානං සට්ඨිකප්පසහස්සානි, නෙවසඤ්ඤා නාසඤ්ඤායතනූපගානං දෙවානං චතුරාසීති කප්පසහස්සානි ආයුප්පමාණං.

287. පටිසන්ධි භවංගඤ්ච - තථා චවන මානසං,

එකමෙව තථෙවෙක - විසයඤ්චෙක ජාතියං.

ඉදමෙත්ථ පටිසන්ධි චතුක්කං.

288. ජනක මුපත්ථම්භක මුපපීළක මුපඝාතකඤ්චෙති කිච්චවසෙන.

289. ගරුක මාසන්න මාචිණ්ණං කටත්තා කම්මඤ්චෙති පාකදාන පරියායෙන.

290. දිට්ඨධම්මවෙදනීයං උපපජ්ජවෙදනීයං අපරාපරියවෙදනීයං අහොසිකම්මඤ්චෙති පාකකාල වසෙන චත්තාරි කම්මානි නාම.

291. තථා අකුසලං කාමාවචරකුසලං රූපාවචර කුසලං අරූපාවචර කුසලඤ්චෙති පාකට්ඨාන වසෙන.

292. තත්ථ අකුසලං කායකම්මං වචීකම්මං මනො කම්මඤ්චෙති කම්මද්වාරවසෙන තිවිධං හොති.

284. අවිහයන්ට කල්ප දහසෙකි. අතප්පයන්ට කල්ප දෙදහසෙකි. සුදර්ශයන්ට කල්ප සාරදහසෙකි. සුදර්ශීන්ට කල්ප අටදහසෙකි. අකනිෂ්ඨයන්ට කල්ප සොළොස්දහසෙකි.

285. ප්‍රථමාරූප්‍යාදි විපාකයෝ ද පිළිවෙළින් ප්‍රථමාරූප්‍යාදි භූමීන්හි ප්‍රතිසන්ධි භවාංග ච්‍යුති වශයෙන් පවතිත්.

මේ සතර ආරූප්‍ය ප්‍රතිසන්ධීහු නම් වෙති.

286. ඔවුනතුරෙන් ආකාසනඤ්චායතනූපග දෙවියන්ගේ ආයුඃප්‍රමාණය කල්ප විසිදහසෙකි. විඤ්ඤාණඤ්චායතනූපග දෙවි-යන්ගේ කල්ප සතලිස්දහසෙකි. ආකිඤ්චඤ්ඤායතනූපග දෙවියන්ගේ කල්ප සැට දහසෙකි. නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපග දෙවියන් ගේ ආයුඃප්‍රමාණය කල්ප සුවාසූදහසකි.

287. එක් භවයෙක්හි ප්‍රතිසන්ධිය ද, භාවාංග ද, ච්‍යුති චිත්තය ද එකක් ම වන්නේ ය. එක් අරමුණක් ඇත්තේ ද වන්නේ ය.

මෙය මෙහි ප්‍රතිසන්ධි චතුෂ්කය යි.

288. ජනක කර්මය උපස්ථම්භක කර්මය උපපීඩක කර්මය උපඝාතක කර්මය යි කෘත්‍යය වශයෙන් කර්ම සතරෙකි.

289. ගරුක කර්මය ආසන්න කර්මය ආචීර්ණක කර්මය කෘතත්වාත් කර්මය යි විපාකදාන ක්‍රමයෙන් කර්ම සතරෙකි.

290. දෘෂ්ට ධර්ම වේද්‍ය කර්මය උපපද්‍ය වේද්‍ය කර්මය අපරාපර්‍ය්‍ය වේද්‍ය කර්මය අහෝසි කර්මය යි විපාක කාල වශයෙන් කර්ම සතරෙකි.

291. එසේ ම අකුශලය, කාමාවචර කුශලය, රූපාවචර කුශලය, අරූපාවචර කුශලය යි විපාක දෙන ස්ථානයන්ගේ වශයෙන් කර්ම සතරෙකි.

292. ඒ කර්මයන් අතුරෙන් අකුශලකර්මය කාය කර්මය වචීකර්මය මනෝ කර්මය යි කර්මද්වාර වශයෙන් ත්‍රිවිධ වන්නේ ය.

293. කථං? පාණාතිපාතො අදින්නාදානං කාමෙසුමිච්ඡාරො චෙති කායවිඤ්ඤත්ති සංඛාතෙ කායද්වාරෙ බාහුල්ලවුත්තිතො කායකම්මං නාම.

294. මුසාවාදො පිසුණාවාචා ඵරුසාවාචා සම්පප්ඵලාපො චෙති වචීවිඤ්ඤත්ති සංඛාතෙ වචීද්වාරෙ බාහුල්ලවුත්තිතො වචී-කම්මං නාම.

295. අභිජ්ඣා ව්‍යාපාදො මිච්ඡාදිට්ඨි චෙති අඤ්ඤත්‍රාපි විඤ්ඤත්තියා මනස්මිං යෙව බාහුල්ලවුත්තිතො මනොකම්මං නාම.

296. තෙසු පාණාතිපාතො ඵරුසාවාචා ව්‍යාපාදො ච දොසමූලෙන ජායන්ති.

297. කාමෙසු මිච්ඡාචාරො අභිජ්ඣා මිච්ඡාදිට්ඨි ච ලොභමූලෙන ජායන්ති.

298. සෙසානි චත්තාරිපි ද්විහි මූලෙහි සම්භවන්ති.

399. චිත්තුප්පාද වසෙන පනෙතං අකුසලං සබ්බථාපි ද්වාදසවිධං හොති.

300. කාමාවචර කුසලම්පි කායද්වාරෙ පවත්තං කායකම්මං වචීද්වාරෙ පවත්තං වචීකම්මං මනොද්වාරෙ පවත්තං මනොකම්මඤ්චෙති කම්මද්වාර වසෙන තිවිධං හොති.

301. තථා දාන සීල භාවනා වසෙන.

302. චිත්තුප්පාද වසෙන පනෙතං අට්ඨවිධං හොති.

303. දාන සීල භාවනා අපචායන වෙය්‍යාවච්ච පත්තිදාන පත්තානුමොදන ධම්මසවන ධම්ම දෙසනා දිට්ඨිජ්ජුකම්ම වසෙන දසවිධං හොති.

304. තං පනෙතං වීසති විධම්පි කාමාවචර කම්ම මිච්චෙව සංඛං ගච්ඡති.

293. කෙසේද යත්? පාණාතිපාතය අදත්තාදානය කාම මිත්ථ්‍යාචාරය යන මොහු කායවිඥප්තිය යි කියන ලද කායද්වාරයෙහි බොහෝ සෙයින් පවත්නා බැවින් කායකර්ම නම් වෙති.

294. මුසාවාදය පිශුනවචනය පරුෂවචනය සම්ඵප්‍රලාපය යන මොහු වාග්විඥප්ති සංඛ්‍යාත වාග්ද්වාරයෙහි බොහෝ කොට පවත්නා බැවින් වාක් කර්ම නම් වෙති.

295. අභිධ්‍යාව ව්‍යාපාදය මිථ්‍යාදෘෂ්ටිය යන මොහු විඥප්තියෙන් තොරව සිතෙහි ම බොහෝ සෙයින් පවත්නා බැවින් මනඃකර්ම නම් වෙති.

296. ඔවුන් අතුරෙන් ප්‍රාණාතිපාතය පරුෂ වචනය ව්‍යාපාදය යන මොහු ද්වේෂමූලයෙන් උපදිති.

297. කාමමිත්ථ්‍යාචාරය අභිධ්‍යාව මිථ්‍යාදෘෂ්ටිය යන මොහු ලෝභ මූලයෙන් උපදිති.

298. ඉතිරි සතර මූල දෙකින් ම උපදිති.

999. චිත්තෝත්පාද වශයෙන් වනාහි ඒ අකුශලය සර්වාකාරයෙන් දොළොස් වැදෑරුම් වේ.

300. කාමාවචර කුශලය ද කායද්වාරයෙහි පැවැත්තේ කායකර්මයයි ද වාග්ද්වාරයෙහි පැවැත්තේ වාක්කර්මය යි ද මනෝද්වාරයෙහි පැවැත්තේ මනෝ කර්මය යි දැයි කර්මද්වාර වශයෙන් ත්‍රිවිධ වේ.

301. එසේම දාන ශීල භාවනා වශයෙන් ද ත්‍රිවිධ වේ.

302. චිත්තෝත්පාද වශයෙන් වනාහි එය අට වැදෑරුම් වේ.

303. දානය ශීලය භාවනාවය අපචායනය වෙය්‍යාවච්චය පත්තිදානය පත්තානුමෝදනය ධම්මසවනය ධම්මදේසනාය දිට්ඨිජ්ජුකම්මය යන මොවුන් ගේ වශයෙන් දශවැදෑරුම් වේ.

304. විසි වැදෑරුම් වූ මේ කර්මය වනාහි කාමාවචර කර්මය යන ගිණීමට පැමිණේ.

305. රූපාවචර කුසලම්පන මනොකම්ම මෙව, තඤ්ච භාවනාමයං, අප්පනාප්පත්තං ඣානංග භෙදෙන පඤ්චවිධං හොති.

306. තථා අරූපාවචර කුසලඤ්ච මනොකම්මං. තම්පි භාවනාමයං, අප්පනාප්පත්තං. ආලම්බන භෙදෙන චතුබ්බිධං හොති.

307. එත්ථාකුසලකම්ම මුද්ධච්චරහිතං අපායභූමිං පටිසන්ධිං ජනෙති. පවත්තියං පන සබ්බම්පි ද්වාදසවිධං සත්තාකුසලපාකානි සබ්බත්ථාපි කාමලොකෙ රූපලොකෙ ච යථාරහං විපච්චති.

308. කාමාවචර කුසලම්පි කාමසුගතියමෙව පටිසන්ධිං ජනෙති, තථා පවත්තියඤ්ච මහා විපාකානි, අහේතුක විපාකානි පන අට්ඨ සබ්බත්ථාපි කාමලොකෙ රූපලොකෙ ච යථාරහං විපච්චති.

309. තත්ථාපි තිහෙතුක මුක්කට්ඨං කුසලං තිහේතුකං පටිසන්ධිං දත්වා පවත්තෙ සොළස විපාකානි විපච්චති.

310. තිහෙතුක මොමකං ද්විහෙතුක මුක්කට්ඨඤ්ච කුසලං ද්විහේතුකං පටිසන්ධිං දත්වා පවත්තෙ තිහෙතුක රහිතානි ද්වාදස විපාකානි විපච්චති.

311. ද්විහේතුක මොමකං පන කුසලං අහේතුකං පටිසන්ධිං දත්වා පවත්තෙ අහෙතුක විපාකානෙව විපච්චති.

312. අසංඛාරං සසංඛාර - විපාකානි න පච්චති.

සසංඛාර මසංඛාර - විපාකානීති කෙනච

313. තෙසං ද්වාදස පාකානි - දසට්ඨ ච යථාක්කමං,

යථාවුත්තානු සාරෙන - යථා සම්භව මුද්දිසෙ.

305. රූපාවචර කුශලය වනාහි මනඃකර්මමය. එද භාවනා-මයය, අර්පණාප්‍රාප්තිය, ධ්‍යානාංග භේදයෙන් පස් වැදෑරුම් වන්නේ ය.

306. එසේ ම අරූපාවචර කුශලය ද මනඃකර්මමය ය. එද භාවනාමයය, අර්පණාප්‍රාප්තය, ආරම්මණ භේදයෙන් චතුර්විධය.

307. මේ කර්මයන් අතුරෙන් ඖද්ධත්‍යසහගත කර්මයෙන් අන්‍ය වූ අකුශල කර්මය අපාය භූමියෙහි ප්‍රතිසන්ධිය ගෙන දේ. ප්‍රවෘත්ති කාලයෙහි වනාහි සියලු දොළොස් වැදෑරුම් වූ අකුශලය ම සතක් වූ අකුශල විපාකයන් සර්වාකාරයෙන් කාමලෝකයෙහි හා රූප ලෝකයෙහි සුදුසු පරිදි ගෙන දේ.

308. කාමාවචර කුශලය ද කාමසුගතියෙහි ම ප්‍රතිසන්ධිය ගෙන දෙයි. එසේ ප්‍රවෘත්ති කාලයෙහි ද මහා විපාක අට උපදවයි. අහේතුක විපාක අට වනාහි කාමලෝක, රූපලෝක දෙක්හි ම සුදුසු පරිදි විපාක භාවයෙන් උපදිති.

309. ඔවුන් අතුරෙන් ද ත්‍රිහේතුක උත්කෘෂ්ට කුශලය ත්‍රිහේතුක ප්‍රතිසන්ධිය දී ප්‍රවෘත්ති කාලයෙහි ෂෝඩශ විපාකයන් උපදවයි.

310. ත්‍රිහේතුකෝමක කුශලය හා ද්විහේතුකෝත්කෘෂ්ට කුශලය ද්විහේතුක ප්‍රතිසන්ධිය ගෙන දී ප්‍රවෘත්තියෙහි ත්‍රිහේතුක රහිත වූ දොළොස් විපාකයන් උපදවයි.

311. ද්විහේතුකෝමක කුශලය වනාහි අහේතුක ප්‍රතිසන්ධිය දී ප්‍රවෘත්තියෙහි ද අහේතුක විපාකයන් ම උපදවයි.

312. අසංස්කාරික කුශලකර්මය සසංස්කාරික විපාක නො දෙන්නේය යි ද සසංස්කාරික කර්මය අසංස්කාරික විපාක නො දෙන්නේය යි ද සමහර ආචාර්ය කෙනෙක් කියති.

313. ඔවුන්ගේ මතයෙහි කියන ලද ක්‍රමයට අනුව ඒ ඒ කර්මයන්ට ලැබෙන පරිද්දෙන් ත්‍රිහේතුකෝත්කෘෂ්ට කර්මාදීන්ගේ විපාකයෝ දොළොස් දෙනෙක් ද දශ දෙනෙක් ද අටදෙනෙක් ද කියන්නේ ය.

314. රූපාවචර කුසලම්පන පඨමජ්ඣානං පරිත්තං භාවෙත්වා බ්‍රහ්මපාරිසජ්ජේසු උප්පජ්ජති. තදෙව මජ්ඣිමං භාවෙත්වා බ්‍රහ්ම පුරොහිතෙසු. පණීතං භාවෙත්වා මහාබ්‍රහ්මෙසු.

315. තථා දුතියජ්ඣානං තතියජ්ඣානඤ්ච පරිත්තං භාවෙත්වා පරිත්තාභෙසු. මජ්ඣිමං භාවෙත්වා අප්පමාණාභෙසු. පණීතං භාවෙත්වා ආභස්සරෙසු.

316. චතුත්ථජ්ඣානං පරිත්තං භාවෙත්වා පරිත්තසුභෙසු. මජ්ඣිමං භාවෙත්වා අප්පමාණසුභෙසු. පණීතං භාවෙත්වා සුභකිණ්හෙසු.

317. පඤ්චමජ්ඣානං භාවෙත්වා වෙහප්ඵලෙසු. තමෙව සඤ්ඤා විරාගං භාවෙත්වා අසඤ්ඤසත්තෙසු. අනාගාමිනො පන සුද්ධාවාසෙසු උප්පජ්ජන්ති.

318. අරූපාවචර කුසලඤ්ච යථාක්කමං භාවෙත්වා ආරුප්පෙසු උප්පජ්ජන්ති.

319. ඉත්ථං මහග්ගතං පුඤ්ඤං - යථා භූමි වවත්ථිතං,

ජනෙති සදිසං පාකං - පටිසන්ධිප්පවත්තියං.

ඉදමෙත්ථ කම්මචතුක්කං.

320. ආයුක්ඛයෙන කම්මක්ඛයෙන උභයක්ඛයෙන උපච්ඡෙදක කම්මුනා චෙති චතුධා මරණුප්පත්ති නාම.

321. තථාච මරන්තානං පන මරණකාලෙ යථාරහං අභිමුඛීභූතං භවන්තරෙ පටිසන්ධිජනකං කම්මං වා තං කම්මකරණකාලෙ රූපාදික මුපලද්ධ පුබ්බ මුපකරණ භූතඤ්ච කම්මනිමිත්තං වා අනන්තර මුප්පජ්ජමාන භවෙ උපලභිතබ්බං උපභොග භූතං ගතිනිමිත්තං වා කම්මබලෙන ජන්නං ද්වාරානං අඤ්ඤතරස්මිං පච්චුපට්ඨාති.

314. රූපාවචර කුශලය වනාහි ප්‍රථමධ්‍යානය පරිත්ත වශයෙන් වඩා බ්‍රහ්මපාරිෂද්‍ය දේවතාවන් කෙරෙහි උපදී. එය ම මධ්‍යම වශයෙන් වඩා බ්‍රහ්මපුරෝහිත දේවතාවන් කෙරෙහි උපදී. ප්‍රණීත වශයෙන් වඩා මහාබ්‍රහ්ම දේවතාවන් කෙරෙහි උපදී.

315. එසේ ම ද්විතීයධ්‍යානය හා තෘතීයධ්‍යානය පරිත්ත වශයෙන් වඩා පරිත්තාභ දේවතාවන් කෙරෙහි ද මධ්‍යම වශයෙන් වඩා අප්‍රමාණාභ දේවතාවන් කෙරෙහි ද ප්‍රණීත වශයෙන් වඩා ආභස්සර දේවතාවන් කෙරෙහි ද උපදී.

316. චතුර්ථධ්‍යානය පරිත්ත වශයෙන් වඩා පරිත්ත සුභ දේවතාවන් කෙරෙහි ද එය ම මධ්‍යම වශයෙන් වඩා අප්පමාණසුභ දේවතාවන් කෙරෙහි ද ප්‍රණීත වශයෙන් වඩා සුභකිණ්හ දේවතාවන් කෙරෙහි ද උපදී.

317. පඤ්චමධ්‍යානය වඩා වේහප්ඵලයෙහි ද, එය ම සංඥ විරාග වශයෙන් වඩා අසංඥ තලයෙහි ද උපදී. අනාගාමීහු වනාහි ශුද්ධාවාසයෙහි උපදිති.

318. අරූපාවචර කුශලය ද ක්‍රමයෙන් වඩා අරූප භූමීන්හි උපදිති.

319. කියන ලද ආකාරයෙන් ඒ ඒ භූමියට නියම කරන ලද මහද්ගත කුශලය ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති දෙක්හි තමා හා සමාන වූ විපාකය උපදවන්නේ ය.

මෙය මෙහි කර්ම චතුෂ්කය ය.

320. ආයුෂය ගෙවීමෙන් ද කර්මය ගෙවීමෙන් ද දෙක ම ගෙවීමෙන් ද උපච්ඡේදක කර්මයෙන්ද යි මෙසේ මරණෝත්පත්තිය සතර ආකාර වන්නේ ය.

321. එසේ මැරෙන්නා වූ සත්ත්වයන්ට වනාහි මරණාසන්න කාලයෙහි සුදුසු පරිද්දෙන් අභිමුඛ වූ දෙවන ජාතියෙහි ප්‍රතිසන්ධිය ඇතිකරන්නා වූ කර්මය හෝ ඒ කර්මය කරන්නා වූ කාලයෙහි චක්ෂුර්ද්වාරාදියෙන් ලැබුවා වූ කර්මය කිරීමට උපකරණ වූ කර්මනිමිත්ත හෝ අනතුරු වැ උපදනා ජාතියෙහි ලැබිය යුතු වූ අනුභව කටයුතු වූ ගති නිමිත්ත හෝ කර්ම බලයෙන් ෂඩ්ද්වාරයන් අතුරෙන් එක්තරා ද්වාරයෙක්හි වැටහෙන්නේ ය.

**322**. තතො පරං තමෙව තථො පටිග්ගිතං ආරම්මණං ආරබ්භ විපච්චමානක කම්මානුරූපං පරිසුද්ධ මුපක්කිලිට්ඨං වා උප්පජ්ජිතබ්බ භවානුරූපං තත්ථොනතංව චිත්තසන්තානං අභිණ්හං පවත්තති බාහුල්ලෙන, තමෙව වා පන ජනකභූතං කම්මං අභිනව කරණ වසෙන ද්වාරප්පවත්තං හොති.

**323**. පච්චාසන්න මරණස්ස පන තස්ස වීථිචිත්තාවසානෙ භවංගක්ඛයෙ වා චවන වසෙන පච්චුප්පන්නභව පරියොසාන භූතං චුති චිත්ත මුප්පජ්ජිත්වා නිරුජ්ඣති.

**324**. තස්මිං නිරුද්ධාවසානෙ තස්සානන්තර මෙව තථා ගහිතං ආරම්මණ මාරබ්භ සවත්ථුකං අවත්ථුක මෙව වා යථාරහං අවිජ්ජානුසය පරික්ඛිත්තෙන තණ්හානුසය මූලකෙන සංඛාරෙන ජනීයමානං සම්පයුත්තෙහි පරිග්ගය්හමානං සහජාතානමධිට්ඨාන භාවෙන පුබ්බංගමභූතං භවන්තර පටිසන්ධාන වසෙන පටිසන්ධි සංඛාතං මානසං උප්පජ්ජමානමෙව පතිට්ඨාති භවන්තරෙ.

**325**. මරණාසන්න වීථියං පනෙත්ථ මන්දප්පවත්තානි පඤ්චෙව ජවනානි පාටිකංඛිතබ්බානි. තස්මා ය දි පච්චුප්පන්නාරම්මණෙසු ආපාථගතෙසු ධරන්තෙස්වෙ ව මරණං හොති, තදා පටිසන්ධි භවංගානම්පි පච්චුප්පන්නාරම්මණතා ලබ්භතීති කත්වා කාමාවචර පටිසන්ධියා ඡද්වාරගහිතං කම්මනිමිත්තං ගතිනිමිත්තඤ්ච පච්චුප්පන්න මතීතාරම්මණං උපලබ්භති. කම්මං පන අතීත මෙව, තංච මනොද්වාර ගහිතං, තානි පන සබ්බානි පි පරිත්ත ධම්ම භූතානෙවාරම්මණානි.

**326**. රූපාවචර පටිසන්ධියා පන පඤ්ඤත්තිභූතං කම්මනිමිත්ත මෙවාරම්මණං හොති.

**327**. තථා අරූපාවචර පටිසන්ධියා ච මහග්ගතභූතං පඤ්ඤත්ති භූතඤ්ච කම්මනිමිත්ත මෙව යථාරහ මාරම්මණං හොති.

**322.** එයින් පසු එසේ එළඹ සිටියා වූ ආරම්මණය අරමුණු කොට විපාක භාවයට පැමිණෙන කර්මයට අනුරූප පරිදි පිරිසිදු වූ හෝ කිලිටි වූ හෝ ඉපදිය යුතු භවයට අනුරූප වූ චිත්තසන්තානය ඒ භවයට නැමී පවත්නාක් මෙන් බොහෝ සෙයින් නිරතුරුව පවත්නේ ය. නොහොත් ප්‍රතිසන්ධිජනක වූ ඒ කර්මය අලුත් කිරීම් වශයෙන් ද්වාරයන්හි පැවැත්තේ වන්නේ ය.

**323.** ළංවූ මරණය ඇති වූ පුද්ගලයා හට වනාහි වීථිචිත්තාවසානයෙහි හෝ භවාංග චිත්තාවසානයෙහි හෝ ඒ භවයෙන් පහවීම් වශයෙන් වර්තමාන භවයාගේ අවසානය වූ ච්‍යුති චිත්තය ඉපද නිරුද්ධ වේ.

**324.** එය නිරුද්ධ වී අවසානයෙහි එයට අනතුරුව මැ එසේ ගන්නා ලද අරමුණ ගෙන හෘදයවස්තු සහිත වූ හෝ හෘදයවස්තු රහිත වූ හෝ සුදුසු පරිද්දෙන් අවිද්‍යානුශයෙන් පිරිවරන ලද්ද වූ තෘෂ්ණානුශය මුල්කොට ඇත්තා වූ කර්මයෙන් උපදවනු ලබන්නා වූ සම්ප්‍රයුක්ත චෛතසික ධර්මයන් විසින් පිරිවරන ලද්දා වූ එක්ව උපදනා චෛතසික ධර්මයන්හට පිහිට බැවින් පූර්වාංගම වූ පූර්වභවය පශ්චිමභවය හා ගැලපීම් වශයෙන් ප්‍රතිසන්ධියයි කියන ලද සිත උපදනේ ම භවාන්තරයෙහි පිහිටන්නේ ය.

**325.** මෙහි මරණාසන්න වීථියෙහි වනාහි දුබලවැ පවත්නා වූ පසක් වූ ම ජවනයෝ කැමති විය යුත්තාහු ය. එහෙයින් වර්තමානාරම්මණයන් කර්ම නිමිත්ත ගති නිමිත්ත වශයෙන් වැටහුණු කල්හි ඒ අරමුණු පවතිද්දී ම ඉදින් මරණය වී නම් එකල්හි ප්‍රතිසන්ධි භවාංග චිත්තයන්ගේ ද වර්තමානාරම්මණය අරමුණු කොට ඇති බව ලැබෙන හෙයින් කාමාවචර ප්‍රතිසන්ධියට ෂඩ්ද්වාරයෙන් ගන්නා ලද කර්මනිමිත්ත හා ගති නිමිත්ත වර්තමානාලම්බණව ද අතීතාරම්මණ ව ද ලැබේ. කර්මය වනාහි අතීත ම ය. එද මනෝද්වාරයෙන් ගන්නා ලද්දක් ම වන්නේ ය. ඒ සියල්ල ම කාමධර්ම වූ ආරම්මණයෝ ම ය.

**326.** රූපාවචර ප්‍රතිසන්ධියට වනාහි ප්‍රඥප්ති වූ කර්ම නිමිත්ත ම අරමුණු වේ.

**327.** එසේ ම අරූපාවචර ප්‍රතිසන්ධියට ද මහද්ගතවූ ද ප්‍රඥප්ති වූ ද කර්ම නිමිත්ත ම සුදුසු පරිද්දෙන් අරමුණු වේ.

328. අසඤ්ඤසත්තානං පන ජීවිත නවක මෙව පටිසන්ධි භාවෙන පතිට්ඨාති. තස්මා තෙ රූප පටිසන්ධිකා නාම. අරූපා අරූප පටිසන්ධිකා. සෙසා රූපාරූප පටිසන්ධිකා.

329. ආරුප්පචුතියා හොන්ති - හෙට්ඨිමාරුප්ප වජ්ජිතා

පරමාරුප්ප සන්ධී ච - තථා කාමෙ තිහෙතුකා.

330. රූපාවචරචුතියා - අහෙතුරහිතා සියුං,

සබ්බාකාම තිහෙතුම්හා - කාමෙස්වෙව පනෙතරා

අයමෙත්ථ චුති පටිසන්ධික්කමො.

331. ඉච්චෙවං ගහිත පටිසන්ධිකානං පන පටිසන්ධිනිරොධානන්තරතො පභුති තමෙවාලම්බන මාරබ්භ තදෙව චිත්තං යාව චුති චිත්තුප්පාදා අසති වීථිචිත්තුප්පාදෙ භවස්ස අංගභාවෙන (භවංගසන්තති සංඛාතං මානසං) අබ්බොච්ඡින්නං නදීසොතො විය පවත්තති. පරියොසානෙ ච චවන වසෙන චුතිචිත්තං හුත්වා නිරුජ්ඣති, තතො පරඤ්ච පටිසන්ධාදයො රථ චක්කමිව යථාක්කමං එවමෙව පරිවත්තන්තා පවත්තන්ති.

332. පටිසන්ධි භවංග වීථියො -

චුති චෙහ තථා භවන්තරෙ,

පුනසන්ධි භවංග මිච්චයං -

පරිවත්තති චිත්ත සන්තති.

333. පටිසංඛාය පනෙත මද්ධුවං

අධිගන්ත්වා පදමච්චුතං බුධා,

සුසමුච්ඡින්න සිනෙහ බන්ධනා

සම මෙස්සන්ති චිරාය සුබ්බතා.

ඉති අභිධම්මත්ථ සංගහෙ වීථිමුත්ත සංගහ විභාගො නාම
පඤ්චමො පරිච්ඡෙදො

328. අසංඥසත්වයන්හට වනාහි ජීවිත නවක රූප කලාපය ම ප්‍රතිසන්ධිභාවයෙන් පිහිටන්නේ ය. එහෙයින් ඔවුහු රූපප්‍රතිසන්ධි-කයෝ ය. අරූපී සත්ත්වයෝ අරූපප්‍රතිසන්ධිකයෝ ය. සෙස්සෝ රූපාරූප ප්‍රතිසන්ධිකයෝ ය.

329. අරූපාවචර චුතිය කෙරෙන් පරව යට යට අරූපායන් වර්ජිත අරූපාවචර ප්‍රතිසන්ධීහු ද එසේ ම කාමභවයෙහි ත්‍රිහේතුක ප්‍රතිසන්ධීහු ද වෙති.

330. රූපාවචර ච්‍යුතිය කෙරෙන් අහේතුක ප්‍රතිසන්ධිය හැර ඉතිරි ප්‍රතිසන්ධීහු වන්නාහුය. කාම ත්‍රිහේතුක ච්‍යුතිය කෙරෙන් සියලු ම පතිසන්ධීහු වෙති. ඉතිරි ච්‍යුතීන් කෙරෙන් කාමභවයෙහි ම ප්‍රතිසන්ධීහු වන්නාහුය.

මෙය මෙහි චුති ප්‍රතිසන්ධි ක්‍රමයයි.

331. මෙසේ ගන්නා ලද ප්‍රතිසන්ධි ඇත්තවුන්ගේ ප්‍රතිසන්ධි නිරෝධානන්තරයෙහි පටන් ඒ අරමුණ ම අරමුණු කොට ඒ සිත ම ච්‍යුතිචිත්තය උපදනාතුරු වීථිචිත්තයන්ගේ ඉපදීමක් නැති කල්හි භවයාගේ පැවැත්මට හේතු භාවයෙන් (භවාංග සන්තතියයි කියන ලද චිත්තය) නො සිඳී ගංගාප්‍රවාහයක් මෙන් පවතී. අවසානයෙහි භවයෙන් පහවීම් වශයෙන් ච්‍යුතිචිත්තය වී නිරුද්ධ වන්නේය. ඉන්පසු ද ප්‍රතිසන්ධ්‍යාදීහු රිය සකක් මෙන් ක්‍රමයෙන් මෙසේ ම පෙරළෙමින් පවත්නාහු ය.

332. මේ භවයෙහි ප්‍රතිසන්ධි භවාංග වීථීහු ද ච්‍යුතිය ද යන මොහු යම් සේ ද එසේ ම භවාන්තරයෙහි නැවත ප්‍රතිසන්ධිය ද භවාංග යනාදී වූ ද මේ චිත්ත සන්තතිය පෙරළෙන්නී ය.

333. මෙය අස්ථිර බව නුවණින් මෙනෙහි කොට ප්‍රාඥයෝ බොහෝ කලක් මනා පැවතුම් ඇතිවැ නො නැසෙන නිර්වාණය ප්‍රත්‍යක්ෂ කොට මනාකොට සිඳින ලද තෘෂ්ණාබන්ධන ඇත්තාහු ඒ නිර්වාණධාතුවට පැමිණෙන්නාහු ය.

මෙය අභිධර්මාර්ථ සංග්‍රහයෙහි වීථිමුක්ත භාගය නම් වූ
පඤ්චම පරිච්ඡේදය යි.

# ඡට්ඨො පරිච්ජෙදො

334. එත්තාවතා විභත්තා හි - සප්පභෙදප්පවත්තිකා,
චිත්තචෙතසිකා ධම්මා - රූපං දානි පවුච්චති.

335. සමුද්දෙසා විභාගා ච - සමුට්ඨානා කලාපතො,
පවත්තික්කමතො චෙති - පඤ්චධා තත්ථ සංගහො.

336. චත්තාරි මහාභූතානි චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපන්ති දුවිධම්පෙතං රූපං එකාදස විධෙන සංගහං ගච්ඡති.

337. කථං? පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු භූතරූපං නාම.

338. චක්ඛු සොතං ඝාණං ජිව්හා කයො පසාදරූපං නාම.

339. රූපං සද්දො ගන්ධො රසො ආපොධාතු විවජ්ජිතං භූතත්තය සංඛාතං පොට්ඨබ්බං ච ගොචරරූපං නාම.

340. ඉත්ථත්තං පුරිසත්තං භාවරූපං නාම.

341. හදයවත්ථු හදය රූපං නාම.

342. ජීවිතින්ද්‍රියං ජීවිතරූපං නාම.

343. කබලීකාරො ආහාරො ආහාර රූපං නාම.

344. ඉතිච අට්ඨාරසවිධම්පෙතං රූපං සභාවරූපං සලක්ඛණරූපං නිප්ඵන්න රූපං රූපරූපං සම්මසනරූපන්ති ච සංඛං ගච්ඡති.

345. ආකාසධාතු පරිච්ඡෙදරූපං නාම.

# ෂෂ්ඨ පරිච්ඡේදය

334. ප්‍රභේද ප්‍රවෘත්ති සහිත වූ චිත්තචෛතසික ධර්මයෝ මෙතෙකින් විභාග කරන ලදී. දැන් රූපය කියනු ලැබේ.

335. රූපයන් සංක්ෂේපයෙන් දැක්වීම් වශයෙන් ද ඒකකාදි විභාග වශයෙන් ද උත්පත්ති හේතුන්ගේ වශයෙන් ද කලාප වශයෙන් ද පවත්නා ක්‍රමයාගේ වශයෙන් ද මෙසේ ඒ රූප පරිච්ඡේද- යෙහි පස් ආකාරයෙන් රූපයන්ගේ සංග්‍රහය වන්නේ ය.

336. සතර මහා භූතයෝය, සතර මහා භූතයන් නිසා පවත්නා රූපයෝය කියා දෙවැදෑරුම් වූ මේ රූපය එකොළොස් අයුරින් සංග්‍රහයට යේ.

337. කෙසේද? පෘථිවිධාතුව ද ආපෝධාතුව ද තේජෝ ධාතුව ද වායෝ ධාතුව ද **භූත රූප** නම් වේ.

338. චක්ෂුඃප්‍රසාදය ද ශ්‍රෝත්‍ර ප්‍රසාදය ද ඝ්‍රාණප්‍රසාදය ද ජිහ්වාප්‍රසාදය ද කායප්‍රසාදය ද **ප්‍රසාද රූප** නම් වේ.

339. රූපය ද ශබ්දය ද ගන්ධය ද රසය ද ආපෝ ධාතුවර්ජිත භූතත්‍රයයි කියන ලද ස්ප්‍රෂ්ටව්‍යය ද යන මෙය **ගෝචර රූප** නම්.

340. ස්ත්‍රීත්වය ද පුරුෂත්වය ද **භාවරූප** නම්.

341. හෘදය වස්තුව **හෘදය රූප** නම්.

342. ජීවිතේන්ද්‍රිය **ජීවිතරූප** නම්.

343. කබලීකාර ආහාරය **ආහාර රූප** නම්.

344. මෙසේ අටළොස් වැදෑරුම් වූ ද මේ රූපය ස්වභාව- රූපය සලක්ෂණරූපය නිෂ්පන්නරූපය රූපරූපය යන ව්‍යවහාරයට ද පැමිණේ.

345. ආකාශ ධාතුව **පරිච්ඡේද රූප** නම්.

**346**. කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති විඤ්ඤත්ති රූපං නාම.

**347**. රූපස්ස ලහුතා මුදුතා කම්මඤ්ඤතා විඤ්ඤත්ති ද්වයඤ්ච විකාරරූපං නාම.

**348**. රූපස්ස උපචයො සන්තති ජරතා අනිච්චතා ලක්ඛණ රූපං නාම.

**349**. ජාතිරූප මෙව පනෙත්ථ උපචය සන්තති නාමෙන පවුච්චති. එකාදස විධම්පෙතං රූපං අට්ඨවීසති විධං හොති සරූප වසෙන.

**350**. කථං?

භූතප්පසාද විසයා - භාවො හදය මිච්චපි

ජීවිතාහාර රූපෙහි - අට්ඨාරස විධං තථා.

පරිච්ඡෙදො ච විඤ්ඤත්ති - විකාරො ලක්ඛණන්ති ච

අනිප්ඵන්නා දස චෙති - අට්ඨවීස විධං භවෙ.

අයමෙත්ථ රූපසමුද්දෙසො.

**351**. සබ්බඤ්ච පනෙතං රූපං අහේතුකං, සප්පච්චයං, සාසවං සංඛතං, ලොකියං, කාමාවචරං, අනාරම්මණං, අප්පහාතබ්බමෙවාති. එකවිධම්පි අජ්ඣත්තික බාහිරාදි වසෙන බහුධා භෙදං ගච්ඡති.

**352**. කථං? පසාද සංඛාතං පඤ්චවිධම්පි අජ්ඣත්තික රූපං නාම. ඉතරං බාහිර රූපං නාම.

**353**. පසාද හදය සංඛාතං ඡබ්බිධම්පි වත්ථුරූපං නාම, ඉතරං අවත්ථුරූපං නාම.

**354**. පසාද විඤ්ඤත්ති සංඛාතං සත්තවිධම්පි ද්වාර රූපං නාම. ඉතරං අද්වාරරූපං නාම.

346. කායවිඥප්තිය ද වාග්විඥප්තිය ද **විඥප්ති රූප** නම්.

347. රූපයාගේ ලඝුත්වය ද මෘදුත්වය ද කර්මණ්‍යතාව ද විඥප්තිද්වය ද **විකාර රූප** නම්.

348. රූපයාගේ උපචය ද සන්තතිය ද ජරතාව ද අනිත්‍යතාව ද **ලක්‍ෂණ** රූප නම්.

349. මෙහි වනාහි ජාතිරූපය ම උපචය සන්තති නාමයෙන් කියනු ලැබේ. එකොළොස් වැදෑරුම් වූ ද මේ රූපය ස්වරූප වශයෙන් අටවිසි වැදෑරුම් වේ.

350. කෙසේද යත්? -

භූතරූපයෝය ප්‍රසාදරූපයෝය විෂයරූපයෝය, භාවරූපය, හෘදයරූපය යන මොහු ජීවිත රූප ආහාර රූපයන් හා අටළොස් වැදෑරුම් වේ. එසේ ම පරිච්ඡේද රූපය විඥප්තිරූපය විකාරරූපය ලක්‍ෂණරූපය යන අනිෂ්පන්නරූපයෝ දසදෙනදැයි අටවිසි වැදෑරුම් වේ.

මෙය මෙහි රූප සමුද්දේශය යි.

351. මේ සියලු රූප වනාහි අහේතුකය ප්‍රත්‍ය සහිතය ආශ්‍රව සහිතය ප්‍රත්‍යයෙන් කරන ලදය ලෞකිකය කාමාවචරය අනාරම්මණය අප්‍රහාතව්‍යය. මෙසේ එක් වැදෑරුම් වූයේ ද, ආධ්‍යාත්මික බාහිරාදි වශයෙන් බහු ප්‍රකාරයෙන් භේදයට යේ.

352. කෙසේද යත්? - ප්‍රසාද සංඛ්‍යාත පඤ්ච ප්‍රකාර රූපය **ආධ්‍යාත්මික රූපය** නම්. ඉතිරි තෙවිසි රූපය **බාහ්‍ය රූප** නම් වේ.

353. ප්‍රසාදරූප හෘදයරූප සංඛ්‍යාත සවැදෑරුම් රූපය **වස්තුරූප** නම්. ඉතිරි දෙවිසි රූපය **අවස්තුරූප** නම්.

354. ප්‍රසාද විඥප්ති සංඛ්‍යාත සත්වැදෑරුම් වූ ද රූපය **ද්වාර රූප** නම්. ඉතිරි එක්විසි රූපය **අද්වාර රූප** නම්.

355. පසාද භාව ජීවිත සංඛාතං අට්ඨවිධම්පි ඉන්ද්‍රිය රූපං නාම. ඉතරං අනින්ද්‍රිය රූපං නාම.

356. පසාද විසය සංඛාතං ද්වාදසවිධම්පි ඔළාරික රූපං සන්තිකෙ රූපං සප්පටිඝරූපං ච. ඉතරං සුඛුමරූපං දූරෙරූපං අප්පටිඝ රූපඤ්ච.

357. කම්මජං උපාදින්න රූපං, ඉතරං අනුපාදින්න රූපං.

358. රූපායතනං සනිදස්සන රූපං. ඉතරං අනිදස්සන රූපං.

359. චක්ඛාදිද්වයං අසම්පත්ත වසෙන ඝාණාදිත්තයං සම්පත්ත වසෙනෙති පඤ්චවිධම්පි ගොචරග්ගාහික රූපං නාම. ඉතරං අගොචරග්ගාහික රූපං.

360. වණ්ණො, ගන්ධො, රසො ඔජා භූත චතුක්කඤ්චෙති අට්ඨවිධම්පි අවිනිබ්භොග රූපං. ඉතරං විනිබ්භොග රූපං.

361. ඉච්චෙව මට්ඨවීසති - විධම්පි ච විචක්ඛණා.

අජ්ඣත්තිකාදි භෙදෙන - විභජන්ති යථාරහං.

අයමෙත්ථ රූප විභාගො.

362. කම්මං, චිත්තං, උතු, ආහාරො චෙති චත්තාරි රූප සමුට්ඨානානි නාම.

363. තත්ථ කාමාවචරං රූපාවචරඤ්චෙති පඤ්ච වීසති විධම්පි කුසලාකුසල කම්ම මභිසංඛතං අජ්ඣත්තික සන්තානෙ කම්ම සමුට්ඨාන රූපං පටිසන්ධිමුපාදාය ඛණෙ ඛණෙ සමුට්ඨාපෙති.

364. ආරුප්ප විපාක ද්විපඤ්ච විඤ්ඤාණ වජ්ජිතං පඤ්චසත්තති විධම්පි චිත්තං චිත්තසමුට්ඨාන රූපං පඨම භවංග මුපාදාය ජායන්තමෙව සමුට්ඨාපෙති.

355. ප්‍රසාද භාව ජීවිත සංඛ්‍යාත අටවැදෑරුම් වූ ද රූපය **ඉන්ද්‍රිය රූප** නමි. ඉතිරි විංශති රූපය **අනින්ද්‍රිය රූප** නමි.

356. ප්‍රසාද විෂය සංඛ්‍යාත දොළොස් වැදෑරුම් රූපය **ඖදාරිකරූප** නමුදු **සන්තිකේරූප** නමුදු **සප්‍රතිඝ රූප** නමුදු වේ. ඉතිරි සොළොස් වැදෑරුම් රූපය **සූක්ෂම රූප** නමුදු **දූරේ රූප** නමුදු **සප්‍රතිඝරූප** නමුදු වේ.

357. අටළොස් වැදෑරුම් කර්මජ රූපය **උපාදින්න රූප** නමි. ඉතිරි දසවැදෑරුම් රූපය **අනුපාදින්න රූප** නමි.

358. රූපායතනය **සනිදර්ශන රූප** නමි. ඉතිරි සත් විසි රූපය **අනිදර්ශන රූප** නමි.

359. චක්ෂුරාදි ප්‍රසාදද්වය තමා කරා නො පැමිණි අරමුණු ගැනීම් වශයෙන් ද ඝ්‍රාණාදිත්‍රය තමා කරා පැමිණි අරමුණු ගැනීම් වශයෙන් ද පඤ්චප්‍රකාර වූ රූපය **ගෝචරග්ගාහික රූප** නමි. ඉතිරි තෙවිසි වැදෑරුම් රූපය **අගෝචරග්ගාහික රූප** නමි.

360. වර්ණය ද ගන්ධය ද රසය ද ඕජාව ද භූත රූප සතර ද යන අටවැදෑරුම් රූපය **අවිනිර්භෝගරූප** නමි. ඉතිරි විසි වැදෑරුම් රූපය **විනිර්භෝග රූප** නමි.

361. මෙසේ අටවිසි වැදෑරුම් වූ රූපය ආධ්‍යාත්මිකාදි භේදයෙන් නුවණැත්තෝ සුදුසු පරිදි බෙදත්.

මෙය මෙහි රූප විභාගය යි.

362. කර්මය ද චිත්තය ද ඍතුව ද ආහාරය ද යන මේ සතර රූපෝත්පාද හේතුහු නම් වෙති.

363. ඒ හේතුන් අතුරෙන් කාමාවචර වූ ද රූපාවචර වූ ද පස්විසි වැදෑරුම් කුශලාකුශල කර්මය අතීත භවයෙහි කරන ලද්දේ ආධ්‍යාත්මික සන්තානයෙහි කර්ම යෙන් උපදවන්නා වූ රූපය ප්‍රතිසන්ධියෙහි පටන් ක්ෂණයක් ක්ෂණයක් පාසා උපදවන්නේ ය.

364. ආරූප්‍ය විපාක ද්විපඤ්ච විඥාන වර්ජිත පන්සැත්තෑ චිත්තය ප්‍රතිසන්ධියට අනතුරුව උපදනා ප්‍රථම භවාංගයේ පටන් තමාගේ උත්පාද ක්ෂණයෙහි චිත්තසමුට්ඨාන රූප උපදවන්නේ ය.

**365**. තත්ථ අප්පනා ජවනං ඉරියාපථම්පි සන්ධානෙති.

**366**. වොත්ථපන කාමාවචර ජවනාභිඤ්ඤා පන විඤ්ඤත්තිම්පි සමුට්ඨාපෙන්ති.

**367**. සොමනස්ස ජවනානි පන තෙරස හසනම්පි ජනෙන්ති.

**368**. සීතුණ්හොතු සමඤ්ඤාතා තෙජොධාතු ඨිතිප්පත්තාව උතුසමුට්ඨාන රූපං අජ්ඣත්තඤ්ච බහිද්ධා ච යථාරහං සමුට්ඨාපෙති.

**369**. ඔජාසංඛාතො ආහාරො ආහාරසමුට්ඨාන රූප අජ්ඣොහරන කාලෙ ඨානප්පත්තොව සමුට්ඨාපෙති.

**370**. තත්ථ හදය ඉන්ද්‍රිය රූපානි කම්මජානෙව.

**371**. විඤ්ඤත්ති ද්වයං චිත්තජමෙව.

**372**. සද්දො චිත්තොතුජො.

**373**. ලහුතාදිත්තයං උතුචිත්තාහාරෙහි සමහොති.

**374**. අවිනිබ්භොගරූපානි චෙව ආකාසධාතු ච චතූහි සම්භූතානි.

**375**. ලක්ඛණරූපානි න කුතොචි ජායන්ති.

**376**. අට්ඨාරස පන්නරස - තෙරස ද්වාදසානි ච
කම්ම චිත්තොතුකාහාර - ජානි හොන්ති යථාක්කමං.

**377**. ජායමානාදි රූපානං - සභාවත්තා හි කෙවලං
ලක්ඛණානි න ජායන්ති - කෙහිචීති පකාසිතං

අයමෙත්ථ රූප සමුට්ඨාන නයො.

365. ඒ චිත්තයන් අතුරෙනුදු සවිසි අර්පණා ජවනය ඊර්යාාපථය ද පවත්වන්නේ ය.

366. ව්‍යවස්ථාපන කාමාවචර ජවන අභිඥ චිත්තයෝ විඥප්තිය ද උපදවති.

367. සොම්නස් ජවන් තෙළෙස හසනය ද උපදවති.

368. ශීතෝෂ්ණ ඍතුය යි කියන ලද තේජෝ ධාතුව ස්ථිතියට පැමිණියේ ඍතුවෙන් හටගන්නා රූප සත්ව සන්තානයෙහි හා ඉන් පිටත ද සුදුසු සේ උපදවන්නේ ය.

369. ඕජාරූපය යි කියන ලද ආහාරය තෙමේ අනුභව කළ කාලයේ දී ස්ථිතියට පැමිණියේ ආහාර සමුට්ඨාන රූප උපදවන්නේ ය.

370. ඒ රූප අතුරෙන් හෘදය ඉන්ද්‍රිය රූපයෝ කර්මජ-යෝ ම ය.

371. විඥප්ති රූපද්වය චිත්තජ ම ය.

372. ශබ්දරූපය චිත්තර්තු දෙකින් හටගන්නේ ය.

373. ලහුතාදි රූප තුන ඍතු චිත්ත ආහාරයන් ගෙන් උපදනේ ය.

374. අවිනිර්භෝග රූප හා ආකාශධාතුව සතරෙන් ම හටගනී.

375. ලක්ෂණ රූපයෝ කිසියම් හේතුවකින් නො හටගනිත්.

376. කර්ම චිත්ත ඍතු ආහාරයන්ගෙන් හට ගන්නා රූපයෝ පිළිවෙළින් අටළොසක් ද පසළොසක් ද තෙළෙසක් ද දොළොසක් ද වෙති.

377. හුදෙක් ලක්ෂණ රූපයෝ හේතුන්ගෙන් හටගන්නා රූපයන්ගේ ඉපදීම ආදි ස්වභාවයන් බැවින් කිසි හේතුවකින් නො උපදනාහුය යි කියන ලදී.

මෙය මෙහි රූප උපදවන හේතුන්ගේ විභාගය යි.

378. එකුප්පාදා එකනිරොධා එකනිස්සයා සහවුත්තිනො එකවීසති රූපකලාපා නාම.

379. තත්ථ ජීවිතං අවිනිබ්භොග රූපකඤ්ච චක්ඛුනා සහ චක්ඛුදසකන්ති වුච්චති. තථා සොතාදීහි සද්ධිං සොතදසකං, ඝාණදසකං, ජිව්හාදසකං, කායදසකං, ඉත්ථිභාවදසකං, පුම්භාවදසකං, වත්ථුදසකඤ්චෙති යථාක්කමං යොජෙතබ්බං. අවිනිබ්භොග රූපමෙව ජීවිතෙන සහ ජීවිත නවකන්ති පවුච්චති. ඉමෙ නව කම්මසමුට්ඨාන කලාපා නාම.

380. අවිනිබ්භොග රූපං පන සුද්ධට්ඨකං තදෙව කායවිඤ්ඤත්තියා සහ කායවිඤ්ඤත්තිනවකං, වචීවිඤ්ඤත්ති සද්දෙහි ච සහ වචීවිඤ්ඤත්ති දසකං, ලහුතාදීහි සද්ධිං ලහුතාදෙකා දසකං, කායවිඤ්ඤත්ති ලහුතාදි ද්වාදසකං, වචීවිඤ්ඤත්ති සද්ද ලහුතාදි තෙරසකඤ්චෙති ඡ චිත්තසමුට්ඨාන කලාපා.

381. සුද්ධට්ඨකං, සද්දනවකං ලහුතාදෙකාදසකං සද්දලහුතාදි ද්වාදසකඤ්චෙති චත්තාරො උතුසමුට්ඨාන කලාපා.

382. සුද්ධට්ඨකං ලහුතාදෙකාදසකඤ්චෙති ද්වෙ ආහාර සමුට්ඨාන කලාපා.

383. තත්ථ සුද්ධට්ඨකං සද්දනවකං චෙති ද්වෙ උතුසමුට්ඨාන කලාපා බහිද්ධා පි ලබ්භන්ති, අවසෙසා පන සබ්බෙපි අජ්ඣත්තිකමෙව.

384. කම්මචිත්තොතුකාහාර - සමුට්ඨානා යථාක්කම
නව ඡ චතුරෝ ද්වෙති - කලාපා එකවීසති.

385. කලාපානං පරිච්ඡෙද - ලක්ඛණත්තා විචක්ඛණා.
න කලාපංගමිච්චාහු - ආකාසං ලක්ඛණානි ච.

අයමෙත්ථ කලාප යොජනා.

378. එක් ඉපදීමක් ඇත්තා වූ ද එක් බිඳීමක් ඇත්තා වූ ද සමාන නිශ්‍රය ඇත්තා වූ ද සමග පැවතුම් ඇත්තා වූ ද එක් විස්ස රූපකලාපයෝ නම් වෙති.

379. ඒ රූපකලාපයන් අතුරෙන් ජීවිතරූපය හා අවනිර්භෝග රූප අට චක්ෂුඃප්‍රසාදය සමග චක්ෂුර් දශකය යි කියනු ලැබේ. එසේ ම ශ්‍රෝත්‍ර ප්‍රසාදාදිය සමග ශ්‍රෝත්‍ර දශකය ඝ්‍රාණදශකය ජිහ්වාදශකය කායදශකය ස්ත්‍රීභාවදශකය පුම්භාවදශකය වස්තු දශකය යි ක්‍රම-යෙන් යෙදිය යුතු. අවිනිර්භෝගරූපය ම ජීවිතරූපය සමඟ ජීවිත නවකයයි කියනු ලැබේ. මේ නවය කර්මයෙන් උපදනා කලාපයෝ ය.

380. අවිනිර්භෝගරූපය වනාහි ශුද්ධාෂ්ටකයයි. එය ම කායවිඥප්ති සහිත වූයේ කායවිඥප්ති නවකය යි. වාග්විඥප්ති ශබ්ද සහිත වූයේ වාග්විඥප්ති දශකය යි. ලහුතාදීන් සමඟ ලහුතාදේකාදශකය යි. කායවිඥප්ති ලහුතාදීන් සමඟ කායවිඥප්ති ලහුතාදි ද්වාදශකය යි. වාග්විඥප්ති ශබ්දලහුතාදීන් සමඟ වාග්විඥප්ති ශබ්ද ලහුතාදී තේරසකය යි. මේ සය චිත්තයෙන් උපදනා කලාපයෝ ය.

381. ශුද්ධාෂ්ඨකය ශබ්දනවකය ලහුතාදේකාදශකය ශබ්දලහුතාදි ද්වාදශකය යන මේ සතර ඍතුවෙන් උපදනා කලාපයෝ ය.

382. ශුද්ධාෂ්ඨකය ශබ්දනවකය යන දෙක ආහාරයෙන් උපදනා කලාපයෝ ය.

383. ඒ කලාපයන් අතුරෙන් ශුද්ධාෂ්ටකය ශබ්ද නවකය යන ඍතුජ කලාපයෝ දෙදෙන සත්ත්ව සන්තානයෙන් පිටත්හි ද ලැබෙත්. ඉතිරි සියලු කලාපයෝ සත්ත්වසන්තානයෙහි ම ලැබෙත්.

384. කර්මය චිත්තය ඍතුය ආහාරය යන මේවායින් හටගන්නා වූ කලාපයෝ පිළිවෙළින් නවයක් ද සයක් ද සතරක් ද දෙකක් ද වන්නා හ. කලාපයෝ එක්විසි දෙනෙකි.

385. කලාපයන්ගේ පරිච්ඡේද හා ලක්ෂණ බැවින් ආකාශ ධාතුව හා ලක්ෂණරූපයෝ කලාපාංගයෝ නොවෙතියි නුවණැත්තෝ කීහු.

මේ මෙහි රූප කලාප යෙදෙන ක්‍රමය යි

**386**. සබ්බානි පනෙතානි රූපානි කාමලොකෙ යථාරහං අනූනානි පවත්තියං උපලබ්භන්ති.

**387**. පටිසන්ධියං පන සංසෙදජානඤ්චෙව ඕපපාතිකානඤ්ච චක්ඛු, සොත, ඝාන, ජිව්හා, කාය, භාව, වත්ථුදසක සංඛාතානි සත්තදසකානි පාතුභවන්ති උක්කට්ඨ වසෙන. ඕමක වසෙන පන චක්ඛු සොත ඝාන භාව දසකානි කදාචි න ලබ්භන්ති තස්මා තෙසං වසෙන කලාපහානි වෙදිතබ්බා.

**388**. ගබ්භසෙය්‍යක සත්තානං පන කාය භාව වත්ථු දසක සංඛාතානි තීණි දසකානි පාතුභවන්ති. තත්ථාපි භාවදසකං කදාචි න ලබ්භති. තතො පරං පවත්තියං කමෙන චක්ඛුදසකාදීනි පාතුභවන්ති.

**389**. ඉච්චෙවං පටිසන්ධිමුපාදාය කම්මසමුට්ඨානා, දුතිය චිත්ත-මුපාදාය චිත්තසමුට්ඨානා, ඨිතිකාලමුපාදය උතුසමුට්ඨානා, ඔජා ඵරනමුපාදාය ආහාර සමුට්ඨානා චෙති චතුසමුට්ඨාන රූපකලාපසන්තති කාම ලොකෙ දීපජාලාවිය නදීසොතො විය ච යාවතායුක මබ්බොච්ජින්නා පවත්තති.

**390**. මරණකාලෙ පන චුතිචිත්තොපරි සත්තරසම චිත්තස්ස ඨිතිකාලමුපාදය කම්මජරූපානි න උප්පජ්ජන්ති. පුරෙත-රමුප්පන්නානි ච කම්මජ රූපානි චුතිචිත්තසමකාලමෙව පවත්තිත්වා නිරුජ්ඣන්ති. තතො පරං චිත්තජ ආහාරජ රූපඤ්ච වොච්ඡිජ්ජති. තතොපරං උතුසමුට්ඨාන රූප පරම්පරා මතකලෙබරං සන්ධාය පවත්තන්ති.

**391**. ඉච්චෙවං මත සත්තානං - පුන දෙව භවන්තරෙ
පටිසන්ධි මුපාදාය - තථාරූපං පවත්තතී.

**392**. රූපලොකෙ පන ඝාන ජිව්හා කාය භාවදසකානි ච ආහාරජ කලාපානි ච න ලබ්භන්ති. තස්මා තෙසං පටිසන්ධිකාලෙ චක්ඛු සොත වත්ථු වසෙන තීනි දසකානි ජීවිත නවක-ඤ්චෙති චත්තාරො කම්මසමුට්ඨාන කලාපා, පවත්තියං චිත්තොතුසමුට්ඨානා ච ලබ්භන්ති.

386. ඒ සියලු රූපයෝ කාමලෝකයෙහි ප්‍රවෘත්ති කාලයෙහි අඩුවක් නැතිව සුදුසු පරිදි ලැබෙත්.

387. ප්‍රතිසන්ධි කාලයෙහි වනාහි සංශේදජ සත්ත්වයන්ට හා ඕපපාතික සත්ත්වයන්ට චක්ෂුශ් ශ්‍රෝත්‍ර ඝ්‍රාණ ජිහ්වා කාය භාව වස්තු දශක සංඛ්‍යාත සප්ත දශකයෝ උත්කෘෂ්ට වශයෙන් පහළ වෙත්. ඕමක වශයෙන් වනාහි චක්ෂුශ් ශ්‍රෝත්‍ර ඝ්‍රාණ භාව දශකයෝ කිසිවිටෙක නො ලැබෙත්. එබැවින් ඔවුන්ගේ වශයෙන් කලාප හානිය දතයුතු ය.

388. ගර්භසායික සත්ත්වයන්ට වනාහි කාය භාව වස්තු දශක සංඛ්‍යාත දශකයෝ තිදෙන පහළ වෙති. එයිනුදු භාවදශකය කිසිවිටෙක නො ලැබේ. ඉන් පසු ප්‍රවෘත්ති කාලයෙහි ක්‍රමයෙන් චක්ෂුර්දශකාදීහු පහළ වෙති.

389. මෙසේ ප්‍රතිසන්ධියෙහි පටන් කර්මජ වූ ද ද්විතීය චිත්තයෙහි පටන් චිත්තජ වූ ද ප්‍රතිසන්ධිචිත්තයාගේ ස්ථිතියෙහි පටන් ඍතුජ වූ ද ඕජාව ශරීරයෙහි පැතිරීමෙහි පටන් ආහාරජ වූ ද යන හේතු සතරෙන් හටගන්නා වූ රූප පරම්පරාව කාමලෝකයෙහි ප්‍රදීප ජාලාවක් මෙන් ද ගංගා ප්‍රවාහයක් මෙන් ද දිවි ඇතිතෙක් නො සිඳී පවත්නේ ය.

390. මරණ කාලයෙහි වනාහි චුතිචිත්තයෙන් යට සතළොස් වන චිත්තයාගේ ස්ථිතිකාලයෙහි පටන් කර්මජරූපයෝ නූපදිත්. පෙර උපන් කර්මජරූපයෝ ද ච්‍යුතිචිත්තයට සමකාලයෙහි ම පැවතී නිරුද්ධ වෙති. ඉන් පසු චිත්තජාහාරජ රූපයෝ ද සිඳෙති. ඉන් පසු ඍතුජ රූප පරම්පරාව මළසිරුර නිසා පවතී.

391. මෙසේ මළා වූ සත්ත්වයන්ට නැවත අන්‍ය භවයෙහි ද ප්‍රතිසන්ධියෙහි පටන් එසේ ම රූපය පවත්නේ ය.

392. රූපලෝකයෙහි වනාහි ඝ්‍රාණ ජිහ්වා කාය භාව දශකයෝ ද ආහාරජ කලාපයෝ ද නො ලැබෙති. එබැවින් ඔවුන්ට ප්‍රතිසන්ධි කාලයෙහි චක්ෂුශ්ශ්‍රෝත්‍ර වස්තු වශයෙන් දශකයෝ තිදෙනෙක් ද ජීවිත නවකය ද යන සතර දෙනෙක් වූ කර්මජ කලාපයෝ ලැබෙත්. ප්‍රවෘත්ති කාලයෙහි චිත්තර්තු සමුත්ථාන කලාපයෝ ද ලැබෙත්.

**393**. අසඤ්ඤසත්තානං පන චක්ඛු සොත වත්ථු සද්දානිපි න ලබ්භන්ති. තථා සබ්බානිපි චිත්තජ රූපානි. තස්මා තෙසං පටිසන්ධිකාලෙ ජීවිත නවක මෙව. පවත්තියං ච සද්ද නවක වජ්ජිතං උතුසමුට්ඨාන රූපා අතිරිච්චති.

**394**. ඉච්චෙවං කාමරූපාසඤ්ඤි සංඛාතෙසු තීසු ඨානෙසු පටිසන්ධි පවත්ති වසෙන ද්විධා රූපප්පවත්ති වෙදිතබ්බා.

**395**. අට්ඨවීසති කාමෙසු - හොන්ති තෙවීස රූපිසු.

සත්තරසෙවා සඤ්ඤීනං - ආරුප්පෙ නත්ථි කිඤ්චිපි

**396**. සද්දො විකාරො ජරතා - මරණඤ්චොප පත්තියං

න ලබ්භන්ති පවත්තෙතු - න කිඤ්චිපි න ලබ්භති.

අයමෙත්ථ රූපප්පවත්තික්කමො.

**397**. නිබ්බානං පන ලොකුත්තර සංඛාතං චතුමග්ග ඤාණෙන සච්ඡිකාතබ්බං මග්ගඵලාන මාරම්මණභූතං වානසංඛාතාය තණ්හාය නික්ඛන්තත්තා නිබ්බානන්ති පවුච්චති.

**398**. තදෙතං සභාවතො එකවිධම්පි සඋපාදිසෙස නිබ්බානධාතු අනුපාදිසෙස නිබ්බානධාතු චෙති දුවිධං හොති කාරණ පරියායෙන.

**399**. තථා සුඤ්ඤතං අනිමිත්තං අප්පනිහිතඤ්චෙති තිවිධං හොති ආකාර භෙදෙන.

**400**. පදමච්චුත මච්චන්ත - මසංඛත මනුත්තරං

නිබ්බාන මිති භාසන්ති - වානමුත්තා මහෙසයො.

**401**. ඉති චිත්තං චෙතසිකං - රූපං නිබ්බාන මිච්චපි

පරමත්ථං පකාසෙන්ති - චතුධාව තථාගතා.

ඉති අභිධම්මත්ථ සංගහෙ රූපසංගහ විභාගො

නාම ඡට්ඨො පරිච්ඡෙදො.

393. අසංඥ සත්ත්වයන්ට වනාහි චක්ෂුශ් ශ්‍රෝත්‍ර වස්තු ශබ්ද යෝ ද නො ලැබෙත්. සියලු චිත්තජ රූපයෝ ද එසේ ම ය. එබැවින් ඔවුනට ප්‍රතිසන්ධි කාලයෙහි ජීවිත නවකය ම ලැබේ. ප්‍රවෘත්ති කාලයෙහි ද ශබ්ද වර්ජිත ඍතු සමුත්ථාන රූපය ඉතිරි වන්නේ ය.

394. මෙසේ කාම රූප අසඤ්ඤි සංඛ්‍යාත භවත්‍රයෙහි ප්‍රති-සන්ධි ප්‍රවෘත්ති වශයෙන් දෙයාකාර වූ රූප ප්‍රවෘත්තිය දතයුත්තීය.

395. කාමලෝකයෙහි අටවිසි දෙනෙක් වූ රූපයෝ වෙති. රූපභවයෙහි තෙවිසි රූප කෙනෙක් වෙති. අසඤ්ඤීන්ට සතළොසක් ම වෙති. අරූපභවයෙහි කිසි රූපයෙක් නැත.

396. ශබ්දය ද විකාර රූප පස ද ජරතා රූපය ද අනිත්‍යතා රූපය ද යන මොහු උත්පත්ති කාලයෙහි නො ලැබෙති. ප්‍රවෘත්ති කාලයෙහි කිසිරූපයෙක් නො ලැබෙන්නේ නොවේ. සියල්ල ම ලැබේ.

මෙය මෙහි රූප ප්‍රවෘත්ති ක්‍රමය යි.

397. ලෝකය ඉක්ම සිටි හෙයින් ලෝකෝත්තර යයි කියන ලද්දා වූ සතර මාර්ගඥනයෙන් ප්‍රත්‍යක්ෂ කළ යුතු වූ මාර්ග ඵලයන්ට අරමුණු වූ නිර්වාණය වනාහි වාන යයි කියන ලද තෘෂ්ණාවෙන් නික්මුණු බැවින් නිබ්බාන යයි කියනු ලැබේ.

398. ඒ මේ නිර්වාණය ශාන්තලක්ෂණයෙන් ඒකවිධ වුව ද සෝපාදිශේෂ නිර්වාණධාතුය අනුපාදිශේෂ නිර්වාණ ධාතුය කියා කාරණා ව්‍යවහාරයෙන් දෙවැදෑරුම් වන්නේ ය.

399. එසේ ම සුඤ්ඤතය අනිමිත්තය අප්පණිහිත යයි ආකාර භේදයෙන් ත්‍රිවිධ වේ.

400. ච්‍යුති රහිත වූ උත්පාදව්‍යායාන්තයන් නැත්තා වූ ප්‍රත්‍ය යෙන් නො හටගත්තා වූ තමහට උතුම් දෙයක් නැත්තා වූ ශාන්ත ස්වභාවය නිර්වාණය යයි තෘෂ්ණාවෙන් මිදුණා වූ මහාර්ෂීහු කියත්.

401. මෙසේ චිත්තය චෛතසිකය රූපය නිර්වාණ යයි සතරාකාරයකින් ම තථාගතයෝ පරමාර්ථය ප්‍රකාශ කරන්නාහු ය.

මෙය අභිධර්මාර්ථ සංග්‍රහයෙහි රූපසංග්‍රහ විභාග
නම් වූ සවන පරිච්ඡේදය යි.

# සත්තමො පරිච්ඡෙදො

402. ද්වාසත්තති විධා වුත්තා - වත්ථුධම්මා සලක්ඛණා
තෙසං දානි යථායොගං - පවක්ඛාමි සමුච්චයං.

403. අකුසල සංගහො මිස්සක සංගහො බොධි පක්ඛිය සංගහො සබ්බසංගහො චෙති සමුච්චය සංගහො චතුබ්බිධො වෙදිතබ්බො.

404. කථං? අකුසල සංගහෙ තාව චත්තාරො ආසවා, කාමාසවො භවාසවො දිට්ඨාසවො අවිජ්ජාසවො.

405. චත්තාරො ඔඝා, කාමොඝො භවොඝො දිට්ඨොඝො අවිජ්ජොඝො.

406. චත්තාරො යොගා, කාමයොගො භවයොගො දිට්ඨියොගො අවිජ්ජායොගො.

407. චත්තාරො ගන්ථා, අභිජ්ඣා කායගන්ථො ව්‍යාපාදො කායගන්ථො සීලබ්බත පරාමාසො කායගන්ථො ඉදං සච්චාභිනිවෙසො කායගන්ථො.

408. චත්තාරො උපාදනා, කාමුපාදනං දිට්ඨුපාදනං සීලබ්බතුපාදානං අත්තවාදුපාදානං.

409. ඡ නීවරණානි, කාමච්ඡන්ද නීවරණං ව්‍යාපාද නීවරණං ථීනමිද්ධ නීවරණං උද්ධච්චකුක්කුච්ච නීවරණං විචිකිච්ඡානීවරණං අවිජ්ජා නීවරණං.

410. සත්තානුසයො, කාමරාගානුසයො භවරාගානුසයො පටිඝානුසයො මානානුසයො දිට්ඨානුසයො විචිකිච්ඡානුසයො අවිජ්ජානුසයො.

# සප්තම පරිච්ඡේදය

402. ආරම්මණ විජානනාදි තමන් තමන් අයත් ලක්ෂණ සහිත වූ දෙසැත්තෑ වැදෑරුම් වූ සවභාව ධර්ම කෙනෙක් කියන ලදහ. දැන් ඒ ධර්මයන්ගේ සමුච්චය රාශිය යෙදෙන පරිද්දෙන් කියමි.

403. අකුශල සංග්‍රහය මිශ්‍රකසංග්‍රහය බෝධි පාක්ෂික සංග්‍රහය සර්වසංග්‍රහය යි සමුච්චය සංග්‍රහය සතර අයුරකින් දත යුතු ය.

404. කෙසේද යත්? - අකුසල සංග්‍රහයෙහි කාමාශ්‍රවය භවාශ්‍රවය දෘෂ්ට්‍යාශ්‍රවය අවිද්‍යාශ්‍රවය යි ආශ්‍රවයෝ සතර දෙනෙකි.

405. කාමෝඝය භවෝඝය දෘෂ්ට්‍යෝඝය අවිද්‍යෝඝය යි ඕඝයෝ සතර දෙනෙකි.

406. කාමයෝගය භවයෝගය දෘෂ්ටියෝගය අවිද්‍යායෝගය යි යෝගයෝ සතර දෙනෙකි.

407. අභිජ්ඣා කායගන්ථය ව්‍යාපාද කායගන්ථය සීලබ්බත පරාමාස කායගන්ථය ඉදං සච්චාභිනිවේස කායගන්ථය යි කායග්‍රන්ථයෝ සතර දෙනෙකි.

408. කාමුපාදනය දිට්ඨුපාදනය සීලබ්බතුපාදනය අත්තවාදු-පාදනය යි උපාදනයෝ සතර දෙනෙකි.

409. කාමච්ඡන්දනීවරණය ව්‍යාපාදනීවරණය ථිනමිද්ධ-නීවරණය උද්ධච්චකුක්කුච්චනීවරණය විචිකිච්ඡා නීවරණය අවිජ්ජානීවරණය යි නීවරණයෝ සදෙනෙකි.

410. කාමරාගානුසයය භවරාගානුසයය පටිඝානුසයය මානානුසයය දිට්ඨානුසයය විචිකිච්ඡානුසයය අවිජ්ජානුසයයයි අනුසයෝ සත්දෙනෙකි.

411. දස සංයෝජනානි, කාමරාගසංයෝජනං රූපරාග සංයෝජනං අරූපරාගසංයොජනං පටිඝසංයොජනං මානසංයොජනං දිට්ඨිසංයොජනං සීලබ්බත පරාමාස සංයොජනං විචිකිච්ඡාසංයොජනං උද්ධච්චසංයොජනං අවිජ්ජාසංයොජනං සුත්තන්තෙ.

412. අපරානි දස සංයොජනානි පටිඝසංයොජනං මාන සංයොජනං දිට්ඨිසංයොජනං සීලබ්බතපරාමාස සංයොජනං විචිකිච්ඡාසංයොජනං ඉස්සාසංයොජනං මච්ඡරියසංයොජනං අවිජ්ජාසංයොජනං අභිධම්මේ.

413. දසකිලෙසා, ලොභො දෙසො මොහො මානො දිට්ඨි විචිකිච්ඡා ථීනං උද්ධච්චං අහිරිකං අනොත්තප්පං.

414. ආසවාදීසු පනෙත්ථ කාමභවනාමෙන තබ්බත්ථුකා තණ්හා අධිප්පෙතා. තථා සීලබ්බත පරාමාසො ඉදං සච්චාභිනිවෙසො අත්තවාදොති ච තථා පවත්තං දිට්ඨිගතමෙව පවුච්චති.

415. ආසවොඝා ච යොගා ච - තයො ගන්ථා ච වත්ථුතො.
උපාදානා දුවෙ වුත්තා - අට්ඨ නීවරණා සියුං.

416. ඡළෙ වා නුසයා හොන්ති - නව සංයෝජනා මතා
කිලෙසා දස වුත්තොයං - නවධා පාපසංගහො.

417. මිස්සක සංගහෙ ඡ හෙතු, ලොභො දොසො
මොහො අලොභො අදොසො අමොහො.

418. සත්ත ඣානංගානි, විතක්කො විචාරො පීති
එකග්ගතා සොමනස්සං දොමනස්සං උපෙක්ඛා.

411. කාමරාගසංයෝජනය රූපරාගසංයෝජනය අරූපරාග සංයෝජනය පටිඝසංයෝජනය මානසංයෝජනය දිට්ඨිසංයෝජනය සීලබ්බත පරාමාසසංයෝජනය විචිකිච්ඡාසංයෝජනය උද්ධච්ච-සංයෝජනය අවිජ්ජාසංයෝජනය යි සූත්‍රාන්තයෙහි සංයෝජනයෝ දස දෙනෙකි.

412. කාමරාගසංයෝජනය භවරාගසංයෝජනය පටිඝ සංයෝජනය මානසංයෝජනය දිට්ඨිසංයෝජනය සීලබ්බත පරාමාස සංයෝජනය විචිකිච්ඡාසංයෝජනය ඉස්සාසංයෝජනය මච්ඡරිය-සංයෝජනය අවිජ්ජාසංයෝජනයයි අභිධර්මයෙහි අන්‍ය වූ සංයෝජනයෝ දසදෙනෙකි.

413. ලෝභය දෝසය මෝහය මානය දිට්ඨිය විචිකිච්ඡාය ථීනය උද්ධච්චය අහිරිකය අනොත්තප්පය යි ක්ලේශයෝ දසදෙනෙකි.

414. මේ අකුශල සංග්‍රහයෙහි වනාහි ආශ්‍රවාදීන් කෙරෙහි කාම භව යන නාමවලින් ඔවුන් වස්තුකොට ඇති තෘෂ්ණාව අදහස් කරනු ලැබේ. සීලබ්බත පරාමාසය ඉදං සච්චාභිනිවේසය අත්තවාදයයි කියා ද ඒ ආකාරයෙන් පැවැත්තා වූ දෘෂ්ටියට ම කියනු ලැබේ.

415. ආශ්‍රවයෝ ද ඕඝයෝ ද යෝගයෝ ද ග්‍රන්ථයෝ ද යන මොහු වස්තු වශයෙන් තිදෙනෙක් වෙත්. උපාදානයෝ දෙදෙනෙකැ යි කියන ලදී. නීවරණයෝ අටදෙනෙක් වන්නාහ.

416. අනුසයෝ සදෙනෙක් ම වෙති. සංයෝජනයෝ නවදෙනකැයි දත්තා ලදහ. ක්ලේශයෝ දසදෙනකැයි කියන ලදී. මෙසේ ම පාපසංග්‍රහය නවප්‍රකාරයකින් කියන ලද්දේ ය.

417. මිශ්‍රකසංග්‍රහයෙහි ලෝභය ද්වේශය මෝහය අලෝභය අද්වේශය අමෝහය යි හේතූහු සදෙනෙකි.

418. විතර්කය විචාරය ප්‍රීතිය ඒකාග්‍රතාය සෞමනස්‍ය දෞර්මනස්‍ය උපේක්ෂාය යි ධ්‍යානාංගයෝ සත්දෙනෙකි.

419. ද්වාදසමග්ගංගානි, සම්මාදිට්ඨි සම්මාසංකප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි මිච්ඡාදිට්ඨි මිච්ඡාසංකප්පො මිච්ඡාවායාමො මිච්ඡාසමාධි.

420. බාවීසතින්ද්‍රියානි, චක්ඛුන්ද්‍රියං සොතින්ද්‍රියං ඝානින්ද්‍රියං ජිව්හින්ද්‍රියං කායින්ද්‍රියං ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං ජීවිතින්ද්‍රියං මනින්ද්‍රියං සුඛින්ද්‍රියං දුක්ඛින්ද්‍රියං සොමනස්සින්ද්‍රියං දොමනස්සින්ද්‍රියං උපෙක්ඛින්ද්‍රියං සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රියං අඤ්ඤින්ද්‍රියං අඤ්ඤාතාවින්ද්‍රියං.

421. නවබලානි, සද්ධාබලං විරියබලං සතිබලං සමාධිබලං පඤ්ඤාබලං හිරිබලං ඔත්තප්පබලං අහිරිකබලං අනොත්තප්පබලං.

422. චත්තාරො අධිපති, ඡන්දාධිපති චිත්තාධිපති විරියාධිපති වීමංසාධිපති.

423. චත්තාරො ආහාරා, කබලිංකාරො ආහාරො ඵස්සො දුතියො මනොසඤ්චෙතනා තතියා විඤ්ඤාණං චතුත්ථං

424. ඉන්ද්‍රියෙසු පනෙත්ථ සොතාපත්තිමග්ග ඤාණං අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රියං, අරහත්තඵලඤාණං අඤ්ඤාතාවින්ද්‍රියං, මජ්ඣෙ ඡ ඤාණානි අඤ්ඤින්ද්‍රියානීති වුච්චන්ති.

425. ජීවිතින්ද්‍රියඤ්ච රූපාරූපවසෙන දුවිධං හොති.

426. පඤ්චවිඤ්ඤාණෙසු ඣානංගානි අවිරියෙසු බලානි අහෙතුකෙසු මග්ගංගානි න ලබ්භන්ති.

427. තථා විචිකිච්ඡා චිත්තෙ එකග්ගතා මග්ගින්ද්‍රිය බල භාවං න ගච්ඡති.

428. ද්විහේතුක තිහෙතුක ජවනෙස්වෙව යථා සම්භවං අධිපති එකොව ලබ්භති.

---

අංක 427 දරණ පාඨය සෑම පිටපතකම මෙසේ දක්නා ලැබෙන මුත් එය අභිධර්ම පාලියට නොගැලපේ. එය තිබිය යුත්තේ "තථා අවිරියෙසු එකග්ගතා ඉන්ද්‍රියබල භාවං න ගච්ඡති. විචිකිච්ඡා චිත්තෙ පන මග්ග භාවම්පි" කියා ය.

419. සම්‍යග්දෘෂ්ටිය සම්‍යක්සංකල්පය සම්‍යක්වචනය සම්‍යක්-කර්මාන්තය සම්‍යගාජීවය සම්‍යග් ව්‍යායාමය සම්‍යක්ස්මෘතිය සම්‍යක්සමාධිය මිථ්‍යාදෘෂ්ටිය මිථ්‍යාසංකල්පය මිථ්‍යාව්‍යායාමය මිථ්‍යා සමාධියයි මාර්ගාංගයෝ දොළොස් දෙනෙකි.

420. චක්ඛුන්ද්‍රිය -පෙ- අඤ්ඤාතාවින්ද්‍රියය යි ඉන්ද්‍රියයෝ දෙවිසි දෙනෙකි.

421. සද්ධා බලය -පෙ- අනොත්තප්ප බලය යි බලයෝ නව දෙනෙකි.

422. ඡන්දාධිපතිය -පෙ- වීමංසාධිපතිය යි අධිපතීහු සතර දෙනෙකි.

423. කබලිංකාර ආහාරය, දෙවෙන වූ ඵස්සාහාරය තුන් වැනි වූ මනෝසඤ්චේතනාහාරය. සතර වැනි වූ විඤ්ඤාණාහාරයයි ආහාරයෝ සතර දෙනෙකි.

424. මෙහි වනාහි ඉන්ද්‍රියයන් අතුරෙන් ශ්‍රෝතාපත්තිමාර්ග ඥනය අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය නම්. අර්හත් ඵල ඥනය අඤ්ඤාතාවින්ද්‍රිය නම්. මධ්‍ය ඥන සය අඤ්ඤින්ද්‍රියයෝය යි කියනු ලැබෙත්.

425. ජීවිතින්ද්‍රියය ද රූපාරූප වශයෙන් දෙවැදෑරුම් වේ.

426. පඤ්චවිඥනයන්හි ධ්‍යානාංගයෝ ද වීර්‍ය්‍යරහිත චිත්තයන්හි බලයෝ ද අහේතුකයන්හි මාර්ගාංගයෝ ද නො ලැබෙති.

427. එසේ ම විචිකිත්සා සහගත සිත්හි ඒකාග්‍රතාව මාර්ගේන්ද්‍රිය බලභාවයට නො පැමිණේ.

428. ද්විහේතුක ත්‍රිහේතුක ජවනයන්හි ම සුදුසු පරිදි එක් අධිපති ධර්මයෙක් ම ලැබේ.

429. ඡ හෙතු පඤ්ච ඣානංගා - මග්ගංගා නව වත්ථුතො
සොළසින්ද්‍රිය ධම්මා ච - බලධම්මා නවෙරිතා.

430. චත්තාරො අධිපති වුත්තා - තථාහාරාති සත්තධා
කුසලාදි සමාකිණ්ණො - වුත්තො මිස්සක සංගහො

431. බොධිපක්ඛිය සංගහෙ චත්තාරො සතිපට්ඨානා, කායානුපස්සනා සතිපට්ඨානං වෙදනානුපස්සනා සතිපට්ඨානං චිත්තානුපස්සනා සතිපට්ඨානං ධම්මානුපස්සනා සතිපට්ඨානං.

432. චත්තාරො සම්මප්පධානා, උප්පන්නානං පාපකානං පහානාය වායාමො. අනුප්පන්නානං පාපකානං අනුප්පාදාය වායාමො, අනුප්පන්නානං කුසලානං උප්පාදාය වායාමො, උප්පන්නානං කුසලානං භීයො භාවාය වායාමො.

433. චත්තාරො ඉද්ධිපාද, ඡන්දිද්ධිපාදො, විරියිද්ධිපාදො චිත්ති-ද්ධිපාදො වීමංසිද්ධිපාදො.

434. පඤ්චින්ද්‍රියානි, සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං.

435. පඤ්චබලානි, සද්ධාබලං විරියබලං සතිබලං සමාධිබලං පඤ්ඤාබලං.

436. සත්තබොජ්ඣංගා, සතිසම්බොජ්ඣංගො ධම්මවිචය සම්බොජ්ඣංගො විරියසම්බොජ්ඣංගො පීති සම්බොජ්ඣංගො පස්සද්ධිසම්බොජ්ඣංගො සමාධි සම්බොජ්ඣංගො උපෙක්ඛා සම්බොජ්ඣංගො.

437. අට්ඨමග්ගංගානි, සම්මාදිට්ඨි සම්මාසංකප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මා ආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි.

429. වස්තු වශයෙන් හේතූහු සදෙනෙකැයි ද ධ්‍යානාංගයෝ පස්දෙනෙකැ යි ද මාර්ගාංගයෝ නව දෙනෙකැයි ද ඉන්ද්‍රිය ධර්මයෝ සොළොස් දෙනෙකැයි ද බලධර්මයෝ නවදෙනෙකැයි ද කියන ලදහ.

430. අධිපතීහු සතරදෙනෙකැයි ද ආහාරයෝ ද එසේමය යි ද කියන ලදී. මෙසේ කුශලාදීන් මිශ්‍ර වූ මිශ්‍රක සංග්‍රහය සත් ආකාරයෙන් කියන ලදී.

431. බෝධිපාක්ෂික සංග්‍රහයෙහි කායානුපස්සනා සති-පට්ඨානය වේදනානුපස්සනා සතිපට්ඨානය චිත්තානුපස්සනා සතිපට්ඨානය ධම්මානුපස්සනා සතිපට්ඨානය යි සතිපට්ඨානයෝ සතර දෙනෙකි.

432. සම්‍යක්ප්‍රධානයෝ සතරදෙනෙකි. උපන් අකුශලයන් ප්‍රහාණය පිණිස කරන ව්‍යායාමය, නූපන් අකුශලයන් නූපදීම පිණිස කරන ව්‍යායාමය, නූපන් කුසල් උපදිනු පිණිස කරන ව්‍යායාමය, උපන් කුශලයන්ගේ අභිවෘද්ධිය පිණිස කරන ව්‍යායාමය යන මොහුය.

433. ඡන්දිද්ධිපාදය -පෙ- වීමංසිද්ධිපාදය යි ඍද්ධිපාදයෝ සතර දෙනෙකි.

434. සද්ධින්ද්‍රිය ය -පෙ- පඤ්ඤින්ද්‍රිය යි ඉන්ද්‍රියයෝ පස් දෙනෙකි.

435. සද්ධාබලය -පෙ- පඤ්ඤාබලය යි බලයෝ පස් දෙනෙකි.

436. සතිසම්බොජ්ඣංගය -පෙ- උපෙක්ඛා සම්බොජ්ඣංග ය යි බෝධ්‍යංගයෝ සත් දෙනෙකි.

437. සම්මාදිට්ඨිය -පෙ- සම්මාසමාධියයි මාර්ගාංගයෝ අටදෙනෙකි.

438. එත්ථ පන චත්තාරො සතිපට්ඨානානි සම්මාසති එකාව පවුච්චති. තථා චත්තාරො සම්මප්පධානානි ච සම්මාවායාමො.

439. ඡන්දො චිත්ත මුපෙක්ඛා ච - සද්ධා පස්සද්ධි පීතියො
සම්මාදිට්ඨි ච සංකප්පො - වායාමො විරතිත්තයං
සම්මාසති සමාධීති - චුද්දසෙතෙ සභාවතො.
සත්ත තිංසප්ප භෙදෙන - සත්තධා තත්ථ සංගහො.

440. සංකප්ප පස්සද්ධි ච පීතුපෙක්ඛා
ඡන්දො ච චිත්තං විරතිත්තයං ච
නවෙකඨානා විරියං නවට්ඨ.
සතී සමාධී චතු පඤ්ච පඤ්ඤා
සද්ධා දුඨානුත්තම සත්තතිංස
ධම්මාන මෙසො පවරො විභාගො.

441. සබ්බේ ලොකුත්තරෙ හොන්ති - න වා සංකප්ප පීතියො
ලොකියෙපි යථායොගං - ඡබ්බිසුද්ධිප්පවත්තියං

442. සබ්බසංගහෙ පඤ්චක්ඛන්ධා, රූපක්ඛන්ධො වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සංඛාරක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො.

443. පඤ්චුපාදානක්ඛන්ධා, රූපූපාදානක්ඛන්ධො, වෙදනූපාදන-ක්ඛන්ධො, සඤ්ඤූපාදානක්ඛන්ධො, සංඛාරූපාදානක්ඛන්ධො, විඤ්ඤාණූපාදානක්ඛන්ධො.

444. ද්වාදසායතනානි, චක්ඛායතනං සොතායතනං ඝානායතනං ජිව්හායතනං කායායතනං මනායතනං රූපායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං පොට්ඨබ්බායතනං ධම්මායතනං.

445. අට්ඨාරසධාතුයො, චක්ඛුධාතු සොතධාතු ඝානධාතු ජිව්හාධාතු කායධාතු රූපධාතු සද්දධාතු ගන්ධධාතු රසධාතු පොට්ඨබ්බධාතු චක්ඛුවිඤ්ඤාණධාතු සොතවිඤ්ඤාණධාතු ඝානවිඤ්ඤාණධාතු ජිව්හාවිඤ්ඤාණධාතු කායවිඤ්ඤාණධාතු මනොධාතු මනොවිඤ්ඤාණධාතු ධම්මධාතු.

438. මෙහි සතර සතිපට්ඨානයෝ්ය යි එකක් වූ සම්මා සතිය ම කියනු ලැබේ. එසේ ම සතර සම්‍යක් ප්‍රධානයෝ්ය යි සම්‍යක් ව්‍යායාමය කියනු ලැබේ.

439. ඡන්දය ද චිත්තය ද උපේක්ෂාව ද ශ්‍රද්ධාප්‍රශ්‍රබ්ධි ප්‍රීතීහු ද සම්‍යග්දෘෂ්ටිය ද සම්‍යක්සංකල්පය ද සම්‍යක්ව්‍යායාමය ද විරතිත්‍රය ද සම්‍යක්ස්මෘතිය ද සමාධියදැයි ස්වභාවධර්ම වශයෙන් තුදුස්දෙනෙක් වූ මේ ධර්මයෝ සත්තිස් ප්‍රභේදයකින් ඒ බෝධිපාක්ෂික සංග්‍රහයෙහි සත් ආකාරයකින් සංග්‍රහ කරන ලදහ.

440. මේ බෝධිපාක්ෂික සංග්‍රහයෙහි සම්‍යක් සංකල්පය ප්‍රශ්‍රබ්ධිය ප්‍රීතිය උපේක්ෂාව ඡන්දය චිත්තය විරතිත්‍රය යන නවය එක් ස්ථානය බැගින් ඇත්තේ ය. වීර්‍ය්‍යය ස්ථාන නවයක ඇත්තේ ය. ස්මෘතිය අටතැනක ඇත්තේ ය. සමාධිය සතර තැනක ඇත්තේ ය. ප්‍රඥාව පස්තැනක ඇත්තේ ය. ශ්‍රද්ධාව දෙතැනක ඇත්තේ ය. මෙය උතුම් වූ සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන්ගේ උත්තම විභාගය වන්නේ ය.

441. සියලු බෝධිපාක්ෂික ධර්මයෝ ලෝකෝත්තර චිත්තයෙහි වෙති. සංකල්ප ප්‍රීතීහු කිසි ලෝකෝත්තර චිත්තයක නොවෙති. සයක් වූ විශුද්ධීන්ගේ පැවැත්මෙහි ලෞකික චිත්තයෙහි ද සුදුසු පරිදි වෙති.

442. සර්වසංග්‍රහයෙහි රූපස්කන්ධ -පෙ- විඥ්ඥාණ ස්කන්ධය යි ස්කන්ධ පසෙක් වෙති.

443. රූපූපාදානස්කන්ධය -පෙ- විඥනූපාදානස්කන්ධය යි උපාදනස්කන්ධ පසෙක් වෙති.

444. චක්ඛායතනය -පෙ- ධම්මායතනයයි ආයතන දෙළොසෙකි.

445. චක්ඛුධාතු -පෙ- ධම්මධාතුය යි ධාතු අටොළොසෙකි.

446. චත්තාරි අරියසච්චානි, දුක්ඛං අරියසච්චං දුක්ඛසමුදයො අරියසච්චං දුක්ඛනිරොධො අරියසච්චං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං.

447. එත්ථ පන චෙතසික සුඛුමරූප නිබ්බාන වසෙන එකූන සත්තති ධම්මා ධම්මායතන ධම්මධාතූති සංඛං ගච්ඡන්ති, මනායතන මෙව සත්තවිඤ්ඤාණ ධාතු වසෙන භිජ්ජති.

448. රූපඤ්ච වෙදනා සඤ්ඤා - සෙසා චෙතසිකා තථා
විඤ්ඤාණමිති පඤ්චෙතෙ - පඤ්චක්ඛන්ධාති භාසිතා.

449. පඤ්චුපාදානක්ඛන්ධාති - තථා තෙභූමකා මතා,
භෙදා භාවෙන නිබ්බානං - ඛන්ධසංගහ නිස්සටං.

450. ද්වාරාලම්බන භෙදෙන - භවන්තායතනානි ච,
ද්වාරාලම්බතදුප්පන්න - පරියායෙන ධාතුයො.

451. දුක්ඛං තෙභූමකං වට්ටං - තණ්හා සමුදයො භවෙ,
නිරොධො නාම නිබ්බානං - මග්ගො ලොකුත්තරො මතො.

452. මග්ගයුත්තා ඵලාචෙව - චතුසච්ච විනිස්සටා
ඉති පඤ්චප්ප භෙදෙන - පවුත්තො සබ්බ සංගහො.

ඉති අභිධම්මත්ථ සංගහෙ සමුච්චය සංගහ
විභාගො නාම සත්තමො පරිච්ජෙදො.

446. දුඃඛාර්‍යසත්‍යය දුඃඛසමුදයාර්‍යසත්‍යය දුඃඛ නිරෝධාර්‍යසත්‍යය දුඃඛනිරෝධගාමිනී ප්‍රතිපදාර්‍ය සත්‍යය යි ආර්‍යසත්‍යයෝ සතර දෙනෙකි.

447. මෙහි වනාහි චෛතසික සූක්ෂ්මරූප නිර්වාණ වශයෙන් එකුන්සැත්තෑවක් වූ ධර්මයෝ ධර්මායතන ධර්මධාතු සංඛ්‍යාවට යෙත්. මනායතනය ම සතක් වූ විඥනධාතූන්ගේ වශයෙන් බිඳෙත්.

448. රූපය ද වේදනාව ද සංඥව ද එසේ ම සෙසු චෛතසිකයෝ ද විඤ්ඤාණය ද යන මොහු පඤ්චස්කන්ධයෝයයි කියන ලදහ.

449. එසේ ම ත්‍රෛභූමක ධර්මයෝ පඤ්චුපාදාන ස්කන්ධයෝය යි දන්නා ලදහ. නිර්වාණය අතීතාදි භේද නැති බැවින් ස්කන්ධ සංග්‍රහයෙන් වෙන් කරන ලදී.

450. ද්වාරාලම්බනයන්ගේ භේදයෙන් ආයතනයෝ ද ද්වාරාලම්බනයන්ගේ හා එහි උපන් විඥනයන්ගේ ද වශයෙන් ධාතූහු ද වෙති.

451. ත්‍රෛභූමක වෘත්තය දුඃඛසත්‍යය වේ. තෘෂ්ණාව සමුදය සත්‍යය වේ. නිර්වාණය නිරෝධසත්‍යය වේ. ලෝකෝත්තර මාර්ගය මාර්ගසත්‍යයයි දන්නා ලදී.

452. මාර්ගය හා යුක්ත චිත්ත - චෛතසිකයෝ ද ඵල චිත්තෝත්පාදයෝ ද චතුස්සත්‍යයෙන් වෙන් කරන ලදී. මෙසේ පඤ්ච ප්‍රභේදයෙන් සර්ව සංග්‍රහය කියන ලද්දේ ය.

මෙය අභිධර්මාර්ථ සංග්‍රහයෙහි සමුච්චය සංග්‍රහ විභාග නම් වූ සප්තම පරිච්ඡේදය යි.

# අට්ඨමො පරිච්ඡෙදො

453. යෙසං සංඛත ධම්මානං - යෙ ධම්මා පච්චයා යථා
තං විභාගමිහෙදානි - පවක්ඛාමි යථාරහං.

454. පටිච්චසමුප්පාදනයො පට්ඨානනයො චෙති පච්චය සංගහො දුවිධො වේදිතබ්බො. තත්ථ තබ්භාව භාවි භාවාකාර මත්තොපලක්ඛිතො පටිච්චසමුප්පාද නයො. පට්ඨානනයො පන ආහච්චපච්චයට්ඨිති මාරබ්භ පවුච්චති. උභයං පන වොමිස්සෙත්වා පපඤ්චෙන්ති ආචරියා.

455. තත්ථ අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාම රූප පච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සො, ඵස්ස පච්චයා වෙදනා, වෙදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං, උපාදාන පච්චයා භවො, භව පච්චයා ජාති, ජාති පච්චයා ජරා මරණං සොක පරිදෙවදුක්ඛ දොමනස්සු පායාසා සම්භවන්ති. එව මෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොතීති. අයමෙත්ථ පටිච්ච සමුප්පාද නයො.

456. තත්ථ තයො අද්ධා, ද්වාදසංගානි, වීසතාකාරා, තිසන්ධි, චතුසංඛෙපා, තීණිවට්ටානි, ද්වෙ මූලානි ච වෙදිතබ්බානි.

457. තත්ථ අවිජ්ජා සංඛාරා අතීතො අද්ධා. ජාති ජරා මරණං අනාගතො අද්ධා, මජ්ඣෙ අට්ඨ පච්චුප්පන්නො අද්ධාති තයො අද්ධා.

458. අවිජ්ජා සංඛාරා විඤ්ඤාණං නාමරූපං සළායතනං ඵස්සො වෙදනා තණ්හා උපාදනං භවො ජාති ජරා මරණන්ති ද්වාදසංගානි, සොකාදි වචනං පනෙත්ථ නිස්සන්ද ඵල නිදස්සනං.

# අෂ්ටම පරිච්ඡේදය

453. යම් සංස්කාර ධර්ම කෙනෙකුන්ට යම් ප්‍රත්‍යය ධර්ම කෙනෙක් යම් ආකාරයකින් ප්‍රත්‍යය වෙත්ද? ඒ ප්‍රත්‍යය ධර්මයන්ගේ විභාගය මෙහි සුදුසු පරිද්දෙන් කියමි.

454. ප්‍රතීත්‍යසමුත්පාද නයය, ප්‍රස්ථාන නයයයි ප්‍රත්‍යය සංග්‍රහය දෙපරිද්දකින් දත යුතුය. ඒ දෙකින් ඒ ප්‍රත්‍යය ධර්මයාගේ වීමෙන් වන සුළු වූ ප්‍රත්‍යය සමුත්පන්න ධර්මයාගේ වීම් ආකාර මාත්‍රයෙන් සලකන ලද ක්‍රමය ප්‍රතීත්‍යසමුත්පාද නය නමි. ප්‍රස්ථාන නයය ඒ ඒ ආකාරයෙන් උපකාරක වන්නා වූ ප්‍රත්‍යය ශක්ති විශේෂය අරභයා කියනු ලැබේ. මේ දෙක මිශ්‍රකොට ආචාර්‍ය්‍යවරයෝ විස්තර කරති.

455. එහි අවිද්‍යාව හේතු කොට සංස්කාරයෝ වෙත්, සංස්කාරයන් හේතුකොට විඥානය වේ. විඥානය හේතුකොට නාම-රූපය වේ. නාමරූපය හේතුකොට ෂඩායතනය වේ. ෂඩායතනය හේතුකොට ස්පර්ශය වේ. ස්පර්ශය හේතුකොට වේදනාව වේ. වේදනාව හේතුකොට තෘෂ්ණාව වේ. තෘෂ්ණාව හේතුකොට උපාදනය වේ. උපාදනය හේතුකොට භවය වේ. භවය හේතුකොට ජාතිය වේ. ජාතිය හේතුකොට ජරා මරණය ද ශෝක පරිදේව දුඃඛ දෞර්මනස්‍යෝපායාසයෝ වෙත්. මෙසේ මේ සකල දුඃඛස්කන්ධයාගේ උත්පත්තිය වේය යන මෙය මෙහි ප්‍රතීත්‍යසමුත්පාද නයය යි.

456. ඒ ප්‍රතීත්‍ය සමුත්පාදයෙහි කාලයෝ තිදෙන ද අංගයෝ දොළොස් දෙන ද විසි ආකාරයෝ ද ත්‍රිසන්ධිය ද සතර කොට්ඨාස-යෝ ද ත්‍රිවිධ වූ වෘත්තයෝ ද මූලයෝ දෙදෙන ද දත යුත්තාහු ය.

457. ඒ කාලාදීන් අතුරෙන් අවිද්‍යා සංස්කාර දෙක අතීත කාලයෝ ය. ජාති ජරා මරණයෝ අනාගත කාල නම් වෙති. මධ්‍යාංග අට ප්‍රත්‍යුත්පන්න කාල නම් වෙති. මෙසේ කාලයෝ තිදෙනෙක් වෙති.

458. අවිද්‍යාය සංස්කාරය විඥානය නාමරූපය ෂඩායතනය ස්පර්ශය වේදනාය තෘෂ්ණාය උපාදානය භවය ජාතිය ජරාමරණය යි අංගයෝ දොළොස් දෙනෙක් වෙති.

459. අවිජ්ජා සංඛාරග්ගහණෙන ච පනෙත්ථ තණ්හුපාදානභවාපි ගහිතා භවන්ති, තථා තණ්හුපාදාන භවග්ගහණෙන ච අවිජ්ජා සංඛාරා. ජාති ජරා මරණග්ගහණෙන ච විඤ්ඤාණාදි ඵල පඤ්චක මෙව ගහිතන්ති කත්වා.

460. අතීතෙ හෙතවො පඤ්ච - ඉදානි ඵල පඤ්චකං,
ඉදානි හෙතවො පඤ්ච - ආයතිං ඵල පඤ්චකන්ති.
වීසතාකාරා තිසන්ධි චතුසංඛෙපා ච භවන්ති.

461. අවිජ්ජා තණ්හුපාදානා ච කිලෙසවට්ටං, කම්මභව සංඛාතො භවෙකදෙසො සංඛාරා ච කම්ම වට්ටං, උප්පත්තිභව සංඛාතො භවෙකදෙසො අවසෙසා ච විපාකවට්ටන්ති තීණි වට්ටානි අවිජ්ජා තණ්හා වසෙන ද්වෙ මූලානි ච වෙදිතබ්බානි.

462. තෙස මෙවච මූලානං - නිරොධෙන නිරුජ්ඣති,
ජරා මරණ මුච්ඡාය - පීළිතාන මභිණ්හසො
ආසවානං සමුප්පාදා - අවිජ්ජා ච පවත්තති.

463. වට්ටමාබන්ධ මිච්චෙවං - තෙභූමක මනාදිකං,
පටිච්චසමුප්පාදොති - පට්ඨපෙසි මහාමුනිං.

464. හෙතුපච්චයො ආරම්මණපච්චයො අධිපතිපච්චයො අනන්තර පච්චයො සමනන්තර පච්චයො සහජාත පච්චයො අඤ්ඤමඤ්ඤ පච්චයො නිස්සය පච්චයො උපනිස්සය පච්චයො පුරෙජාත පච්චයො පච්ඡාජාතපච්චයො ආසෙවනපච්චයො කම්මපච්චයො විපාකපච්චයො ආහාරපච්චයො ඉන්ද්‍රිය පච්චයො ඣාන පච්චයො මග්ග පච්චයො සම්පයුත්ත පච්චයො විප්පයුත්ත පච්චයො අත්ථි පච්චයො නත්ථි පච්චයො විගත පච්චයො අවිගත පච්චයොති අයමෙත්ථ පට්ඨාන නයො.

465. ඡධා නාමන්තු නාමස්ස - පඤ්චධා නාමරූපිනං
එකධා පුන රූපස්ස - රූපං නාමස්ස චෙකධා,

466. පඤ්ඤත්ති නාම රූපානි - නාමස්ස දුවිධා ද්වයං
ද්වයස්ස නවධා චෙති - ඡබ්බිධා පච්චයා කථං.

459. මෙහි අවිද්‍යා සංස්කාරයන් ගැනීමෙන් තෘෂ්ණා උපාදාන භවයෝ ද ගන්නා ලද්දහු වෙති. තෘෂ්ණා උපාදන භවයන් ගැනීමෙන් අවිද්‍යා සංස්කාරයෝ ද ගන්නා ලද්දහු වෙති. ජාති ජරා මරණයන් ගැනීමෙන් ද විඥනාදි ඵල පඤ්චකය ම ගන්නා ලද්දේ ය. එහෙයින් -

460. අතීත හේතු පසෙක් ද වර්තමාන ඵල පසෙක් ද වර්තමාන හේතු පසෙක් ද අනාගත ඵල පසෙක් ද වෙත්. මෙසේ විසි ආකාරයෝ ද ත්‍රිසන්ධිය ද සතර කොට්ඨාසයෝ ද වෙත්.

461. අවිද්‍යාව හා තෘෂ්ණා උපාදනයෝ ද ක්ලේශවෘත්තයයි. කර්මභවයයි කියන ලද භවයාගේ කොටසක් හා සංස්කාරයෝ ද කර්මවෘත්තය යි. උත්පත්ති භවයයි කියන ලද භවයෙන් කොටසක් හා විඥනාදි අවශේෂයෝ ද විපාක වෘත්තය යි. මෙසේ තුනක් වූ වෘත්තයෝ වෙත්. අවිද්‍යා තෘෂ්ණාවන්ගේ වශයෙන් දෙකක් වූ මූලයෝ ද දත යුත්තාහු ය.

462. ඒ මූලයන්ගේ නිරෝධයෙන් වෘත්තය නිරුද්ධ වේ. නිරන්තරයෙන් ජරා මරණ සංඛ්‍යාත මෑච්ඡාවෙන් පීඩිත වූ සත්ත්වයන් හට ආශ්‍රවයන්ගේ උත්පත්තිය හේතු කොට අවිද්‍යාව ද පවත්නී ය.

463. මේ කියන ලද ක්‍රමයෙන් අවිච්ඡින්න වූ මූලක් නැත්තා වූ ත්‍රෛභූමක වූ වෘත්තය ප්‍රතීත්‍ය සමුත්පාදය යි සර්වඥයන් වහන්සේ පැනවූ සේක.

464. හේතුප්‍රත්‍යය -පෙ- අවිගත ප්‍රත්‍යය යන මෙය මෙහි ප්‍රස්ථාන නය යි.

465. නාමය නාමයට සයාකාරයකින් ප්‍රත්‍යය වේ. නාම රූප දෙකට පස් ආකාරයකින් ප්‍රත්‍යය වේ. නැවත රූපයට එක් ආකාර-යකින් ප්‍රත්‍යය වේ. රූපය නාමයට එක් ආකාරයකින් ප්‍රත්‍ය වේ.

466. ප්‍රඥප්ති නාමරූපයෝ නාමයට දෙයාකාරයකින් ප්‍රත්‍යය වේ. නාම රූප දෙක නාම රූප දෙකට නවාකාරයකින් ප්‍රත්‍යය වේ. මෙසේ ප්‍රත්‍යයෝ සයාකාර වන්නාහු ය. කෙසේ ද යත්.?

467. අනන්තර නිරුද්ධා චිත්තචෙතසිකා ධම්මා පච්චුප්පන්නානං චිත්තචෙතසිකානං ධම්මානං අනන්තර සමනන්තර නත්ථි විගත වසෙන, පුරිමානි ජවනානි පච්ඡිමානං ජවනානං ආසෙවන වසෙන, සහජාතා චිත්තචෙතසිකා ධම්මා අඤ්ඤ-මඤ්ඤං සම්පයුත්ත වසෙනෙති ච ඡධා නාමං නාමස්ස පච්චයො හොති.

468. හේතු ඣාන මග්ගංගානි සහජාතානං නාම රූපානං හෙතාදි වසෙන, සහජාතා චෙතනා සහජාතානං නාම රූපානං, නානක්ඛණිකා චෙතනා කම්මාභි නිබ්බත්තානං නාමරූපානං කම්ම වසෙන, විපාකක්ඛන්ධා අඤ්ඤමඤ්ඤා සහජාත රූපා-නංච විපාක වසෙනෙති ච පඤ්චධා නාමං නාම රූපානං පච්චයො හොති.

469. පච්ඡාජාතා චිත්තචෙතසිකා ධම්මා පුරෙජාතස්ස ඉමස්ස කායස්ස පච්ඡාජාත වසෙනෙති එකධා නාමං රූපස්ස පච්චයො හොති.

470. ඡවත්ථූනි පවත්තියං සත්තන්නං විඤ්ඤාණධාතූනං පඤ්චාර-ම්මණානි පඤ්චවිඤ්ඤාණ වීථියා ච පුරෙජාත වසෙනෙති එකධාව රූපං නාමස්ස පච්චයො හොති.

471. ආරම්මණ වසෙන උපනිස්සය වසෙනෙති ද්විධා පඤ්ඤත්ති නාමරූපානි නාමස්සෙව පච්චයා හොන්ති තත්ථ රූපාදි වසෙන ඡබ්බිධං හොති ආරම්මණං.

472. උපනිස්සයො පන තිවිධො හොති ආරම්මණූපනිස්සයෝ අනන්ත රූපනිස්සයො පකතූප නිස්සයොති ච, තත්ථ ආරම්මණමෙව ගරුකතං ආරම්මනූපනිස්සයො, අනන්තර නිරුද්ධා චිත්ත චෙතසිකා ධම්මා අනන්තරූපනිස්සයො, රාගාදයො පන ධම්මා සද්ධාදයො ච සුඛං දුක්ඛං පුග්ගලො භොජනං උතු සෙනාසනඤ්ච යථාරහං අජ්ඣත්තා ච බහිද්ධා ච කුසලාදි ධම්මානං කම්මං විපාකන්ති ච බහුධා හොති පකතූපනිස්සයො.

473. අධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සයා හාරින්ද්‍රිය විප්පයුත්ත අත්ථි අවිගත වසෙනෙති යථාරහං නවධා නාමරූපානි නාම රූපානං පච්චයා හොන්ති.

467. අනන්තරයෙහි නිරුද්ධ වූ චිත්ත චෛතසික ධර්මයෝ පසුව උපදින්නා වූ චිත්තචෛතසික ධර්මයන්ට අනන්තර සමනන්තර නාස්ති විගත ශක්තීන්ගේ වශයෙන් ද පූර්වජවනයෝ පශ්චිම ජවනයන්ට ආසේවන වශයෙන් ද එක්ව උපදනා වූ චිත්ත චෛතසික ධර්මයෝ ඔවුනොවුන්ට සම්ප්‍රයුක්ත වශයෙන් දැයි සයාකාරයකින් නාමය නාමයට ම ප්‍රත්‍යය වේ.

468. හේතු ධ්‍යාන මාර්ගාංගයෝ සහජාත නාමරූපයන්ට හේත්වාදි වශයෙන් ද සහජාත චේතනාව සහජාත නාම රූපයන්ට ද නානාක්ෂණික චේතනාව කර්මයෙන් හට ගන්නා නාමරූපයන්ට ද කර්ම ප්‍රත්‍යය වශයෙන් ද විපාක ස්කන්ධයෝ ඔවුනොවුන්ට හා සහජාත රූපයන්ට ද විපාක ප්‍රත්‍යය වශයෙන් ද යි පස් ආකාරයකින් නාමය නාමරූපයන්ට ප්‍රත්‍යය වේ.

469. පසුව උපදනා චිත්තචෛතසික ධර්මයෝ පෙර උපන්නා වූ මේ කයට පශ්චාජ්ජාත වශයෙන් එක් ආකාරයකින් නාමය රූපයට ප්‍රත්‍යය වේ.

470. ෂඩ්වස්තූහු ප්‍රවෘත්ති කාලයෙහි සතක් වූ විඤ්ඤාණධාතූන්ට ද පඤ්චාරම්මණයෝ පඤ්චවිඤ්ඤාණ වීථියට ද පුරේජාත වශයෙන් මෙසේ එක් ආකාරයකින් ම රූපය නාමයට ප්‍රත්‍යය වේ.

471. ආරම්මණ වශයෙන් ද උපනිශ්‍රය වශයෙන් දැයි දෙපරිද්දෙකින් ප්‍රඥප්ති නාමරූපයෝ නාමයට ම ප්‍රත්‍යය වෙති. ඒ ආරම්මණ ප්‍රත්‍යයෙහි ආරම්මණ රූපාදි වශයෙන් ෂට්ප්‍රකාර වේ.

472. උපනිශ්‍රයය වනාහි ආරම්මණූපනිශ්‍රයය අනන්තරූප නිශ්‍රයය ප්‍රකෘත්‍යූපනිශ්‍රයයයි ත්‍රිවිධ වේ. එහි ගරු කළ යුතු වූ ආරම්-මණය ම ආරම්මණූපනිශ්‍රයයි. අනන්තරයෙහි නිරුද්ධ වූ චිත්ත චෛතසික ධර්මයෝ අනන්තරූපනිශ්‍රයයි. රාගාදි ධර්මයෝ ද ශ්‍රද්ධාදීහු ද සුඛය ද දුඃඛය ද පුද්ගලයෝ ද භෝජනය ද ඍතුව ද සෙනසුන් ද සුදුසු පරිද්දෙන් ආධ්‍යාත්මික වූ ද බාහ්‍ය වූ ද කුශලාදි ධර්මයන්ට ද කර්ම විපාකයන්ට දැයි බහුප්‍රකාරයෙන් ප්‍රකෘත්‍යූපනිශ්‍රය ප්‍රත්‍යය වේ.

473. අධිපතිය සහජාතය අන්‍යෝන්‍ය නිශ්‍රයය ආහාරය ඉන්ද්‍රියය විප්‍රයුක්තය අස්තිය අවිගතය යන මොවුන්ගේ වශයෙන් සුදුසු පරිද්දෙන් නවාකාරයකින් නාමරූපයෝ නාමරූපයන්ට ප්‍රත්‍යය වෙත්.

474. තත්ථ ගරුකත මාලම්බනං ආරම්මණාධිපති වසෙන නාමානං, සහජාතාධිපති චතුබ්බිධොපි සහජාත වසෙන සහජාතානං නාම රූපානන්ති ච දුවිධො හොති අධිපති පච්චයො.

475. චිත්ත චෙතසිකා ධම්මා අඤ්ඤමඤ්ඤං සහජාත රූපානඤ්ච, මහාභූතා අඤ්ඤමඤ්ඤං උපාදාය රූපානඤ්ච, පටිසන්ධික්-ඛණෙ වත්ථු විපාකා අඤ්ඤමඤ්ඤන්ති ච තිවිධො හොති සහජාත පච්චයො.

476. චිත්තචෙතසිකා ධම්මා අඤ්මඤ්ඤං මහාභූතා අඤ්ඤමඤ්ඤං පටිසන්ධික්ඛණෙ වත්ථුවිපාකා අඤ්ඤමඤ්ඤන්ති ච තිවිධො හොති අඤ්ඤමඤ්ඤ පච්චයො.

477. චිත්තචෙතසිකා ධම්මා අඤ්ඤමඤ්ඤං සහජාත රූපානඤ්ච මහාභූතා අඤ්ඤමඤ්ඤං උපාදාය රූපානඤ්ච ඡවත්ථූනි සත්තන්නං විඤ්ඤාණ ධාතූනන්ති ච තිවිධො හොති නිස්සය පච්චයො.

478. කබලිංකාරො ආහාරො ඉමස්ස කායස්ස, අරූපිනො ආහාරා අසහජාතානං නාමරූපානන්ති ච දුවිධො හොති ආහාර පච්චයො.

479. පඤ්චපප්පසාදා පඤ්චන්නං විඤ්ඤාණානං, රූප ජීවිතින්ද්‍රියං උපාදින්න රූපානං අරූපිනො ඉන්ද්‍රිය සහජාතානං නාම රූපානන්ති ච තිවිධො හොති ඉන්ද්‍රිය පච්චයො.

480. ඔක්කන්තික්ඛණෙ වත්ථු විපාකානං, චිත්තචෙතසිකා ධම්මා සහජාත රූපානං සහජාත වසෙන, පච්චාජාතා චිත්තචෙතසිකා ධම්මා පුරෙජාතස්ස ඉමස්ස කායස්ස පච්ඡාජාත වසෙන, ඡවත්ථූනි පවත්තියං සත්තන්නං විඤ්ඤාණධාතූනං පුරෙජාත වසෙනෙති ච තිවිධො හොති විප්පයුත්ත පච්චයො.

481. සහජාතං පුරෙජාතං පච්ඡාජාතඤ්ච සබ්බථා, කබලිංකාරො ආහාරො රූපජීවිත මච්චයන්ති පඤ්ච විධො හොති අත්ථිපච්චයො අවිගත පච්චයො ච.

474. එහි ගරු කළ යුතු ආරම්මණය ආරම්මණාධිපති වශයෙන් නාමයන්ට ද චතුර්විධ වූ ද සහජාතාධිපතිය සහජාත වශයෙන් සහජාත නාමරූපයන්ටද යි අධිපති ප්‍රත්‍යය දෙ-වැදෑරුම් වේ.

475. චිත්ත චෛතසික ධර්මයෝ ඔවුනොවුන්ට හා සහජාත රූපයන්ට ද මහාභූතයෝ ඔවුනොවුන්ට හා උපාදාය රූපයන්ට ද ප්‍රතිසන්ධි ක්ෂණයෙහි හෘදය වස්තුව හා විපාකස්කන්ධයන් ඔවුනොවුන්ටද යි සහජාත ප්‍රත්‍යය ත්‍රිවිධ වේ.

476. චිත්තචෛතසික ධර්මයෝ ඔවුනොවුන්ට ද මහාභූතයෝ ඔවුනොවුන්ට ද ප්‍රතිසන්ධි ක්ෂණයෙහි වස්තුවිපාකයෝ ඔවු-නොවුන්ටද යි අන්‍යෝන්‍ය ප්‍රත්‍යය ත්‍රිවිධ වේ.

477. චිත්ත චෛතසික ධර්මයෝ ඔවුනොවුන්ට හා සහජාත රූපයන්ට ද මහාභූතයෝ ඔවුනොවුන්ට හා උපාදාය රූපයන්ට ද ෂට්වස්තූහු සප්ත විඥානධාතූන්ට ද යි නිශ්‍රය ප්‍රත්‍යය ත්‍රිවිධ වේ.

478. කබලිංකාරාහාරය මේ කයට ද අරූපී ඉන්ද්‍රියයෝ සහජාත වූ නාමරූපයන්ටද යි ආහාර ප්‍රත්‍යය ද්විප්‍රකාර වේ.

479. පඤ්චප්‍රසාදයෝ පඤ්චවිඥානයන්ට ද රූප ජීවිතේන්ද්‍රිය උපාදින්නරූපයන්ට ද අරූපී ඉන්ද්‍රියයෝ සහජාත නාම රූපයන්ටද යි ඉන්ද්‍රිය ප්‍රත්‍යය ත්‍රිවිධ වේ.

480. ප්‍රතිසන්ධි ක්ෂණයෙහි හෘදයවස්තුව විපාකයන්ට ද, චිත්තචෛතසික ධර්මයෝ සහජාත රූපයන්ට ද සහජාත වශයෙන් ද, පශ්චාජ්ජාත වූ චිත්තචෛතසික ධර්මයෝ පුරේජාත වූ මේ කයට පශ්චාජ්ජාත වශයෙන් ද ෂඩ්වස්තූහු ප්‍රවෘත්ති කාලයෙහි සප්තවිඥාන ධාතූන්ට පුරේජාත වශයෙන්ද යි විප්‍රයුක්ත ප්‍රත්‍යය ත්‍රිවිධ වේ.

481. සර්වප්‍රකාරයෙන් සහජාතය පුරේජාතය පශ්චාජ්ජාතය කබලිංකාර ආහාරය රූපජීවිතේන්ද්‍රියය යන පඤ්චප්‍රකාර වූ මෙය අස්තිප්‍රත්‍යය ද අවිගත ප්‍රත්‍යය ද වන්නේ ය.

482. ආරම්මණූපනිස්සය කම්මත්ථිපච්චයෙසු ච සබ්බෙපි පච්චයා සමොධානං ගච්ඡන්ති.

483. සහජාත රූපන්ති පනෙත්ථ සබ්බත්ථාපි පවත්තෙ, චිත්ත සමුට්ඨානානං පටිසන්ධියං කටත්තා රූපානඤ්ච වසෙන දුවිධං හොතීති වෙදිතබ්බං.

484. ඉති තෙකාලිකා ධම්මා - කාලමුත්තා ච සම්භවා
අජ්ඣත්තඤ්ච බහිද්ධා ච - සංඛතා සංඛතා තථා.
පඤ්ඤත්ති නාම රූපානං - වසෙන තිවිධා ඨිතා.
පච්චයා නාම පට්ඨානෙ - චතුවීසති සබ්බථා.

485. තත්ථ රූපධම්මා රූපක්ඛන්ධො ච, චිත්තචෙතසික සංඛාතා චත්තාරො අරූපිනො ඛන්ධා නිබ්බානං චෙති පඤ්චවිධම්පි අරූපන්ති ච නාමන්ති ච පවුච්චති.

486. තතො අවසෙසා පඤ්ඤත්ති පන පඤ්ඤාපියත්තා පඤ්ඤත්ති පඤ්ඤාපනතො පඤ්ඤත්තීති ච දුවිධා හොති.

487. කථං? තං තං භූත විපරිණාමාකාර මුපාදාය තථා තථා පඤ්ඤත්තා භූමි පබ්බතාදිකා, සම්භාර සන්නිවෙසාකාර මුපාදාය ගෙහරථ සකටාදිකා ඛන්ධපඤ්චක මුපාදාය පුරිසපුග්ගලාදිකා, චන්දා වට්ටනාදිකමුපාදය දිසාකාලාදිකා, අසම්ඵුට්ඨාකාර මුපාදාය කූපගුහාදිකා, තං තං භූත නිමිත්තං භාවනා විසෙසංච උපාදාය කසිණ නිමිත්තාදිකා චෙති එව මාදිප්පභෙදා පන පරමත්ථතො අවිජ්ජමානාපි අත්ථ-ච්ඡායාකාරෙන චිත්තුප්පාදාන මාරම්මණභූතා තං තං උපාදාය උපනිධාය කාරණං කත්වා තථා තථා පරිකප්පියමානා සංඛායති සමඤ්ඤායති වොහරීයති පඤ්ඤාපීයතීති පඤ්ඤත්තීති පවුච්චති. අයං පඤ්ඤත්ති, පඤ්ඤාපියත්තා පඤ්ඤත්ති නාම.

482. ආරම්මණය උපනිශ්‍රය කර්මය අස්තිය යන මේ ප්‍රත්‍යයන්හි සියලු ප්‍රත්‍යයෝ ම සංග්‍රහයට යෙත්.

483. සහජාතරූපය යන මෙහි සෑම තන්හි ම ප්‍රවෘත්තිකාල-යෙහි චිත්තසමුට්ඨාන රූපයන්ගේ ද ප්‍රතිසන්ධියෙහි කර්මජ රූපයන්ගේ ද වශයෙන් ද්විප්‍රකාර වේයයි දත යුතු.

484. මෙසේ ලැබෙන පරිද්දෙන් ත්‍රෛකාලිකවූ ද කාලත්‍රය මුක්ත වූ ද ආධ්‍යාත්මික වූ ද බාහ්‍ය වූ ද එසේ ම සංස්කෘත වූ ද අසංස්කෘත වූ ද ප්‍රඥප්ති නාම රූපයන්ගේ වශයෙන් තුන් ආකාරයෙන් සිටියා වූ ධර්මයෝ සර්වාකාරයෙන් අනන්ත නය සමන්තප්‍රස්ථාන ප්‍රකරණයෙහි සර්වාකාරයෙන් සූවිස්සක් වූ ප්‍රත්‍යයෝ නම් වෙති.

485. ඒ ධර්මයන් අතුරෙන් රූප ධර්මයෝ නම් රූපස්කන්ධය ම ය. චිත්තචෛතසිකයෝය යි කියන ලද නාමස්කන්ධයෝ ද නිර්වාණය ද යන පඤ්චප්‍රකාර වූ ධර්ම සමූහය අරූපය යි ද නාමය යි ද කියනු ලැබේ.

486. එයින් ඉතිරි වූ ප්‍රඥප්තිය වනාහි පනවන ලද හෙයින් ප්‍රඥප්තිය යි කියා ද පනවන හෙයින් ප්‍රඥප්තියයි කියා ද ද්විප්‍රකාර වේ.

487. කෙසේද යත්? - පෘථිව්‍යාදි ඒ ඒ භූතයන්ගේ අධික බව ආදි ප්‍රවෘත්ති විශේෂය නිසා ඒ ඒ ආකාරයෙන් පනවන ලද්ද වූ භූමි පර්වතාදි ප්‍රඥප්තිය ද, උපකරණයන් ගේ එක් රැස් වූ ආකාරය ගෙන පනවන ලද ගෘහ රථ සකටාදි ප්‍රඥප්තිය ද, ස්කන්ධපඤ්චකය නිසා පනවන ලද්දවූ පුරුෂපුද්ගලාදි ප්‍රඥප්තිය ද, චන්ද්‍රාදීන්ගේ ආවර්තනාදිය නිසා පනවන ලද්දවූ දිශාකාලාදි ප්‍රඥප්තිය ද, ස්පර්ශ නොවන්නා වූ ආකාරය නිසා පනවන ලද්ද වූ වළය ගුහාවය යනාදි ප්‍රඥප්තිය ද ඒ ඒ භූතයන්ගේ නිමිත්ත හා පරිකර්මභාවනාදි භාවනා විශේෂය ද නිසා පනවන ලද්දවූ කසිණ නිමිත්තාදි වූ ප්‍රඥප්තිය ද යන මේ ආදි ප්‍රභේද ඇති පරමාර්ථ වශයෙන් අවිද්‍යමාන වූ ද පරමාර්ථ ධර්මයන්ගේ ප්‍රතිබිම්බාකාරයෙන් චිත්තෝත්පාදයන්ට අරමුණු වන්නා වූ ප්‍රඥප්තිය ඒ ඒ විපරිණාම සන්නිවේසාදි ආකාරය කරුණු කොට ඒ ඒ ආකාරයෙන් කල්පනා කරනු ලබන්නී කියනු ලැබේ. දන්නා ලැබේ. ව්‍යාවහාර කරනු ලැබේ. පනවනු ලැබේ. එහෙයින් ප්‍රඥප්තියයි කියනු ලැබේ. මේ උපාදය ප්‍රඥප්තිය පනවන ලද හෙයින් ප්‍රඥප්ති නම් වේ.

488. පඤ්ඤාපනතො පඤ්ඤත්ති පන නාම නාමකම්මාදි නාමෙන පරිදීපිතා.

489. සා විජ්ජමාන පඤ්ඤත්ති, අවිජ්ජමාන පඤ්ඤත්ති. විජ්ජ-මානෙන අවිජ්ජමාන පඤ්ඤත්ති, අවිජ්ජමානෙන විජ්ජමාන පඤ්ඤත්ති, විජ්ජමානෙන විජ්ජමාන පඤ්ඤත්ති, අවිජ්ජමානෙන අවිජ්ජමාන පඤ්ඤත්ති චෙති ඡබ්බිධා හොති.

490. තත්ථ යදා පරමත්ථතො විජ්ජමානං රූපවේදනාදිං එතාය පඤ්ඤාපෙන්ති තදා යං විජ්ජමාන පඤ්ඤත්තී ති පවුච්චති. යදා පන පරමත්ථතො අවිජ්ජමානං භූමිපබ්බතාදිං එතාය පඤ්ඤාපෙන්ති. තදා යං අවිජ්ජමාන පඤ්ඤත්තීති පවුච්චති. උභින්නං පන වොමිස්සක වසෙන යථාක්කමං ඡළභිඤ්ඤො ඉත්ථිසද්දො චක්ඛු විඤ්ඤාණං රාජපුත්තොති ච වේදිතබ්බො.

491. වචීඝොසානුසාරෙන - සොතවිඤ්ඤාණ වීථියා
පවත්තානන්තරුප්පන්න - මනොද්වාරස්ස ගොචරා.
අත්ථායස්සානු සාරෙන - විඤ්ඤායන්ති තතොපරං,
සායං පඤ්ඤත්ති විඤ්ඤෙය්‍යා - ලොකසංකේත නිම්මිතා.

ඉති අභිධම්මත්ථ සංගහෙ පච්චය සංගහ
විභාගො නාම අට්ඨමො පරිච්ඡෙදො.

488. පනවන හෙයින් ප්‍රඥප්තියයි කියන ලද නාමප්‍රඥප්තිය වනාහි නාමය නාමකර්මය යනාදි නාමයෙන් දක්වන ලද්දේ ය.

489. එය විද්‍යමාන ප්‍රඥප්තිය, අවිද්‍යමාන ප්‍රඥප්තිය, විද්‍යමානයෙන් අවිද්‍යමාන ප්‍රඥප්තිය, අවිද්‍යමානයෙන් විද්‍යමාන ප්‍රඥප්තිය, විද්‍යමානයෙන් විද්‍යමාන ප්‍රඥප්තිය, අවිද්‍යමානයෙන් අවිද්‍යමාන ප්‍රඥප්තියයි ෂට්ප්‍රකාර වේ.

490. ඒ සයක් වූ ප්‍රඥප්තීන් අතුරෙහි යම් කලෙක පරමාර්ථ වශයෙන් විද්‍යමාන වූ රූප වේදනාදිය එය කරණකොට ගෙන පනවා ද? එකල්හි එය විද්‍යමාන ප්‍රඥප්තියයි කියනු ලැබේ. යම් කලෙක්හි වනාහි පරමාර්ථ වශයෙන් අවිද්‍යමාන වූ භූමි පර්වතාදිය එය කරණකොට ගෙන පනවාද? එකල්හි එය අවිද්‍යමාන ප්‍රඥප්ති යයි කියනු ලැබේ. දෙදෙනාගේ ව්‍යතිමිශ්‍ර වශයෙන් අවශේෂ ප්‍රඥප්තීහු පිළිවෙළින් ෂඩභිඥ ඇත්තේ ය. ස්ත්‍රීශබ්දය ය චක්ෂුර්-විඥනය රාජපුත්‍රයාය කියා දත යුත්තේ ය.

491. වාග්මය වූ ශබ්දයාගේ අනුසාරයෙන් හට ගත්තා වූ ශ්‍රෝත්‍ර විඥන වීථියගේ පැවැත්මට අනතුරුවැ උපන්නා වූ නම සිහි කරන ආකාරයෙන් පවත්නා වූ මනෝද්වාර වීථියට අරමුණු ඒ මනෝද්වාර වීථියෙන් පසු යම් නාම ප්‍රඥප්තියක අනුසාරයෙන් භූමි පර්වත වේදනාදි වූ අර්ථයෝ දන්නා ලැබෙත් ද? ඒ මේ නාම ප්‍රඥප්තිය ලෝක ව්‍යවහාරයෙන් නිර්මිතය යි දත යුත්තේ ය.

මෙය අභිධර්මාර්ථ සංග්‍රහයෙහි ප්‍රත්‍යය සංග්‍රහ

විභාග නම් වූ අෂ්ටම පරිච්ඡේදය යි.

# නවමො පරිච්ඡෙදෙ

492. සමථ විපස්සනානං - භාවනානමිතො පරං,
කම්මට්ඨානං පවක්ඛාමි - දුවිධම්පි යථාරහං.

493. තත්ථ සමථසංගහෙ තාව දස කසිණානි දස අසුභා දස අනුස්සතියො චතස්සො අප්පමඤ්ඤායො එකා සඤ්ඤා එකං වවත්ථානං චත්තාරො ආරුප්පා චෙති සත්තවිධෙන සමථ කම්මට්ඨාන සංගහො.

494. රාගචරිතා දොසචරිතා මොහචරිතා සද්ධාචරිතා බුද්ධිචරිතා විතක්කචරිතා චෙති ඡබ්බිධෙන චරිත සංගහො.

495. පරිකම්මභාවනා උපචාරභාවනා අප්පනාභාවනා චෙති තිස්සො භාවනා.

496. පරිකම්මනිමිත්තං උග්ගහනිමිත්තං පටිභාග නිමිත්තඤ්චෙති තීණි නිමිත්තානි ච වෙදිතබ්බානි.

497. කථං? පථවීකසිණං ආපොකසිණං තෙජො කසිණං වායොකසිණං නීලකසිණං පීතකසිණං ලොහිත කසිණං ඔදාතකසිණං ආලොකකසිණං ආකාස කසිණං චෙති ඉමානි දස කසිණානි නාම.

498. උද්ධුමාතකං විනීලකං විපුබ්බකං විච්ඡිද්දකං වික්ඛායිතකං වික්ඛිත්තකං හතවික්ඛිත්තකං ලොහිතකං පුළවකං අට්ඨි-කඤ්චෙති ඉමා දස අසුභා නාම.

499. බුද්ධානුස්සති ධම්මානුස්සති සංඝානුස්සති සීලානුස්සති චාගානුස්සති දෙවතානුස්සති උපසමානුස්සති මරණානුස්සති කායගතාසති ආනාපානසති චෙති ඉමා දස අනුස්සතියො නාම.

# නවම පරිච්ඡේදය

492. මෙයින් මතු සමථ විදර්ශනා භාවනාවන්ගේ ද්විප්‍රකාර වූ කර්මස්ථානය සුදුසු පරිද්දෙන් කියන්නෙමි.

493. ඒ භාවනාවන් අතුරෙන් දශකසිණයෝය දශ අශුභයෝය දශානුස්මෘතීහුය සතර අප්‍රමාණ්‍යයෝය එකක් වූ සංඥාවය එකක් වූ ව්‍යවස්ථානය සතර ආරූප්‍යයෝය යි සප්තප්‍රකාරයකින් සමථ කර්මස්ථාන සංග්‍රහය වේ.

494. රාග චරිතය ද්වේෂචරිතය මෝහ චරිතය ශ්‍රද්ධා චරිතය බුද්ධිචරිතය විතර්කචරිතය යි සයාකාරයකින් චරිත සංග්‍රහය වේ.

495. පරිකර්මභාවනාය උපචාර භාවනාය අර්පණා භාවනාය යි භාවනා තුනෙකි.

496. පරිකර්ම නිමිත්තය උද්ග්‍රහ නිමිත්තය ප්‍රතිභාග නිමිත්තය යි නිමිති තුන ද දත යුතු යි.

497. කෙසේද යත්? පෘථිවිකසිණය -පෙ- ආලෝක කසිණය යන මේ දශය කසිණයෝ නම් වෙත්.

498. ඉදිමුණු මළසිරුරය, නිල් වූ මළසිරුරුය, ගලන සැරව ඇති මළසිරුරය, මැදින් සිඳී දෙකට වෙන්වූ මළසිරුරය, බලු සිවල් ආදීන් කෑ මළසිරුරය, බලු සිවල් ආදීන් විසින් කා කඩ කඩ කොට ඒ මේ අත ඇද දමන ලද මළසිරුරය, කාකපාදාදි ආකාරයෙන් සැමතැන ම කපා කඩ කඩ කොට විසුරුවන ලද මළසිරුරය, ලෙහෙ ගලන මළසිරුරය, ඇටසැකිල්ලය යන මේ දශය අශුභයෝ නම් වෙත්.

499. බුද්ධානුස්මෘතිය -පෙ- ආනාපානස්මෘතිය යන මේ දශය අනුස්මෘතීහු නම් වෙති.

500. මෙත්තා කරුණා මුදිතා උපෙක්ඛා චෙති ඉමා චතස්සො අප්පමඤ්ඤායො නාම. බ්‍රහ්මවිහාරාති පි වුච්චන්ති.

501. ආහාරෙ පටික්කූලසඤ්ඤා එකා සඤ්ඤා නාම.

502. චතුධාතු වවත්ථානං එකං වවත්ථානං නාම.

503. ආකාසානඤ්චායතනාදයො චත්තාරො ආරුප්පා නාමාති සබ්බථාපි සමථ නිද්දෙසෙ චත්තාලීස කම්මට්ඨානාති භවන්ති.

504. චරිතාසු පන දස අසුභා කායගතාසති සංඛාතා කොට්ඨාස භාවනා ච රාගචරිතස්ස සප්පායා.

505. චතස්සො අප්පමඤ්ඤායො නීලාදීනි ච චත්තාරි කසිණානි දොසචරිතස්ස.

506. ආනාපානං මොහචරිතස්ස විතක්ක චරිතස්ස ච.

507. බුද්ධානුස්සති ආදයො ඡ සද්ධාචරිතස්ස.

508. මරණොපසම සඤ්ඤා වවත්ථානානි බුද්ධි චරිතස්ස.

509. සෙසානි පන සබ්බානිපි කම්මට්ඨානානි සබ්බෙසම්පි සප්පායානි.

510. තත්ථාපි කසිණෙසු පුථුලං මොහචරිතස්ස, ඛුද්දකං විතක්ක චරිතස්සෙති.

අයමෙත්ථ සප්පාය භෙදො.

511. භාවනාසු පන සබ්බත්ථාපි පරිකම්මභාවනා ලබ්භතෙව, බුද්ධානුස්සති ආදිසු අට්ඨසු සඤ්ඤාවවත්ථානෙසු චාති දසසු කම්මට්ඨානෙසු උපචාර භාවනාව සම්පජ්ජති නත්ථි අප්පනා. සෙසෙසු පන සමතිංස කම්මට්ඨානෙසු අප්පනා භාවනා සම්පජ්ජති.

500. මෛත්‍රියය කරුණාවය මුදිතාවය උපෙක්ෂාවය යන මේ සතර අප්‍රමාණ්‍යයෝ නම් වෙති. බ්‍රහ්ම විහාරයෝ‍යයි ද කියනු ලැබෙත්.

501. ආහාරයෙහි ප්‍රතික්කුල සංඥව ඒකා සංඥ නම් වේ.

502. ධාතුසතර ලක්‍ෂණාදි වශයෙන් නිශ්චය කිරීම ඒක ව්‍යවස්ථාන නම් වේ.

503. ආකාසානඤ්චායතනාදි සතර ආරූප්‍යයෝ නම් වෙති. මෙසේ සර්වාකාරයෙන් සමථ නිර්දේශයෙහි සතලිසක් කර්මස්ථානයෝ වෙත්.

504. චරිතයන් අතුරෙන් දශාශුභයෝ ද කායගතානුස්මෘති යයි කියන ලද කොට්ඨාස භාවනාව ද යන මොහු රාගචරිතයාහට සුදුසු ය.

505. සතර අප්‍රමාණ්‍යයෝ ද නීලාදි වූ වර්ණකසිණ සතර ද යන මොහු ද්වේෂචරිතයාහට සුදුසු ය.

506. ආනාපාන භාවනාව මෝහචරිතයාහට හා විතර්ක-චරිතයාහට සුදුසු ය.

507. බුද්ධානුස්මෘති ආදි සය ශ්‍රද්ධා චරිතයාහට සුදුසු ය.

508. මරණානුස්මෘති උපසමානුස්මෘති ආහාරයෙහි ප්‍රතික්කුල සංඥ යන මොහු බුද්ධිචරිතයාට සුදුසු ය.

509. ඉතිරි සියලු කර්මස්ථානයෝ සැමට ම සුදුසු ය.

510. එයිනුදු කසිණයන් අතුරෙන් මහත් වූ කසිණය මෝහ චරිතයාට ද කුඩා වූ කසිණය විතර්ක චරිතයාට ද සුදුසු ය.

මෙය මෙහි සත්ප්‍රාය භේදය යි.

511. භාවනාවන් අතුරෙහි වනාහි සියල්ලෙහි ම පරිකර්ම භාවනාව ලැබේ ම ය. බුද්ධානුස්මෘති ආදි අටෙහි හා සංඥ ව්‍යවස්ථානයන්හි ද යන දශයක් වූ කර්මස්ථානයන්හි උපචාරභාවනාව ම ලැබේ. අර්පණා සමාධිය නො ලැබේ. අවශේෂ වූ සතිස් කර්මස්ථානයෙහි අර්පණා භාවනාව ද ලැබේ.

512. තත්ථාපි දසකසිණානි ආනාපානඤ්ච පඤ්චකජ්ඣානිකා.

513. දස අසුභා කායගතාසති ච පඨමජ්ඣානිකා.

514. මෙත්තාදයො තයො චතුක්කජ්ඣානිකා.

515. උපෙක්ඛා පඤ්චමජ්ඣානිකාති ඡබ්බීසති රූපාවචරජ්ඣානික කම්මට්ඨානානි.

516. චත්තාරො ආරුප්පා ආරුප්පජ්ඣානිකාති.

අයමෙත්ථ භාවනා භෙදො.

517. නිමිත්තෙසු පන පරිකම්මනිමිත්තං උග්ගහ නිමිත්තඤ්ච සබ්බත්ථාපි යථාරහං පරියායෙන ලබ්භනෙව. පටිභාගනිමිත්තං පන කසිණාසුභ කොට්ඨාස ආනාපානෙස්වෙව ලබ්භති. තත්ථහි පටිභාගනිමිත්ත මාරබ්බ උපචාරසමාධි අප්පනා සමාධි ච පවත්තති.

518. කථං? ආදිකම්මිකස්ස පඨවිමණ්ඩලාදිසු නිමිත්තං උග්ගණ්හන්තස්ස තමාරම්මණං පරිකම්ම නිමිත්තන්ති පවුච්චති. සාච භාවනා පරිකම්ම භාවනා නාම.

519. යද පන තන්නිමිත්තං චිත්තේන සමුග්ගහිතං හොති. චක්ඛුනා පස්සන්තස්සෙව මනොද්වාරස්ස ආපාත මාගතං, තදා තමෙවාරම්මණං උග්ගහ නිමිත්තං නාම. සාච භාවනා සමාධියති.

520. තථා සමාහිතස්ස පන තස්ස තතො පරං තස්මිං උග්ගහ නිමිත්තෙ පරිකම්මසමාධිනා භාවනා මනුයුඤ්ජන්තස්ස යදා තප්පටිභාගං වත්ථුධම්ම විමුච්චිතං පඤ්ඤත්ති සංඛාතං භාවනාමය මාලම්බනං චිත්තෙ සන්නිසින්නං සමප්පිතං හොති, තදා පටිභාග නිමිත්තං සමුප්පන්නන්ති පවුච්චති.

521. තතො පට්ඨායෙව ච පරිපන්ථ විප්පහීනා කාමාවචර සමාධි සංඛාතා උපචාර භාවනා නිප්ඵන්නා නාම හොති. තතො පරං තමෙව පටිභාග නිමිත්තං උපචාර සමාධිනා සමාසෙවන්තස්ස රූපාවචර පඨමජ්ඣානමප්පෙති.

512. ඒ කර්මස්ථානයන් අතුරෙන් දසකසිණය හා ආනාපානය පඤ්චකධ්‍යානික ය.

513. දශාශුභය හා කායගතානුස්මෘතිය ද ප්‍රථම ධ්‍යානික ය.

514. මෛත්‍ර්‍යාදි තුන චතුෂ්කධ්‍යානික ය.

515. උපේක්ෂාව පඤ්චකධ්‍යානිකය. මේ සවිස්ස රූපාවචර-ධ්‍යානික කර්මස්ථානයෝ ය.

516. සතර දෙනෙක් වූ ආරූප්‍යයෝ අරූපධ්‍යානිකයෝ ය.

මෙය මෙහි භාවනා භේදය යි.

517. නිමිත්තයන් අතුරෙන් පරිකර්මනිමිත්ත හා උද්ග්‍රහ නිමිත්ත ද සියලු කමටහනෙහි ම සුදුසු පරිද්දෙන් පර්යායයෙන් ලැබේ ම ය. ප්‍රතිභාග නිමිත්ත වනාහි කසින අශුභ කොට්ඨාස ආනාපානයන්හි ම ලැබේ. ඒ කසිණාදියෙහි ප්‍රතිභාග නිමිත්ත අරමුණු කොට උපචාරසමාධිය හා අර්පණාසමාධිය ද පවතී.

518. කෙසේද යත්? - පෘථිවිමණ්ඩලාදියෙහි නිමිත්ත ගන්නා වූ ආදි කර්මිකයාගේ ඒ ආරම්මණය පරිකර්ම නිමිත්තය යි කියනු ලැබේ. ඒ භාවනාව ද පරිකර්ම භාවනාව නම්.

519. යම් කලෙක ඒ නිමිත්ත චිත්තයෙන් මනා කොට ගන්නා ලද්දේ වේ ද ඇසින් බලන්නකුට මෙන් මනෝද්වාරයට හමුවූයේ වේ ද එකල්හි ඒ ආරම්මණය උද්ග්‍රහ නිමිත්ත නම්. ඒ භාවනාව ද සමාධියට පැමිණේ.

520. එසේ සමාධියට පැමිණියා වූ ඔහුට වනාහි ඉන් පසු ඒ උද්ග්‍රහ නිමිත්තයෙහි පරිකර්ම සමාධියෙන් භාවනාවෙහි යෙදෙන්නා හට යම්කලෙක ඒ උද්ග්‍රහ නිමිත්ත වැනි වූ පරමාර්ථ ධර්මයෙන් මුක්ත වූ ප්‍රඥප්ති යයි කියන ලද භාවනාවෙන් ජනිත ආරම්මණයක් චිත්තයෙහි පිහිටියේ වේ ද එකල්හි ප්‍රතිභාග නිමිත්ත උපන්නේය යි කියනු ලැබේ.

521. එතැන් පටන් නීවරණාදි උවදුරින් මිදුණා වූ කාමාවචර සමාධියයි කියන ලද උපචාර භාවනාව උපන්නේ නම් වෙයි. ඉන්පසු ඒ ප්‍රතිභාග නිමිත්ත ම උපචාර සමාධියෙන් නැවත නැවත සේවනය කරන්නා හට රූපාවචර ප්‍රථමධ්‍යානය පහළ වන්නේ ය.

522. තතො පරං තමෙව පඨමජ්ඣානං ආවජ්ජනා සමාපජ්ජනා අධිට්ඨානා වුට්ඨානා පච්චවෙක්ඛණා චෙති ඉමාහි පඤ්චහි වසීතාහි වසීභූතං කත්වා විතක්කාදි මොළාරිකංගප්පහානාය විචාරාදි සුඛුමංගුප්පත්තියා පදහතො යථාක්කමං දුතියජ්-ඣානාදයො යථාරහ මප්පෙන්ති.

523. ඉච්චේවං පඨවිකසිණාදීසු ද්වාවීසති කම්මට්ඨානෙසු පටිභාග නිමිත්ත මුපලබ්භති, අවසෙසෙසු පන අප්පමඤ්ඤා සත්ත-පඤ්ඤත්තියං පවත්තන්ති.

524. ආකාස වජ්ජිත කසිණෙසු පන යංකිඤ්චි කසිණ මුග්ඝාටෙත්වා ලද්ධමාකාසං අනන්ත වසෙන පරිකම්මං කරොන්තස්ස පඨමාරුප්පමප්පෙති.

525. තමෙව පඨමාරුප්ප විඤ්ඤාණං අනන්ත වසෙන පරිකම්මං කරොන්තස්ස දුතියාරුප්පමප්පෙති.

526. පඨමාරුප්ප විඤ්ඤාණාභාවං පන නත්ථිකිඤ්චීති පරිකම්මං කරොන්තස්ස තතියාරුප්පමප්පෙති.

527. තතියාරුප්පං "සන්තමෙතං පණීතමෙත" න්ති පරිකම්මං කරොන්තස්ස චතුත්ථාරුප්පමප්පෙති.

528. අවසෙසෙසු ච දසසු කම්මට්ඨානෙසු බුද්ධගුණාදික මාලම්බන මාරබ්භ පරිකම්මං කත්වා තස්මිං සාධුකමුග්ගහිතෙ තත්ථෙව පරිකම්මඤ්ච සමාධියති උපචාරො ච සම්පජ්ජති,

529. අභිඤ්ඤා වසෙන පවත්තමානං පන රූපාවචර පඤ්ච-මජ්ඣානං අභිඤ්ඤාපාදක පඤ්චමජ්ඣානා වුට්ඨහිත්වා අධිට්ඨෙය්‍යාදික මාවජ්ජිත්වා පරිකම්මං කරොන්තස්ස රූපාදීසු ආලම්බනෙසු යථාරහමප්පෙති.

530. අභිඤ්ඤා ච නාම -

ඉද්ධිවිධං දිබ්බසොතං - පරචිත්ත විජානනා,
පුබ්බේනිවාසානුස්සති - දිබ්බචක්ඛූති පඤ්චධා.

අයමෙත්ථ ගොචර භෙදො.
නිට්ඨිතො ච සමථ කම්මට්ඨාන නයො.

522. ඉන් පසු ඒ ප්‍රථමධ්‍යානය ම ආවර්ජනා වශීතාය සමාපජ්ජනා වශීතාය අධිෂ්ඨාන වශීතාය ව්‍යුස්ථාන වශිතාය ප්‍රත්‍යවේක්ෂා වශීතාය යන මේ පසක් වූ වශීතාවන්ගෙන් වශීභූතකොට විතර්කාදි ඖදාරිකාංග ප්‍රහාණය පිණිස ද විචාරාදි සූක්ෂ්මාංගයන් ඉපදීම පිණිස ද වෑයම් කරන්නාහට පිළිවෙළින් ද්විතීයධ්‍යානාදීහු උපදිති.

523. මෙසේ පෘථිවිකසිණාදි වූ දෙවිසි කර්මස්ථානයෙහි ප්‍රතිභාග නිමිත්ත ලැබේ. ඉතිරි කර්මස්ථානයන් අතුරෙන් වනාහි අප්‍රමාණ්‍යයෝ සත්ව ප්‍රඥප්තියෙහි පවතිත්.

524. ආකාශවර්ජිත කසිණයන් අතුරෙන් වනාහි යම්කිසි කසිණයක් උගුළුවා ලැබූ ආකාශය අනන්ත වශයෙන් පරිකර්ම කරන්නාහට ප්‍රථමාරූප්‍යය උපදනේ ය.

525. ඒ ප්‍රථමාරූප්‍ය විඥනය ම අනන්ත වශයෙන් භාවනා කරන්නා හට ද්විතීයාරූප්‍යධ්‍යානය උපදනේ ය.

526. ප්‍රථමාරූප්‍ය විඥනයාගේ අභාවය වනාහි 'නත්ථිකිඤ්චි' යි පරිකර්ම කරන්නාහට තෘතීයාරූප්‍යය උපදී.

527. තෘතියාරූප්‍ය විඥනය 'මෙය ශාන්තය මෙය ප්‍රණීතය' යි භාවනා කරන්නාහට චතුර්ථාරූප්‍යය උපදී.

528. අවශේෂ වූ දශකර්මස්ථානයෙහි බුද්ධ ගුණාදි ආරම්මණය අරමුණ කොට භාවනා කොට ඒ ආරම්මණය මනාකොට ගත් කල්හි එහි ම පරිකර්ම සමාධිය ද උපදනේ ය. උපචාර සමාධිය ද උපදනේ ය.

529. අභිඥාවශයෙන් පවත්නා වූ රූපාවචර පඤ්චමධ්‍යානය වනාහි අභිඥපාදක පඤ්චමධ්‍යානයෙන් නැගීසිට ඉටියයුතු රූපාදිය ආවර්ජනා කොට පරිකර්ම කරන්නහුට රූපාදි ආරම්මණයන්හි සුදුසු පරිද්දෙන් උපදී.

530. අභිඥවෝ නම් ඍද්ධිවිධය දිව්‍යශ්‍රෝත්‍රය පරචිත්තවිජානනය පූර්වේනිවාසානුස්මෘතිය දිව්‍යචක්ෂුසයයි පඤ්චප්‍රකාර වන්නා හ.

මෙය මෙහි ආරම්මණ භේදය යි.

සමථකර්මස්ථාන නය නිමියේ ය.

531. විපස්සනා කම්මට්ඨානෙ පන සීලවිසුද්ධි චිත්ත විසුද්ධි දිට්ඨිවිසුද්ධි කංඛාවිතරණවිසුද්ධි මග්ගාමග්ග ඤාණදස්සන විසුද්ධි පටිපදා ඤාණදස්සන විසුද්ධි ඤාණදස්සන විසුද්ධිචෙති සත්තවිධෙන විසුද්ධි සංගහො.

532. අනිච්චලක්ඛණං දුක්ඛලක්ඛණං අනත්ත ලක්ඛණඤ්චෙති තීණි ලක්ඛණානි.

533. අනිච්චානුපස්සනා දුක්ඛානුපස්සනා අනත්තානුපස්සනාචෙති තිස්සො අනුපස්සනා.

534. සම්මසනඤාණං උදයබ්බයඤාණං භංගඤාණං භයඤාණං ආදීනවඤාණං නිබ්බිදාඤාණං මුඤ්චිතුකම්‍යතාඤාණං පටිසංඛාඤාණං සංඛාරුපෙක්ඛාඤාණං අනුලොම ඤාණ-ඤ්චෙති දස විපස්සනාඤාණානි.

535. සුඤ්ඤතො විමොක්ඛො අනිමිත්තො විමොක්ඛො අප්පණිහිතො විමොක්ඛොචෙති තයො විමොක්ඛා.

536. සුඤ්ඤතානුපස්සනා අනිමිත්තානුපස්සනා අප්පණිහිතානු-පස්සනා චෙති තීණි විමොක්ඛ මුඛානි ච වෙදිතබ්බානි.

537. කථං? පාතිමොක්ඛසංවරසීලං ඉන්ද්‍රියසංවර සීලං ආජීව පාරිසුද්ධිසීලං පච්චයසන්නිස්සිත සීලං චෙති චතුපාරිසුද්ධිසීලං සීලවිසුද්ධි නාම.

538. උපචාරසමාධි අප්පණාසමාධි චෙති දුවිධො සමාධි චිත්ත විසුද්ධිනාම.

539. ලක්ඛණ රස පච්චුපට්ඨාන පදට්ඨාන වසෙන නාමරූප පරිග්ගහො දිට්ඨිවිසුද්ධි නාම.

540. තෙසමේව ච නාමරූපානං පච්චය පරිග්ගහො කංඛාවිතරණ විසුද්ධි නාම.

531. විදර්ශනා කර්මස්ථානයෙහි වනාහි ශීල විශුද්ධිය චිත්තවිශුද්ධිය දෘෂ්ටිවිශුද්ධිය කාංශාවිතරණ විශුද්ධිය මාර්ගාමාර්ග ඥානදර්ශන විශුද්ධිය ප්‍රතිපදා ඥාණ දර්ශන විශුද්ධියයි සප්තප්‍රකාරයකින් විශුද්ධි සංග්‍රහය වේ.

532. අනිත්‍යලක්‍ෂණය දුඃඛලක්‍ෂණය අනාත්ම ලක්‍ෂණය යන මොහු තිදෙනෙක් වූ ලක්‍ෂණයෝ ය.

533. අනිච්චානුපස්සනාය දුක්ඛානුපස්සනාය අනත්තානුපස්සනායයි අනුපස්සනා තුනෙකි.

534. සම්මසනඤාණය උදයබ්බයඤාණය භංග ඤාණය භයඤාණය ආදීනවඤාණය නිබ්බිදාඤාණය මුඤ්චිතුකම්‍යතාඤාණය පටිසංඛාඤාණය සංඛාරුපෙක්ඛා ඤාණය අනුලෝමඤාණය යි විදර්ශනා ඥාන දශයෙකි.

535. ශූන්‍යතා විමෝක්ෂය අනිමිත්ත විමෝක්‍ෂය අප්‍රණිහිත විමෝක්ෂය යි විමෝක්ෂයෝ තිදෙනෙකි.

536. සුඤ්ඤතානුපස්සනාය අනිමිත්තානුපස්සනාය අප්පණිහිතානුපස්සනාය යන තුනක් වූ විමෝක්‍ෂ මුඛයෝ ද දත යුත්තාහු ය.

537. කෙසේද යත්? - ප්‍රාතිමෝක්‍ෂසංවරශීලය ඉන්ද්‍රියසංවරශීලය ආජීවපාරිශුද්ධිශීලය ප්‍රත්‍යයසන්නිශ්‍රිතශීලය යන චතුර්විධ පාරිශුද්ධිශීලය ශීලවිශුද්ධි නම්.

538. උපචාරසමාධිය අර්පණාසමාධිය යන දෙවැදෑරුම් සමාධිය චිත්තවිශුද්ධි නම්.

539. ලක්‍ෂණය රසය ප්‍රත්‍යුපස්ථානය පදස්ථානය යන මොවුන්ගේ වශයෙන් නාමරූපයන් පිරිසිඳ දැනීම දෘෂ්ටි විශුද්ධි නම්.

540. ඒ නාමරූපයන්ගේ ම ප්‍රත්‍යය පරිග්‍රහය කාංශාවිතරණ විශුද්ධි නම්.

541. තතො පරම්පත තථා පරිග්ගහිතෙසු සප්පච්චයෙසු තෙභූමක සංඛාරෙසු අතිතාදි භෙදභින්නෙසු ඛන්ධාදි නය මාරබ්භ කලාප වසෙන සංඛිපිත්වා අනිච්චං ඛයට්ඨෙන, දුක්ඛං භයට්ඨෙන, අනත්තා අසාරකට්ඨෙනාති. අද්ධාන වසෙන සන්තති වසෙන ඛණ වසෙන සම්මසන ඤාණෙන ලක්ඛණත්තයං සම්මසන්තස්ස තෙස්වෙව පච්චය වසෙන ඛණ වසෙන ච උදයබ්බය ඤාණෙන උදයබ්බයං සමනු පස්සන්තස්ස ච-

ඔභාසො පීති පස්සද්ධි - අධිමොක්ඛො ච පග්ගහො

සුඛං ඤාණමුපට්ඨාන - මුපෙක්ඛා ච නිකන්ති චෙති.

ඔභාසාදි විපස්සනුපක්කිලෙස පරිපන්ථපරිග්ගහ වසෙන මග්ගාමග්ගලක්ඛණ වවත්ථානං මග්ගා මග්ගඤාණ දස්සන විසුද්ධි නාම.

542. තථා පරිපන්ථ විමුත්තස්ස පන තස්ස උදයබ්බය ඤාණතො පට්ඨාය යාවානුලොමා තිලක්ඛණං විපස්සනා පරම්පරාය පටිපජ්ජන්තස්ස නව විපස්සනා ඤාණානි පටිපදා ඤාණ-දස්සන විසුද්ධි නාම.

543. තස්සෙවං පටිපජ්ජන්තස්ස පන විපස්සනා පරිපාකමාගම්ම ඉදානි අප්පණා උප්පජ්ජිස්සතීති භවංගං වොච්ජින්දිත්වා උප්පන්න මනොද්වාරාවජ්ජනානන්තරං ද්වෙ තීණි විපස්සනා චිත්තානි යං කිඤ්චි අනිච්චාදි ලක්ඛණ මාරබ්භ පරිකම්මොපචාර අනුලොම ගොත්‍රභූ නාමෙන පවත්තන්ති.

544. යා සිඛාප්පත්තා සා සානුලොමා සංඛාරුපෙක්ඛා වුට්ඨානගාමිනී විපස්සනාති ච පවුච්චති.

541. ඒ කංඛාවිතරණ විසුද්ධියෙන් පසු එසේ දැන ගන්නා ලද අතීතාදි භේදයෙන් බිඳුනා වූ ප්‍රත්‍යය සහිත වූ ත්‍රෛභූමක සංස්කාරයන්හි ස්කන්ධාදි නය අරමුණු කොට කලාප වශයෙන් සංක්ෂේප කොට, ක්ෂයයට පැමිණෙන ස්වභාවයෙන් අනිත්‍යය, භයට කරුණුවන ස්වභාවයෙන් දුකය, අසාර ස්වභාවයෙන් අනාත්මය. මෙසේ අතීතාදි කාලවශයෙන් ද සන්තති වශයෙන් ද ක්‍ෂණවශයෙන් ද සම්මර්ශණ ඥනයෙන් ලක්‍ෂණත්‍රය සම්මර්ශණය කරන්නාහට ද ඒ ධර්මයන් කෙරෙහි ම ප්‍රත්‍යය වශයෙන් හා ක්ෂණ වශයෙන් ද උදයව්‍යය ඥනයෙන් උදයව්‍යය නැවත නැවත බලන්නා හට ද විදර්ශනා චිත්තබලයෙන් හටගන්නා වූ ශරීරාලෝකය ද විදර්ශනා චිත්තයෙන් වන බලවත් ප්‍රීතිය ද කාය චිත්ත දරථයාගේ සන්සිඳීම කරන ප්‍රශ්‍රබ්ධිය ද බලවත් වූ ශ්‍රද්ධෙන්ද්‍රිය සංඛ්‍යාත අධිමෝක්ෂය ද බලවත් වීර්යය ද අතිප්‍රණීත වූ සුඛය ද අතිතීක්‍ෂණ වූ විදර්ශනා ඥනය ද බලවත් වූ සිහිය ද බලවත් උපේක්‍ෂාව ද සූක්ෂ්මතෘෂ්ණා ස්වරූප වූ නිකාන්තිය ද යන ඕභාසාදි විදර්ශනූ-පක්ලේෂ පරිපන්ථයන් ඥනයෙන් දැනගැනීම් වශයෙන් මාර්ගයාගේ හා අමාර්ගයාගේ ලක්‍ෂණ නියම වශයෙන් දැන ගන්නා වූ ඥනය මාර්ගාමාර්ග ඥන දර්ශන විශුද්ධි නම්.

542. ඒ කියන ලද ක්‍රමයෙන් උවදුරින් මිදුණා වූ උදයව්‍යය ඥනයෙහි පටන් සත්‍යානුලෝම ඥනය දක්වා ලක්‍ෂණත්‍රය විදර්ශනා-පරම්පරාවෙන් පිළිපදින්නා වූ ඒ යෝගාවචරයාහට වනාහි නවයක් වූ විදර්ශනා ඥනයෝ ප්‍රතිපදාඥන දර්ශන විශුද්ධි නම්.

543. මේ ක්‍රමයෙන් භාවනා කරන්නා වූ ඔහුට වනාහි විදර්ශනාව මුහු කිරීමට පැමිණ දැන් අර්පණාව හෙවත් ලෝකෝත්තර මාර්ගය උපදීය යි කිය යුතු තැනට පැමිණි කල්හි භවාංග සන්තතිය සිඳී උපන් මනෝද්වාරාවර්ජනයට අනතුරුවැ දෙක තුනක් විදර්ශනා චිත්තයෝ යම්කිසි අනිත්‍යාදි ලක්‍ෂණයක් අරමුණු කොට පරිකර්මය උපචාරය අනුලෝමය ගෝත්‍රභූය යන නම් වලින් පවතිත්.

544. මුදුන්පත් වූ අනුලෝමඥන සහිත වූ යම් සංස්කා-රෝපේක්‍ෂා ඥනයක් වේද එය ව්‍යුත්ථානගාමිනී විදර්ශනායයි ද කියනු ලැබේ.

**545**. තතො පරං ගොත්‍රභූ චිත්තං නිබ්බාන මාලම්බිත්වා පුථජ්ජන ගොත්තමභිභවන්තං අරියගොත්තම්හි සම්භොන්තකද්ව පවත්තති.

**546**. තස්සානන්තර මෙව මග්ගො දුක්ඛසච්චං පරිජානන්තො සමුදයසච්චං පජහන්තො නිරොධ සච්චං සච්ඡිකරොන්තො මග්ගසච්චං භාවනා වසෙන අප්පණාවීථි මොතරති.

**547**. තතො පරං ද්වේ තීණි ඵල චිත්තානි පවත්තිත්වා භවංග-පාතො හොති. පුන භවංගං වොච්ඡින්දිත්වා පච්චවෙක්ඛණ ඤාණානි පවත්තන්ති.

**548**. මග්ගං ඵලකද්ව නිබ්බානං - පච්චවෙක්ඛති පණ්ඩිතො,

හීනෙ කිලෙසෙ සෙසෙ ච - පච්චවෙක්ඛති වා න වා

**549**. ඡබ්බිසුද්ධික්කමෙනෙවං - භාවෙතබ්බො. චතුබ්බිධො,

ඤාණදස්සන විසුද්ධි - නාමග්ගො පවුච්චති.

අයමෙත්ථ විසුද්ධි භෙදො.

**550**. තත්ථ අනත්තානුපස්සනා අත්තාභිනිවෙසං මුඤ්චන්ති, සුඤ්ඤතානුපස්සනා නාම විමොක්ඛ මුඛං හොති.

**551**. අනිච්චානුපස්සනා විපල්ලාස නිමිත්තං මුඤ්චන්ති අනිමිත්-තානුපස්සනා නාම විමොක්ඛ මුඛං.

**552**. දුක්ඛානුපස්සනා තණ්හා පණිධිං මුඤ්චන්ති අප්පණිහි-තානුපස්සනා නාම විමොක්ඛ මුඛං.

**553**. තස්මා යදි වුට්ඨාන ගාමිනී විපස්සනා අනත්තතො විපස්සති සුඤ්ඤතො විමොක්ඛො නාම හොති මග්ගො.

**554**. යදි අනිච්චතො විපස්සති අනිමිත්තෝ විමොක්ඛො නාම.

545. ඉන් මතු ගෝත්‍රභූචිත්තය නිර්වාණය අරමුණු කොට ඒ පුද්ගලයාගේ පෘථග්ජන ගෝත්‍රය මඩිමින් ද ඔහු ආර්යගෝත්‍රයට පමුණුවමින් ද පවතී.

546. ඒ ගෝත්‍රභූචිත්තයට අනතුරුව ම මාර්ගය දුඃඛසත්‍යය පිරිසිඳ දනිමින් සමුදයසත්‍යය දුරුකෙරෙමින් නිරෝධසත්‍යය ප්‍රත්‍යක්ෂ කෙරෙමින් මාර්ගසත්‍යය ද වැඩීම් වශයෙන් අර්පණාවීථියට බස්නේ ය.

547. ඉන් මතුයෙහි ඵල සිත් දෙක තුනක් පැවතී භවාංගපාතය වේත්. නැවත භවාංග සන්තතිය සිඳී ප්‍රත්‍යවේක්ෂා ඥානයෝ පවතිත්.

548. මාර්ගප්‍රාප්ත වූ පණ්ඩිත තෙමේ මාර්ගය ද ඵලය ද නිර්වාණය ද ප්‍රත්‍යවේක්ෂා කරන්නේ ය. ප්‍රහීන ක්ලේශයන් ද ශේෂ ක්ලේශයන් ද ප්‍රත්‍යවේක්ෂා කරන්නේ ද වේ. නො කරන්නේ හෝ වේ.

549. මෙසේ සයක් වූ විශුද්ධීන්ගේ අනුක්‍රමයෙන් වැඩිය යුතු වූ චතුර්විධ වූ මාර්ගය ඥානදර්ශන විශුද්ධි නමැයි කියනු ලැබේ.

මෙය මෙහි විශුද්ධි භේදයයි.

550. එහි අනාත්ම වශයෙන් කරන්නා වූ අනුපස්සනා තොමෝ ආත්මාභිනිවේශය හරින්නී **සුඤ්ඤතානුපස්සනා** නම් විමෝක්ෂ මුඛය වේ.

551. අනිත්‍ය වශයෙන් කරන්නා වූ අනුපස්සනා තොමෝ විපල්ලාස නිමිත්තය හරින්නී **අනිමිත්තානුපස්සනා** නම් විමෝක්ෂ මුඛය වේ.

552. දුඃඛ වශයෙන් කරන්නා වූ අනුපස්සනා තොමෝ තෘෂ්ණාප්‍රණිධිය හරින්නී **අප්පණිහිතානුපස්සනා** නම් විමෝක්ෂ මුඛය වේ.

553. එහෙයින් ව්‍යුත්ථානගාමිනී විදර්ශනා තොමෝ අනාත්ම වශයෙන් විදර්ශනා කෙරේ ද එකල්හි මාර්ගය **සුඤ්ඤත විමොක්ඛ** නම් වේ.

554. ඉදින් අනිත්‍ය වශයෙන් විදර්ශනා කෙරේ ද මාර්ගය **අනිමිත්ත විමොක්ඛ** නම් වේ.

**555**. යදි දුඛතො විපස්සති මග්ගො අප්පණිහිතො විමොක්ඛො නාමාති ච, මග්ගො විපස්සනාගමන වසෙන තීණි නාමානි ලභති, තථා ඵලඤ්ච මග්ගාවගමන භාවනා වසෙන මග්ගවීථියං.

**556**. ඵලසමාපත්තිවීථියං පන යථාවුත්ත නය වසෙන විපස්සන්තානං යථාසකං ඵල මුප්පජ්ජමානම්පි විපස්සනාගමන වසෙන සුඤ්ඤතාදි විමොක්ඛො ති ච පවුච්චති. ආරම්මණ වසෙන පන සරස වසෙන ච නාමත්තයං සබ්බත්ථ සබ්බේසම්පි සමමේව.

අයමෙත්ථ විමොක්ඛ භෙදො.

**557**. එත්ථ පන සොතාපත්ති මග්ගං භාවෙත්වා දිට්ඨිවිචිකිච්ඡා පහානෙන පහීනාපාය ගමනො සත්තක්ඛත්තු පරමො සොතාපන්නො නාම හොති.

**558**. සකදාගාමි මග්ගං භාවෙත්වා රාගදොසමොහානං තනුකරත්තා සකදගාමි නාම හොති සකිදෙව ඉමං ලොකං ආගන්තා.

**559**. අනාගාමි මග්ගං භාවෙත්වා කාමරාගව්‍යාපාදන මනව-සේසප්පහානෙන අනාගාමි නාම හොති අනාගන්තා ඉත්ථත්තං.

**560**. අරහත්ත මග්ගං භාවෙත්වා අනවසෙස කිලෙසප්පහානෙන අරහා නාම හොති ඛීණාසවො ලොකෙ අග්ගදක්ඛිණෙය්‍යො.

අයමෙත්ථ පුද්ගල භෙදො.

**561**. ඵලසමාපත්තියො පනෙත්ථ සබ්බෙසම්පි යථා සකඵල වසෙන සාධාරණා ච.

**562**. නිරොධ සමාපත්ති සමාපජ්ජනං පන අනාගාමිනඤ්චෙව අරහත්තානඤ්ච ලබ්භති.

555. ඉදින් දුඃඛ වශයෙන් විදර්ශනා කෙරේ නම් මාර්ගය **අප්පණිහිත විමොක්ඛ** නම් වේ. මෙසේ මාර්ගය ව්‍යුස්ථානගාමිනී විදර්ශනාගමන වශයෙන් නම් තුනක් ලබයි. මාර්ගවීථියෙහි ඵලචිත්තය ද එසේ මාර්ගාගමන වශයෙන් නම් තුන ලබයි.

556. ඵලසමාපත්ති වීථියෙහි වනාහි කියන ලද ක්‍රමයාගේ වශයෙන් විදර්ශනා කරන්නවුන්ට තමන් තමන්ගේ ඵලය උපදනේ ද (ඵයට) විදර්ශනාගමන වශයෙන් සුඤ්ඤතාදි විමොක්ඛයයි කියනු ලැබේ. ආරම්මණ වශයෙන් හා ස්වකීය කෘත්‍ය වශයෙන් ද නම් තුන සැමතන්හි ම සැමට ම සම ම ය.

**මෙය මෙහි විමෝක්ෂ භේදය යි.**

557. මෙහි වනාහි ශ්‍රෝත්‍ර ආපත්ති මාර්ග උපදවා දෘෂ්ටි විචිකිත්සාවන්ගේ ප්‍රහාණයෙන් ප්‍රහීන වූ අපාය ගමන් ඇත්තා වූ මතු සුගතියෙහිදු සත්වරක් ඉපදීම පරමකොට ඇති පුද්ගල තෙම **සෝතාපන්න** නම් වේ.

558. සකෘදගාමි මාර්ගය උපදවා රාග ද්වේෂ මෝහයන් තුනී කරන ලද හෙයින් එක් වරක් පමණක් පිළිසිඳ ගැනීම් වශයෙන් මෙලොවට එන ආර්‍ය්‍ය පුද්ගල තෙමේ **සකෘදගාමි** නම් වේ.

559. අනාගාමි මාර්ගය උපදවා කාමරාග ව්‍යාපාදයන් නිරවශේෂයෙන් ප්‍රහාණය කිරීමෙන් පිළිසිඳ ගැනීම් වශයෙන් මේ කාම ලෝකයට නැවත නො එන්නා වූ ආර්‍ය්‍ය පුද්ගල තෙමේ **අනාගාමි** නම් වේ.

560. අර්හත් මාර්ගය උපදවා සකලක්ලේශයන් ගේ ප්‍රහාණ-යෙන් ක්ෂය කරන ලද ආශ්‍රවයන් ඇත්තා වූ ලෝකයෙහි අග්‍රදක්ෂිණෙය්‍ය වූ පුද්ගල තෙමේ **අර්හත්** නම් වේ.

මෙය මෙහි පුද්ගල භේදය යි.

561. මෙහි ඵල සමාපත්තීහු වනාහි සියලු ආර්‍ය්‍ය පුද්ගලයන්ට තමන් තමන්ගේ ඵල වශයෙන් සාධාරණ ම ය.

562. නිරෝධ සමාපත්තියට සමවැදීම වනාහි අනාගාමීන්ට හා රහතුන්ට ම ලැබේ.

**563**. තත්ථ යථාක්කමං පඨමජ්ඣානාදි මහග්ගත සමාපත්තිං සමාපජ්ජිත්වා වුට්ඨාය තත්ථ ගතෙ සංඛාරධම්මෙ තත්ථ තත්ථෙව විපස්සන්තො යාව ආකිඤ්චඤ්ඤායතනං ගන්ත්වා තතො පරං අධිට්ඨෙය්‍යාදිකං පුබ්බකිච්චං කත්වා නෙවසඤ්ඤා නාසඤ්ඤායතනං සමාපජ්ජති, තස්ස ද්වින්නං අප්පනාජව- නානං පරතො වොච්ඡිජ්ජති චිත්ත සන්තති. තතො නිරොධසමාපන්නො නාම හොති.

**564**. වුට්ඨාන කාලෙ පන අනාගාමිනො අනාගාමිඵල චිත්තං අරහතො අරහත්තඵල චිත්තං එකවාර මෙව පවත්තිත්වා භවංගපාතො හොති. තතො පරං පච්චෙක්ඛනා පවත්තන්තීති.

අයමෙත්ථ සමාපත්ති භෙදො.
නිට්ඨිතො ච විපස්සනා කම්මට්ඨාන නයො.

**565**. භාවෙතබ්බං පතිච්චෙවං - භාවනාද්වය මුත්තමං
පටිපත්තිරසස්සාදං - පත්ථයන්තෙන සාසනෙ.

ඉති අභිධම්මත්ථ සංගහෙ කම්මට්ඨාන සංගහ
විභාගො නාම නවමො පරිච්ජෙදො.

**566**. චාරිත්ත සොභිත විසාල කුලොදයෙන
සද්ධාභිවුද්ධ පරිසුද්ධ ගුණොදයෙන,
නම්බව්හයෙන පණිධාය පරානුකම්පං
යං පත්ථිථං පකරණං පරිනිට්ඨිතං තං

**567**. පුඤ්ඤෙන තෙන විපුලෙන තුමූලසොමං.
ධඤ්ඤාධිවාස මුදිතොදිත මායුගන්තං
පඤ්ඤාවදාත ගුණ සොභිත ලජ්ජි භික්ඛු
මඤ්ඤන්තු පුඤ්ඤ විභවොදය මංගලාය.

ඉති අනුරුද්ධාචරියෙන රචිතං අභිධම්මත්ථසංගහං
නාම පකරණං නිට්ඨිතං.

563. ඒ නිරෝධසමාපත්තියෙහි පිළිවෙළින් ප්‍රථම ධ්‍යානාදි මහද්ගත සමාපත්තියට සමවැදී එයින් නැගී ඒ සමාපත්තීන්හි වූ සංස්කාර ධර්මයන් ඒ ඒ කල්හි ම විදර්ශනා කරමින් ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය දක්වා ගොස් ඉක්බිති අධිෂ්ඨානාදි පූර්වකෘත්‍යය කොට නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියට සමවදනේ ය. ඔහුට දෙදෙනෙක් වූ අර්පණා ජවනයන්ගෙන් මතුයෙහි චිත්ත සන්තතිය සිඳෙන්නේ ය. ඉන්පසු නිරෝධයට සමවැදුනේ නම් වේ.

564. නිරෝධ සමාපත්තියෙන් නැගෙන කල්හි වනාහි අනගැමිහට අනාගාමිඵල චිත්තය ද අර්හත්හට අර්හත්ඵල චිත්තය ද එක් වරක් ම ඉපද භවාංගය වේ. ඉන් පසු ප්‍රත්‍යවේක්ෂා ජවනයෝ පවතිත්.

මෙය මෙහි සමාපත්ති භේදයයි.

විදර්ශනා කර්මස්ථානය නිමියේය.

565. සර්වඥශාසනයෙහි ප්‍රතිපත්ති රසාස්වාදනය ප්‍රාර්ථනා කරන්නහු විසින් උතුම් වූ මේ භාවනා දෙක කියන ලද ක්‍රමයෙන් කළ යුතු.

මෙය අභිධර්මාර්ථ සංග්‍රහයෙහි කර්මස්ථාන සංග්‍රහ විභාග

නම් වූ නව වන පරිච්ඡේදය යි.

566. චාරිත්‍රයෙන් හෙබියා වූ විශාල කුලයෙක්හි උපන්නා වූ ශ්‍රද්ධාව හේතුකොට වැඩුනා වූ පරිශුද්ධ වූ ශීලාදි ගුණයන්ගේ උත්පත්තියට ස්ථාන වූ **තම්බා**භිධාන උපාසකතුමා විසින් පරානුකම්පාව පිණිස යම් ප්‍රකරණයක් කළ මැනවයි ආරාධනය කරන ලදද ඒ ප්‍රකරණය කොට නිමවන ලද්දේ ය.

567. මහත්වූ ඒ පිනෙන් පිනැතියන්ට වාසස්ථාන වූ අතිශයින් උසස් වූ **මූලසෝම** නම් වූ හෝ තුමූලසෝම නම් වූ හෝ විහාරය ප්‍රඥවෙන් අවදාත වූ ගුණයෙන් හෙබියා වූ ලජ්ජී භික්ෂූහු මහත් වූ පුණ්‍යයන්ගේ වැඩීම නමැති මංගලය පිණිස කල්පාන්තය දක්වා සිතත්වා.

අනුරුද්ධාචාර්‍ය්‍යයන් විසින් රචිත අභිධර්මාර්ථ සංග්‍රහ නම්

ප්‍රකරණය නිමියේ ය.

මහාචාර්‍ය්‍ය රේරුකානේ චන්දවිමල මහානායක ස්ථවිරයන්
විසින් ලියන ලද අනුවාදය යි.